











# 2013

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2013

අධ්‍යාපන අමාත්‍යාංශය

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

2014 පෙබරවාරි

නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව
සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**අධ්‍යාපන ලේකම්ගේ පණිවිඩය,**

මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි අභිමතාර්ථයන් සපුරාලමින් අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා අර්ථවත් කඩිනම් වැඩ පිළිවෙලක් ක්‍රියාවට නංවන කාල පරිච්ඡේදයක අධ්‍යාපන අමාත්‍යාංශයේ වසරක කාර්ය සාධනය විදහා දක්වමින් *වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2013* සතුටින් ඉදිරිපත් කරමි.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවක් හා නව අධ්‍යාපන පනතක් සකස් කිරීමේ ක්‍රියාවලිය පුළුල් විද්වත් කතිකාවතක් හරහා සියලු පාර්ශවයන්ගේ අදහස් විමසමින් සාර්ථකව ඉදිරි පියවර කරා ගෙන යාමට හැකිවීම ගත වූ වසරේ අප ලද විශේෂ ජයග්‍රහණයකි.

තරගකාරී අධ්‍යාපන රටාව තුළ පතපොතේ දැනුමෙන් සන්නද්ධ වීම පමණක් සමාජ ප්‍රගමනයට මෙන්ම පුද්ගල අභිවෘද්ධියටද හේතු නොවන බව වටහා ගනිමින් නිර්මාණශීලීත්වයට ඉඩ කඩ පැවරෙන අයුරින් ප්‍රායෝගික ඉගෙනුම් ක්‍රම ශිල්ප භාවිතයට දරුවන් යොමු කරන්නා වූ මහින්දෝදය ද්විතීයික පාසල් දහසක් සංවර්ධන වැඩසටහනෙහි මූලික සංරචකයක් වන මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර ඉදිකිරීම සහ ඊට අවශ්‍ය නවීන උපකරණ සැපයීමද ගුරු සම්පත සවිබල ගැන්වීමද ගෙවී ගිය වසරේ අධ්‍යාපන අමාත්‍යාංශය අත්පත් කර ගත් කාර්යසාධනයෙහි ප්‍රමුඛ ස්ථානයක් ගනී.

දරුවන්ගේ උපරිම විභවතා අවධි කොට උසස් ජීවන රටාවකට යොමු කිරීමට හා සමාජයට වැඩදායී පුරවැසියෙකු බවට පත් කිරීමට පූර්ව මඟ පෙන්වීම හා පූර්ව අධිතාලම දැමීම පිළිබඳව පාසලට පැවරෙන වගකීම තවත් සවිමත් කරමින් ජාතික වෘත්තීය සුදුසුකම් හා බැඳුණු අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂයධාරාව පාසල් 250ක් හරහා හඳුන්වාදීම මෙරට අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සටහන් වනු ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිමය සේවාවන් හා සම්බන්ධව දිගු කලක් තිස්සේ පැවති ගැටලු සඳහා තිරසර විසඳුම් සෙවීම සියලු පාර්ශවකරුවන්ගේ අදහස් විමසමින් සැලසුම් සහගත ක්‍රියාවලියක් හරහා සිදුකිරීමට අවශ්‍ය පියවරගෙන ඇති බව ද සුවිශේෂී ලෙස සඳහන් කරනු කැමැත්තෙමි.

නව දැනුමෙන් හා කුසලතාවයන් මෙන් ම ගුණ දහමින් ද පෝෂණය වන දරු පරපුරක් නිර්මාණය කිරීමට නැඹුරුවන සියලු පැතිකඩ ඔස්සේ අධ්‍යාපන ක්‍රියාවලිය හසුරවමින් යහපත් සමාජයක් බිහි කිරීමට දායක වීම අධ්‍යාපන අමාත්‍යාංශයේ නිරන්තර උත්සාහයයි.

අනුර දිසානායක
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ, තනතුරු හා නිලධාරීන් (2013.12.31 දිනට)

**අධ්‍යාපන අමාත්‍ය**

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා

**නියෝජ්‍ය අමාත්‍ය**

ගරු මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමා

**අධ්‍යාපන ලේකම්**

අනුර දිසානායක මහතා

**සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය**

අතිරේක ලේකම් - එස්.යූ. විජේරත්න මයා

**අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය**

අතිරේක ලේකම් - එච්.යූ. ප්‍රේමතිලක මයා

**අධ්‍යාපන සේවා ආයතන අංශය**

අතිරේක ලේකම් - උපාලි මාරසිංහ මයා

**පාසල් සැපයීම්, සේවා හා ඉදිකිරීම් අංශය**

අතිරේක ලේකම් (වැඩ බලන) - එන්.එච්.එම්. චිත්‍රානන්ද මයා

**පාලන හා මුදල් අංශය**

අතිරේක ලේකම් - එන්.එච්.එම්. චිත්‍රානන්ද මයා

ප්‍රධාන ගණකාධිකාරී - එස්.පී.එන්.සමරසිංහ මිය

## පටුන


**1.** **අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය**

දැක්ම 1
මෙහෙවර 1
1.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම 1
1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය 2
1.3 අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන 2

**2.** **මහින්ද චින්තන ඉදිරි දැක්ම රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව හා බැඳුණු ජාතික අධ්‍යාපන සංවර්ධන ඉලක්ක**

2.1 පුළුල් දැක්මක් සහිත අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලියක් 3
2.2 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන 2013 - 2017 4
2.3 නව අධ්‍යාපන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම 6
2.4 සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීම උදෙසා රාජ්‍ය නායකත්වයේ මඟ පෙන්වීම 6

**3.** **ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ සම සාධාරණ ප්‍රවේශය සහ සහභාගීත්වය සහතික කිරීම**

3.1 මහින්දෝදය ද්විතීයික පාසල් 1000ක් ප්‍රතිනිර්මාණය කිරීමේ ජාතික වැඩසටහන 9
3.2 ප්‍රාථමික පාසල් ජාලය ළමා මිතුරු ප්‍රවේශය අනුව සංවර්ධනය 14
3.3 විශේෂ සංවර්ධන අවශ්‍යතා සහිත පාසල් සඳහා වූ වැඩසටහන් 16
3.4 පිරිවෙන් අධ්‍යාපනය 17
3.5 නොවිධිමත් අධ්‍යාපනය 18
3.6 විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ අධ්‍යාපනය 18
3.7 ශිෂ්‍ය සුභසාධන වැඩසටහන් 19

**4.** **විෂය මාලාව හා විෂය සමගාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සංවර්ධනාත්මක ප්‍රවේශයන්**

4.1 ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය 21
4.2 ගණිත අධ්‍යාපනය නැංවීමට විශේෂ අවධානයක් 22
4.3 විද්‍යා අධ්‍යාපනයේ නව පිබිදීමක් 23
4.4 අධ්‍යාපනයේ නව මගක් සනිටුහන් කරමින් අ.පො.ස.(උ.පෙළ) සඳහා තාක්ෂණ විෂය ධාරාව හඳුන්වාදීම 24
4.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනීය ප්‍රවනතා 25
4.6 සිසුන් තුළ ත්‍රි භාෂා කුසලතා වර්ධනය 26
4.7 මානව ශාස්ත්‍ර විෂයයන් ඔස්සේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය 27
4.8 වාණිජ විෂයයන් ඉගැන්වීම සඳහා නව ප්‍රවේශයක් 27
4.9 කෘෂිකර්ම සංවර්ධන හා පරිසර සංරක්ෂණ සඳහා ශිෂ්‍ය කුසලතා වර්ධනය 28
4.10 සෑම ශිෂ්‍යයෙකුටම ක්‍රීඩාව අනිවාර්ය කිරීම 29
4.11 ආගමික හැදියාවෙන් යුතු සාරධර්ම සුරකින පරපුරක් 29
4.12 ශිෂ්‍ය පෞරුෂ වර්ධනයට ඉවහල්වන වැඩසටහන් රැසක් 30
4.13 සෞන්දර්ය කුසලතා ඔප්නංවීම 31

## 5. අධ්‍යාපන වෘත්තීය සේවාවන් බලගැන්වීම

| | | |
|---|---|---|
| 5.1 | ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම | 33 |
| 5.2 | ගුරු අධ්‍යාපන සහ ගුරු සංවර්ධනය | 34 |
| 5.3 | ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීම | 35 |
| 5.4 | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීම | 35 |
| 5.5 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම | 35 |
| 5.6 | විවිධ වෘත්තීය සංවර්ධන වැඩසටහන් | 36 |
| 5.7 | උපදෙස් සංග්‍රහ හා චක්‍රලේඛ නිකුත් කිරීම | 36 |
| 5.8 | විදේශ පුහුණු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගීත්වය | 37 |

## 6. සැලසුම්කරණය, කළමනාකරණය හා නියාමනය සවිබල ගැන්වීම

| | | |
|---|---|---|
| 6.1 | පළාත් සහා සමඟ සවිමත් සම්බන්ධීකරණයක් | 39 |
| 6.2 | පෞද්ගලික පාසල් කටයුතු විධිමත් කිරීම | 39 |
| 6.3 | අධ්‍යාපන සංවර්ධන සඳහා දායකවන ආයතන බලගැන්වීම | 40 |
| 6.4 | පාසල් සහ අධ්‍යාපන ආයතන ඇගයීම් ක්‍රියාවලිය | 40 |
| 6.5 | ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන් | 41 |
| 6.6 | අධ්‍යාපන පර්යේෂණ ප්‍රවේශයන් | 41 |
| 6.7 | අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය | 41 |
| 6.8 | දිගු කාලීන ව්‍යුහගත ගැටලු විසඳීම සඳහා විශේෂිත ක්‍රියාමාර්ග | 42 |

## 7. මූල්‍ය ආයෝජනය සහ වියදම්

| | | |
|---|---|---|
| 7.1 | පුනරාවර්තන වියදම් | 43 |
| 7.2 | ප්‍රාග්ධන වියදම් | 44 |
| 7.3 | සමස්ත අධ්‍යාපන වියදම | 44 |
| 7.4 | ඉදිකිරීම් සඳහා ආයෝජනය | 45 |
| 7.5 | ලිබඩු උපකරණ සඳහා ආයෝජනය | 46 |

## 8. විදේශාධාර ආයෝජනය

| | | |
|---|---|---|
| 8.1 | දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකු ආධාර | 49 |
| 8.2 | දැනුම් ආර්ථිකයක් උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසැල් පද්ධතිය පරිවර්තනය කිරීම - ලෝක බැංකු ආධාර වැඩසටහන් | 51 |
| 8.3 | වෙනත් විදේශාධාර ලද වැඩසටහන් | 52 |

## 9. ශිෂ්‍ය සාධනය

| | | |
|---|---|---|
| 9.1 | පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය | 53 |
| 8.2 | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය | 53 |
| 8.3 | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය | 54 |
| 9.4 | ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග | 54 |
| 9.5 | 8 වන ශ්‍රේණියේ ශිෂ්‍ය සාධනය පිළිබඳ ජාතික ඇගයීම | 55 |

## ඇමුණුම්

| | |
|---|---|
| ඇමුණුම 1 : 2013 වර්ෂයේ දී නිකුත් කළ චක්‍රලේඛ | 59 |
| ඇමුණුම 2 : අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ තනතුරු හා නිලධාරීන් 2013.12.31 දිනට | 61 |

# ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

# ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

| දර්ශකය | 2005 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| **පාසල් (a)** | | | | | | |
| රජයේ පාසල් සංඛ්‍යාව | 9727 | 9,662 | 9410 [t] | 9,685 | 9,731 | 9,905 |
| පාසල් වර්ගය අනුව (b) | | | | | | |
| 1ඒබී පාසල් | 646 | 698 | 702 | 716 | 716 | 753 |
| 1සී පාසල් | 1,810 | 1,937 | 1,944 | 2,005 | 2,027 | 2,013 |
| 2 වර්ගයේ පාසල් | 4,237 | 4,166 | 4,043 | 4,094 | 4,045 | 3,869 |
| 3 වර්ගයේ පාසල් | 3,034 | 2,861 | 2,721 | 2,870 | 2,943 | 3,270 |
| පරිපාලන අධිකාරිය අනුව | | | | | | |
| ජාතික පාසල් | 324 | 330 | 333 | 340 | 342 | 342 |
| පළාත් පාසල් | 9,403 | 9,332 | 9,077 | 9,345 | 9,389 | 9,563 |
| ඉගැන්වීමේ මාධ්‍ය අනුව | | | | | | |
| සිංහල පමණක් | 6,500 | 6,388 | 6,369 | 6,390 | 6,312 | 6,368 |
| දෙමළ පමණක් | 2,825 | 2,791 | 2,518 | 2,783 | 2,808 | 2,914 |
| සිංහල හා දෙමළ පමණක් | 40 | 41 | 57 | 45 | 60 | 39 |
| සිංහල හා ඉංග්‍රීසි පමණක් | 249 | 305 | 320 | 327 | 371 | 403 |
| දෙමළ හා ඉංග්‍රීසි පමණක් | 86 | 109 | 111 | 106 | 138 | 152 |
| සිංහල,දෙමළ හා ඉංග්‍රීසි පමණක් | 27 | 28 | 35 | 34 | 42 | 29 |
| පිහිටීම අනුව (c) | | | | | | |
| නාගරික | - | - | - | 951 | 1043 | 1071 |
| ග්‍රාමීය | - | - | - | 8,734 | 8,688 | 8,834 |
| ශිෂ්‍ය සංඛ්‍යාව අනුව | | | | | | |
| 1 - 50 | 1,533 | 1,554 | 1,510 | 1,590 | 1,609 | 1,652 |
| 51 - 500 | 5,878 | 5,793 | 5,668 | 5,867 | 5,892 | 5,990 |
| 501 - 2500 | 2,153 | 2,149 | 2,058 | 2,041 | 2,033 | 2,069 |
| 2501 - 5000 | 156 | 158 | 166 | 178 | 186 | 183 |
| 5000ට වැඩි | 7 | 8 | 8 | 9 | 11 | 11 |
| පෞද්ගලික පාසල් සංඛ්‍යාව (d) | 60 | 70 | 72 | 72 | 73 | 73 |
| විශේෂ පාසල් සංඛ්‍යාව (e) | 25 | 24 | 26 | 26 | 25 | 25 |
| පිරිවෙන් සංඛ්‍යාව | 652 | 691 | 697 | 719 | 720 | 734 |
| **ගුරුවරුන් (a)** | | | | | | |
| රජයේ පාසල්වල ගුරුවරුන් සංඛ්‍යාව | 187,339 | 212,683 | 213,694 [t] | 214,562 | 219,886 | 223,333 |
| ස්ත්‍රී පුරුෂභාවය අනුව | | | | | | |
| ස්ත්‍රී | | 150,670 | 151,825 | 152,717 | 157,279 | 160,544 |
| පුරුෂ | | 62,013 | 61,869 | 61,845 | 62,607 | 62,789 |
| සුදුසුකම් අනුව | | | | | | |
| උපාධිධාරී | 51,929 | 74,218 | 77,321 | 78,336 | 80,943 | 86,751 |
| වෘත්තීමය සුදුසුකම් සහිත (f) | | 47,825 | 50,825 | 48,692 | 50,110 | 51,814 |
| වෘත්තීමය සුදුසුකම් රහිත | | 26,393 | 26,496 | 29,644 | 30,833 | 34,937 |
| පුහුණු ගුරුවරු (g) | 127,936 | 127,382 | 124,819 | 126,652 | 128,700 | 128,152 |
| නුපුහුණු / අභ්‍යාසලාභී / වෙනත් | 7,474 | 11,083 | 11,554 | 9,574 | 10,243 | 8,430 |

# ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

| දර්ශකය | 2005 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| වෘත්තීමය සුදුසුකම් සහිත ගුරුවරු ප්‍රතිශතය (h) | - | 83 | 82 | 82 | 81 | 81 |
| ගුරු ශිෂ්‍ය අනුපාතය | 21 | 18 | 18 | 18 | 18 | 18 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව | 17 | 17 | 17 | 18 | 18 | 18 |
| ගුරු විද්‍යාල සංඛ්‍යාව | 10 | 10 | 9 | 9 | 9 | 9 |
| | | | | | | |
| **ශිෂ්‍යයින් (a)** | | | | | | |
| රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 3,942,412 | 3,929,234 | 3,860,176[t] | 3,940,072 | 3,973,847 | 4,004,086 |
| ස්ත්‍රී පුරුෂභාවය අනුව | | | | | | |
| ස්ත්‍රී | 1,964,355 | 1,979,193 | 1,947,066 | 1,988,917 | 2,005,015 | 2,018,803 |
| පුරුෂ | 1,978,057 | 1,950,041 | 1,913,110 | 1,951,155 | 1,968,832 | 1,985,283 |
| ප්‍රධාන ඉගෙනුම් මාධ්‍ය අනුව | | | | | | |
| සිංහල | 2,922,157 | 2,858,307 | 2,876,687 | 2,875,283 | 2,895,475 | 2,920,720 |
| දෙමළ | 1,020,255 | 1,017,789 | 929,304 | 1,007,449 | 1,016,602 | 1,020,008 |
| ද්විභාෂා (w) | | 53,138 | 54,185 | 57,340 | 61,770 | 63,358 |
| ඉගෙනුම් චක්‍රය අනුව | | | | | | |
| ප්‍රාථමික ( 1-5 ශ්‍රේණි) | 1,611,132 | 1,631,645 | 1,617,330 | 1,672,809 | 1,683,829 | 1,698,510 |
| කණිෂ්ඨ ද්විතීයික ( 6-9 ශ්‍රේණි) | 1,339,182 | 1,259,359 | 1,206,436 | 1,220,123 | 1,226,969 | 1,245,609 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික ( 10-11ශ්‍රේණි) | 620,246 | 638,033 | 615,954 | 610,492 | 602,049 | 591,087 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික ( 12-13ශ්‍රේණි) | 371,852 | 400,197 | 420,456 | 436,648 | 461,000 | 468,880 |
| පිරිවෙන්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 55,279 | 56,167 | 58,067 | 62,021 | 62,861 | 64,608 |
| පැවිදි | 30,434 | 31,249 | 32,224 | 33,700 | 33,964 | 35,019 |
| ගිහි | 24,845 | 24,918 | 25,843 | 28,321 | 28,897 | 29,589 |
| විශේෂ අධ්‍යාපන ඒකකවල ශිෂ්‍ය සංඛ්‍යාව | | 5,149 | 4,911 | 5,251 | 5,128 | |
| පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව (i) | 105,048 | 115,094 | 114,974 | 117,362 | 121,764 | 125,669 |
| **ප්‍රවේශය සහ සහභාගීත්වය** (j) | | | | | | |
| රජයේ පාසල්වල 1 ශ්‍රේණිය සඳහා ඇතුළත් වන සිසුන් සංඛ්‍යාව | 318,089 | 326,466 | 323,422 | 331,992 | 331,344 | 339,142 |
| ප්‍රාථමික අධ්‍යාපනයට (1ශ්‍රේණියට) ශුද්ධ ප්‍රවේශ අනුපාතය (k) | 94.3 | - | - | - | - | 98.3 |
| ස්ත්‍රී | 93.1 | - | - | - | - | 98.2 |
| පුරුෂ | 95.2 | - | - | - | - | 98.4 |
| ප්‍රාථමික චක්‍රය තුළ (1-5ශ්‍රේණි) ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (l) | 96.1 | - | - | - | - | 99.9 |
| ස්ත්‍රී | 94.3 | - | - | - | - | 99.6 |
| පුරුෂ | 99.1 | - | - | - | - | 100.2 |
| කණිෂ්ඨ ද්විතීයික චක්‍රය තුළ (1-9 ශ්‍රේණි ) තුල ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (m) | 93.4 | - | - | - | - | 100.3 |
| ස්ත්‍රී | 95.5 | - | - | - | - | 99.6 |
| පුරුෂ | 92.4 | - | - | - | - | 98.2 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික චක්‍රය තුළ (1-11 ශ්‍රේණි ) ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (n) | | | | | | 98.6 |
| ස්ත්‍රී | - | - | - | - | - | 98.2 |
| පුරුෂ | - | - | - | - | - | 99.0 |

# ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

| දර්ශක | 2005 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| **ප්‍රවේශය සහ සහභාගීත්වය** | | | | | | |
| 9 ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ අනුපාතය(o) | - | 86.7 | 87.7 | 87.3 | 88.0 | 92.1 |
| ස්ත්‍රී | - | 89.8 | 90.6 | 89.9 | 90.4 | 94.1 |
| පුරුෂ | - | 83.7 | 84.8 | 84.7 | 85.6 | 90.1 |
| **ශිෂ්‍ය සාධනය** ( p) | | | | | | |
| 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ **ශිෂ්‍ය සාධනය** | | | | | | |
| ලකුණු 200න් 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | | 39.5 | 57.6 | 56.2 | 65.1 | 64.3 |
| ලකුණු 200න් 100ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | | 15.4 | 34.3 | 32.1 | 41.0 | 39.3 |
| අ.පො.ස. ( සා.පෙළ ) විභාගයේ **ශිෂ්‍ය සාධනය** | | | | | | |
| අ.පො.ස. (උ.පෙළ ) සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය | 47.7 | 56.8 | 52.5 | 60.6 | 60.8 | 64.7 |
| සමත් ප්‍රතිශතය | | | | | | |
| ගණිතය | 43.2 | 51.0 | 50.9 | 60.3 | 55.3 | 55.3 |
| විද්‍යාව | 53.4 | 47.4 | 48.2 | 61.7 | 62.4 | 68.2 |
| ඉංග්‍රීසි | 34.9 | 30.6 | 37.6 | 42.3 | 44.5 | 47.7 |
| අ.පො.ස. (උ.පෙළ ) විභාගයේ **ශිෂ්‍ය සාධනය** | | | | | | |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | | |
| ජීව විද්‍යාව | 32.8 (u) | 35.3 (u) | 38.5 (u) | 38.8 (u) | 50.6 (v) | 53.8 (v) |
| භෞතික විද්‍යාව | 34.0 | 33.8 | 33.1 | 36.2 | 46.2 | 44.7 |
| වාණිජ | 56.4 | 63.2 | 60.4 | 58.4 | 53.9 | 72.3 |
| කලා | 60.5 | 68.3 | 64.8 | 64.3 | 67.8 | 67.7 |
| **යටිතල පහසුකම්** (q) | | | | | | |
| අ.පො.ස. (උ.පෙළ ) විද්‍යාගාර සහිත පාසල් සංඛ්‍යාව | 646 | 698 | 702 | 716 | 716 | 748 |
| තොරතුරු තාක්ෂණ විද්‍යාගාර සහිත 1ඒබී සහ 1සී පාසල් ප්‍රතිශතය | - | 46.8 | - | 92.7 | - | 95.9 |
| තොරතුරු තාක්ෂණ විද්‍යාගාර සහිත 2 වර්ගයේ සහ 3 වර්ගයේ පාසල් ප්‍රතිශතය | - | 21.8 | - | 36.1 | - | 43.0 |
| පානීය ජල පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය | 73 | - | - | 83 | - | 85 |
| ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය (r) | 21 | - | - | 51 | - | 79 |
| **මූල්‍ය** (s) | | | | | | |
| අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද මුළු වියදම (රු. මි. ) | | 23,000 | 28,237 | 26,418 | 29,180 | 31,295 |
| පුනරාවර්තන (රු. මි. ) | | 19,562 | 23,970 | 22,373 | 24,932 | 26,926 |
| ප්‍රාග්ධන (රු. මි. ) | | 3,438 | 4,267 | 4,045 | 4,248 | 4,369 |
| අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සභා විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද මුළු වියදම (රු. මි. ) | 52,347 | 84,783 | 90,826 | 96,633 | 107,164 | 116,704 |
| පුනරාවර්තන (රු. මි. ) | 44,839 | 78,288 | 84,316 | 89,816 | 99,143 | 107,519 |
| ප්‍රාග්ධන (රු. මි. ) | 7,508 | 6,495 | 6,510 | 6,817 | 8,021 | 9,185 |
| පාසල් පෙළ පොත් ලබා දීම සඳහා වියදම | | 3,387 | 2,196 | 1,941 | 2,294 | 2,055 |
| පාසල් නිල ඇඳුම් ලබා දීම සඳහා වියදම | | 582 | 1,260 | 949 | 1,364 | 2,218 |
| **පාසල් පෝෂණ වැඩසටහන** | | 1,649 | 2,251 | 2,275 | 2,631 | 2,790 |

(a) වාර්ෂික පාසල් සංගණන දත්ත ඇසුරිනි.

(b) 1AB : 1 සිට 13 හෝ 6 සිට 13 ශ්‍රේණි සහිත අ.පො.ස. (උ.පෙ) විද්‍යා, වාණිජ, කලා ධාරා තුනම සහිත පාසල්

1C : 1 සිට 13 හෝ 6 සිට 13 ශ්‍රේණි සහිත අ.පො.ස. (උ.පෙ) වාණිජ හෝ කලා ධාරා දෙකම හෝ එකක් සහිත පාසල්

2 වර්ගය : 1 සිට 11 හෝ 6 සිට 11 ශ්‍රේණි සහිත අ.පො.ස. (සා.පෙ) දක්වා වූ පාසල්

3 වර්ගය : 1 සිට 5 හෝ 8 ශ්‍රේණිය දක්වා ඇති ප්‍රාථමික හෝ කනිෂ්ඨ පාසල්

(c) නාගරික - මහ නගර සභා හෝ නගර සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

ග්‍රාමීය - ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

(d) මුදල් අයකරනු ලබන හෝ අය කරනු නොලබන ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික අංශයෙන් පාලනය වන පාසල් ( මෙහිදී ජාත්‍යන්තර පාසල් ඇතුළත් නොවේ)

(e) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ( අන්ධ, ගොළු, බිහිරි, ඔටිසම් ) සඳහා වූ විශේෂ පාසල්

(f) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිත උපාධිධාරීන්

(g) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුලින් හෝ ගුරු විද්‍යාල තුලින් පුහුණුව ලබා ඇති ගුරුවරුන්

(h) වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ පුහුණු ගුරුවරුන් සංඛ්‍යාව, සමස්ත ගුරුවරුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස

(i) විශේෂ පාසල් ද ඇතුළුව

(j) වාර්ෂික පාසල් සංගණන දත්ත හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජනගහණ දත්ත ඇසුරිනි.

(k) අවුරුදු 5 සම්පූර්ණ වූ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල පළමු ශ්‍රේණියට ඇතුළත්ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(l) අවුරුදු 5-10 වයස් සීමාවේ සිටින ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික අධ්‍යාපන චක්‍රයට ඇතුළත්ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(m) අවුරුදු 5-14 වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික සිට කනිෂ්ඨ ද්විතීයික අවධිය දක්වා (1-9 ශ්‍රේණිවලට ) ඇතුළත්ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(n) අවුරුදු 5-16 අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික සිට ජ්‍යෙෂ්ඨ ද්විතීයික පළමු අවධිය දක්වා (1-11ශ්‍රේණිවලට ) ඇතුළත්ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(o) රජයේ පාසල්වලට පළමු ශ්‍රේණියට ඇතුළත්වන ශිෂ්‍යයින්ගෙන් 9 ශ්‍රේණිය දක්වා රැඳී සිටින ප්‍රතිශතය

(p) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ප්‍රතිඵල දත්ත ඇසුරිනි.

(q) පාසල්වල පවතින යටිතල පහසුකම් අතරින් ප්‍රධාන කිහිපයක් පමණක් මෙහි සලකා ඇත.

(r) පාසල් සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව සකස්කර ඇති ජාතික ප්‍රතිමානයන්ට අනුව ප්‍රමාණවත්බව ගණනය කර ඇත

(s) අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත සහ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ දත්ත ඇසුරිනි.

(t) කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල සියලුම රජයේ පාසල්වල ද මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල ඇතැම් රජයේ පාසල් ද 2009 ජුනි 01 පාසල් සංගණන දිනය වන විට වසා තිබිණි.

(u) පළමුවර අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

(v) පළමුවර හා දෙවන වර විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

(w) සිංහල හෝ දෙමළ මාධ්‍ය සහිතව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද විෂයයන් කිහිපයක් හදාරණ සිසුන්

## පරිච්ඡේද 1 - 9

# 1. අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

**දැක්ම**

ශ්‍රී ලාංකීය අනන්‍යතාවයේ හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මගින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම.

**මෙහෙවර**

නැණ - ගුණ - බල - සුව සපිරි ගුරු දෙගුරුනට සහ මවුබිමට ආදරය කරන විශ්වයට සම්පතක් වන යහපත් දක්ෂ නිර්මාණාත්මක පුරවැසියන් පිරිසක් බිහි කිරීම මගින් ශ්‍රී ලාංකේය මානව සම්පත සංවර්ධනය කිරීම.

## 1.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම

මහින්ද චින්තන ඉදිරි දැක්ම රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව යටතේ අවධාරණය කොට ඇති පරිදි වෙනස් වන ලෝකයට සරිලන සේ අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කරමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පනත්වලින් පැනවෙන විධිවිධාන හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම මධ්‍යම අමාත්‍යාංශයට පැවරී ඇති බැවින් පළාත් අධ්‍යාපන අධිකාරීත්වයත් සමඟ සහයෝගයෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීම අමාත්‍යාංශයේ ප්‍රධාන භූමිකාවකි.

අධ්‍යාපන ප්‍රමිතීන් සහතික කිරීමට අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත්ව සැපයීම හා විධිමත් සුපරීක්ෂණ ක්‍රියාවලියක් දියත් කිරීම ද අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරෙන වගකීම් අතර වේ.

පාසල් විෂයමාලාව, පෙළපොත්, ඇගයීම හා තක්සේරු කිරීම වැනි අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට පැවරී ඇති වගකීම් පිළිබඳ පසු විපරම් කිරීම හා ගුණාත්මක තහවුරුව පවත්වාගෙන යාම ද අමාත්‍යාංශයේ වගකීම් භාරයට අයත් වේ.

## 1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම හා නවීකරණය පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිසමට නිර්දේශ හා ප්‍රතිපෝෂණ සපයමින් අධ්‍යාපනයේ පුළුල් අරමුණුවල පිහිටා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති අර්ථකථනය හා භාවිතය.
- ජාතික අරමුණුවලට හා ප්‍රතිපත්තිවලට අනුකූල ව අධ්‍යාපනික ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නියාමනය, ප්‍රගති සමාලෝචනය හා ඇගයීම.
- අධ්‍යාපන සංවර්ධනය සඳහා ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික විදේශ සබඳතා පවත්වා ගැනීම, කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගී ව කටයුතු කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රමිති නිර්ණය කිරීම හා එම ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු යෙදීම සහ පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතනයන්හි නිර්මාණශීලී ක්‍රියාකාරකම් වර්ධනය කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපනය, ගුරු අධ්‍යාපනය, විශේෂ අධ්‍යාපනය හා පිරිවෙන් අධ්‍යාපනයට අදාළ විෂයමාලා සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම.
- අධ්‍යාපන සංවර්ධනය සඳහා පර්යේෂණ ක්ෂේත්‍ර හඳුනාගෙන පර්යේෂණ පැවැත්වීම හා එම ප්‍රතිඵල අධ්‍යාපන ක්‍රියාවලියෙහිලා ප්‍රයෝජනයට ගැනීම.
- ජාතික මට්ටමේ සහතික විභාග, විෂය විභාග හා අභියෝග්‍යතා පරීක්ෂණ සඳහා සුදුසු ඇගයීම් ක්‍රම පවත්වාගෙන යාම සහ සමාලෝචනය.
- ප්‍රබල ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ගුරු අධ්‍යාපනික ආයතන හා ජාතික පාසල්වල කළමනාකරණය හා කාර්යසාධනය ඇගයීම.
- අධ්‍යාපන කළමනාකරණය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව පළාත් අධ්‍යාපන බලධාරීන්ට උපදෙස් සැපයීම, සම්බන්ධීකරණය හා සමාලෝචනය.
- විදේශ ආධාර ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.
- ඉගෙනුම් ආධාරක, අධ්‍යාපන ගොඩනැගිලි හා උපකරණ සඳහා පිරිවිතර හා ප්‍රමිති නිශ්චය කිරීම හා සැලසුම් සංවර්ධනය කිරීම.
- පෙළපොත්, නිල ඇඳුම් හා ජාතික මට්ටමින් සැපයිය යුතු සේවා හා භාණ්ඩ සැපයීම.
- අධ්‍යාපන විෂය යටතේ සියලු ම ප්‍රාග්ධන වියදම් ද, අධ්‍යාපන අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනවල පුනරාවර්තන වියදම්ද ඇස්තමේන්තු කිරීම හා මුදල් වෙන් කිරීම සහ ක්‍රමවත් මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන ක්ෂේත්‍රය යටතේ ඇති සියලු ම සේවාවන්වල ව්‍යවස්ථා පරිපාලනය කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනවල මනා අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීම.

## 1.3 අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- ජාතික අධ්‍යාපන ආයතනය
- ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම

# 2. මහින්ද චින්තන ඉදිරි දැක්ම රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව හා බැඳුණු ජාතික අධ්‍යාපන සංවර්ධන ඉලක්ක

## 2.1 පුළුල් දැක්මක් සහිත අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලියක්

"මහින්ද චින්තන ඉදිරි දැක්ම 2010" උපාය මාර්ගික සංවර්ධන ප්‍රවේශයට අනුකූලව දැනුමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව පත් කිරීමේ අභිප්‍රාය සාර්ථක කර ගැනීම සඳහා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් හා බැඳුණු සංවර්ධන ඉලක්ක 12ක් හඳුනාගනු ලැබ ඇති අතර එම ඉලක්ක 2016 වන විට අත්පත් කර ගැනීම උදෙසා 2013 වර්ෂයේදී සුවිසල් කාර්යභාරයක් ඉටු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සමත් විය.

**ජාතික අධ්‍යාපන සංවර්ධන ඉලක්ක**

1. **අනිවාර්ය අධ්‍යාපන වයසේ සියලු ම දරුවන් සඳහා අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා සහතික කිරීම හා අ.පො.ස. (සා.පෙළ) දක්වා සහභාගීත්වය 85% සිට 90% දක්වා ඉහළ නැංවීම.**
2. **මහින්දෝදය ද්විතීයික පාසල් 1000ක් සහ ළමා මිතුරු ප්‍රවේශය සහිත ප්‍රාථමික පාසල් 6,500ක් ප්‍රතිනිර්මාණය කිරීම සහ වැසීයාමේ තර්ජනයට ලක් වූ පාසල් සංවර්ධනය කිරීම.**
3. **අ.පො.ස. (සා.පෙළ) සමත් ප්‍රතිශතය 61% සිට 75% දක්වා ඉහළ නංවාලීම.**
4. **අ.පො.ස. (උ.පෙළ) සමත් ප්‍රතිශතය, විද්‍යා විෂයය ධාරාව 50% සිට 53% දක්වා , වාණිජ විෂයය ධාරාව 51% සිට 60% දක්වා, කලා විෂයය ධාරාව 59% සිට 63% දක්වා ඉහළ නැංවීම.**
5. **අ.පො.ස. (උ.පෙළ) සහභාගීත්වය, විද්‍යා හා තාක්ෂණ විෂයය ධාරාව 21% සිට 40% දක්වාත් , වාණිජ විෂයය ධාරාව 27% සිට 35% දක්වාත් ඉහල නැංවීම සහ කලා විෂයය ධාරාවේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීම.**
6. **වෘත්තීය සුදුසුකම් සපිරි ගුරු ප්‍රතිශතය 81% සිට 90% දක්වා වැඩි කිරීම.**
7. **ශිෂ්‍ය තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව 35% සිට 70% දක්වාත්, තොරතුරු තාක්ෂණ කුසලතා සහිත ගුරු ප්‍රතිශතය 30% සිට 70% දක්වාත් ඉහළ නැංවීම.**
8. **අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) හදාරා පාසල් හැරයන සිසුන් 100,000ට ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සඳහා පදනම පාසල් මට්ටමින් සැපයීම.**
9. **සමාජ සංහිඳියාව අගයන ගුරු - සිසු පිරිසක් බිහිකිරීමේ පදනම ලෙස සියලු ම පාසල්වල ත්‍රිභාෂා ඉගෙනුම් ඉඩ ප්‍රස්තා පුළුල් කිරීම.**
10. **උසස් පෞරුෂයක් සහ ශාරීරික යෝග්‍යතාව සහිත දරු පරපුරක් බිහිකරලීමේ අරමුණින් සියලු ම පාසල්වල ක්‍රීඩා සඳහා පහසුකම් සැලසීම.**
11. **සෞන්දර්යය හා විෂය - සමගාමී ක්‍රියාකාරකම් අවස්ථා පුළුල් කිරීම.**
12. **සියලු ම අධ්‍යාපනික ආයතන විශිෂ්ට සේවා සැපයීම පිළිබඳ ජාතික ඵලදායිතා ප්‍රමිතීන් සපුරාලන ආයතන බවට පත්කිරීම.**

## 2.2 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන 2013 - 2017

2012 - 2016 දක්වා වූ "දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීම" අරමුණු කර ගත් අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහනෙහි දිගුවක් ලෙස 2013 - 2017 කාල පරිච්ඡේදය සඳහා පෙරළුම් සැලසුම් ක්‍රියාවලියට අනුව ජාතික ක්‍රමෝපායික සැලැස්මක් සකස් කර ඇත. "පළමුව අධ්‍යාපනය" ලෙස එළි දක්වා ඇති මෙම ජාතික ක්‍රමෝපායික සැලැස්ම පහත සඳහන් පරිදි ප්‍රතිපත්තිමය තේමාවන් 3ක් සහ පදනම් තේමාවක් යටතේ පෙළ ගස්වා ඇත.

**තේමාව 1 : ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සම සාධාරණ අධ්‍යාපන ප්‍රවේශ හා සහභාගීත්ව අවස්ථා ඉහළ නැංවීම**

### අපේක්ෂිත ප්‍රතිඵල

- 11 ශ්‍රේණිය (වයස අවුරුදු 16 දක්වා) තෙක් සිසුන්ගේ සහභාගීත්ව අනුපාතය ඉහළ යාම.
- 9 ශ්‍රේණියෙන් 10 ශ්‍රේණියට සමත් වන ශිෂ්‍ය අනුපාතය ඉහළ යාම.
- දළ ඇතුළත්වීම් අනුපාතයන් හා ශුද්ධ ඇතුළත්වීම් අනුපාතයන් ඉහළ යාම.
- පළාත් විසින් තීරණය කරන ලද ඉලක්කයන්ට අනුව පාසල් නොයන ශිෂ්‍ය සංඛ්‍යා ප්‍රමාණයන් අවම වීම.
- ප්‍රාථමික පාසල් ජාල සඳහා ද්විතීක පාසල් සංවර්ධන වැඩසටහන යටතේ ද්විතීක පාසල් 1,000 ක් හා ප්‍රාථමික පාසල් 6,500ක් සංවර්ධනය වීම.
- උසස් මට්ටමේ ඉගෙනුම් පරිසරයක් හරහා, ආයෝජන හා සුරක්ෂිත පාසල් පද්ධතියක් නිර්මාණය කිරීම.
- ජාතික ප්‍රතිමානනයන්ට අනුව මූලික හා උසස් මට්ටමේ ඉගෙනුම් පහසුකම් සියලු පාසල්වලට සැපයීම.
- නොවිධිමත් අධ්‍යාපන හා විශේෂ අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ට ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සම අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම.
- පිරිවෙන් සඳහා මූලික පහසුකම් සැපයීම.
- සියලු පාසල් ආරක්ෂිත හා සුරක්ෂිත පාසල් ලෙස සහතික කොට තිබීම.
- පාසල්වලින් ශාරීරික දඬුවම් දීමේ ක්‍රමය තුරන් වී තිබීම.
- ආපදා හා අවදානම් කළමනාකරණය ශක්තිමත් වීම.
- පාසල් පෙළ පොත්, පාසල් නිල ඇඳුම්,අවශ්‍ය සිසුන් සඳහා දිවා ආහාර හා ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර සැපයීම වැනි ඉල්ලුම මත පදනම් වූ අධ්‍යාපන සුභසාධනමය කාර්යයන් පවත්වා ගෙන යාම හා නිසි වේලාවට අදාළ ප්‍රතිලාභීන්ට එම සේවාවන් සැපයී තිබීම.
- සියලු පාසල් ආවරණය වන පරිදි පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වීම.

**තේමාව 2 : ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම**

### අපේක්ෂිත ප්‍රතිඵල

- වැඩ ලෝකයෙහි ඉල්ලුමට සරිලන පරිදි හා නිපුනතා අත්පත් කරගැනීම් තහවුරු වන පරිදි ජාතික විෂයමාලාව ප්‍රතිසංස්කරණය වීම හා යාවත්කාලීන වීම.
- පළමු බසින් අධ්‍යාපනය ලැබීම සහතික වීම.
- ශිෂ්‍යයන්ගේ විභවතාව අනුව ගණිතය හා විද්‍යාව විෂයමාලාව විවිධාංගිකරණය වීම.
- ද්විභාෂා අධ්‍යාපනය සඳහා විෂය අන්තර්ගතය හා භාෂා සමෝධානික රාමුවක් ස්ථාපිත කිරීම.
- සැම ද්විතීයික පාසලකම අවම වශයෙන් ක්‍රීඩා තුනක්වත් සිසුන් සඳහා හඳුන්වා දීම.
- ආයතනික ගුරු සංවර්ධන රාමුවක් අධ්‍යාපන පද්ධතිය තුල ස්ථාපිත වීම.
- අ.පො.ස.(සා.පෙළ) යටතේ ගණිතය, විද්‍යාව,ඉංග්‍රීසි හා මවු භාෂාව ( සිංහල සහ දෙමළ ) විෂයයන් සඳහාත් අ.පො.ස. (උ.පෙළ) යටතේ රසායන විද්‍යාව,භෞතික විද්‍යාව,ගණිතය හා ජීව විද්‍යාව සඳහාත් කලා හා වාණිජ විෂය ධාරාවන්ගෙන් තෝරා ගත් විෂයයන් සඳහාත් අයිතම ප්‍රතිචාරාත්මක විශ්ලේෂණයන් 2016 වන විට ප්‍රකාශයට පත් කිරීම.
- අ.පො.ස උසස් පෙළ විභාගය සඳහා 2016 වන විට පහත සඳහන් ප්‍රතිශත වලින් ඒ ඒ විෂය ධාරාවන් යටතේ සිසුන් පෙනී සිටීම
- 2010 වන විට 22.5% වූ විද්‍යා විෂය ධාරාවෙන් පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වන යිට 40% ක් දක්වා ඉහළ ගොස් තිබීම.

- මේ වන විට 25.2% වූ වානිජ විෂය ධාරාවෙන් පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වන යිට 35% ක් දක්වා ඉහළ ගොස් තිබීම.
- 2010 වන විට 52.3% වූ කලා විෂය ධාරාවෙන් පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වන යිට 25% ක මට්ටමක පැවතීම.
- ප්‍රාථමික හා ද්විතියික ශ්‍රේණි වල සිසුන්ගේ ප්‍රාප්ති මට්ටම් මැනෙන පරිදි ජාතික ඇගයීම් ක්‍රමවේදය මූලිකව ක්‍රියාත්මක වීම.
- අඩු සාධන මට්ටම් සහිත සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි විශේෂ ඉගැන්වීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක විම හා ඊට අදාළ පහසුකම් සැපයීම.
- පාසල් පෙළ පොත් වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා නිරීක්ෂණ කණ්ඩායම් කටයුතු කිරීම හා අදාළ පෙළ පොත් 100% ක් ඒ අනුව සුදුසු වීම. විශේෂයෙන් භාෂාව, ඉතිහාසය, ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව විෂයයන් වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම.
- පාසල් වල ජාතික සමාජ ඒකාග්‍රතා වැඩසටහන ප්‍රවර්ධනය වීම
- වෘත්තීමය මාර්ගෝපදේශන හා උපදේශන වැඩසටහන් ශක්තිමත්ව ක්‍රියාත්මක වීම.
- ප්‍රමිති හා තත්ත්ව වැඩසටහන් විමර්ශනය කිරීම හා යාවත්කාලීන කොට සියලු ම පළාත්වල මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**තේමාව 3 : අධ්‍යාපනයේ යහපාලනය හා සේවා සැපයීම් ශක්තිමත් කිරීම**

**අපේක්ෂිත ප්‍රතිඵල**

- පාසල් නගා සිටුවීමේ වැඩසටහනේ අදාළ පියවරයන් සම්පූර්ණ වීම හා පාසල් සංවර්ධනය සඳහා සැලසුම්කරණය, සැලසුම් යාවත්කාලීන කිරීම ආදී ක්‍රියාවලීන් අඛණ්ඩව ක්‍රියාත්මක වීම
- පාසල් සංවර්ධනය සඳහා පාසල් සංවර්ධන සමිති, පාසල් සංවර්ධන කමිටු හා පාසල් කළමනාකරණ කමිටු සංවර්ධනය කිරීම, ස්ථාපිත කිරීම හා ඊට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වීම.
- පාසල් වෙත තීරණ ගැනීමේ බලතල හා අධිකාරීත්වය මුදා හැරීම.
- සියලුම ප්‍රාථමික පාසල් වල ළමා මිතුරු ප්‍රවේශය ශක්තිමත්ව තිබීම.
- වෘත්තීය පලපුරුද්ද සහිත ගුරු අධ්‍යාපනඥයින්ගේ සේවාව පද්ධතියට ලැබීම.
- වෘත්තීමය පලපුරුද්ද හා කුසලතාවයන්ගෙන් හෙබි විදුහල්පතිවරුන් සේවයේ නියුක්ත වීම.
- වෘත්තීමය සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වන විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම.
- කලාප අධ්‍යාපන කාර්යාල, කළමනාකරණ / පරිපාලන ඒකක ලෙසත්, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල, අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ඒකක ලෙසත් ශක්තිමත්ව ක්‍රියාත්මක වීම.

**පදනම් තේමාව : අධ්‍යාපන ආංශික සංවර්ධන පෙරළුම් සැලැස්ම**

**අපේක්ෂිත ප්‍රතිඵල**

- තොරතුරු හා දත්ත මත පදනම් වූ අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම්කරණ සංස්කෘතියක් ස්ථාපිත වී තිබීම
- අධ්‍යාපන ආංශීය ක්‍රමෝපායික පෙරළුම් සැලැස්ම හා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළියෙල කිරීම හා යාවත්කාලීන කිරීම
- ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් මැනෙන ජාතික ඇගයීම් ක්‍රමවේදයක්, ප්‍රාථමික අවධිය(4 ශ්‍රේණිය : මව් භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි විෂයන් සඳහා) හා ද්විතියික අවධිය (8ශ්‍රේණිය : ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන් සඳහා) අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හා ඉන් අනාවරණය වන තොරතුරු ක්‍රමෝපායික පෙරළුම් සැලැස්ම හා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැසුම් සඳහා යොදා ගැනිම.
- අධ්‍යාපන පුනරාවර්තන අයවැයෙන් උසස් මට්ටමේ ඉගෙනුම් ක්‍රියාවලීන් සඳහා 2011 දී වෙන් වූ 3.2% ක් වූ ප්‍රතිපාදනය 2016 වන විට 4.2% ක් දක්වා ක්‍රමිකව වැඩි තිබීම.
- අධ්‍යාපන ප්‍රාග්ධන අයවැයෙන් උසස් මට්ටමේ ඉගෙනුම් ඉඩකඩ හා ප්‍රාග්ධන යෙදවුම් සඳහා 2011 දී වෙන් වූ 42% ක් වූ ප්‍රතිපාදනය 2016 වන විට 42.8% ක් දක්වා වැඩි තිබීම.
- අධ්‍යාපන ප්‍රාග්ධන අයවැයෙන් උසස් මට්ටමේ ඉගෙනුම් ඉඩකඩ හා ප්‍රාග්ධන යෙදවුම් නඩත්තු හා නවීකරණය සඳහා 2011 දී වෙන් වූ 15% ක් වූ ප්‍රතිපාදනය 2016 වන විට 17% ක් දක්වා වැඩි තිබීම.
- අධ්‍යාපන සැලසුම්කරණ සංස්කෘතියක් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ශක්තිමත්ව ක්‍රියාත්මක වීම.
- පාසල් අධ්‍යාපනය හා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍ර අතර මනා අන්තර් ආංශීය සම්බන්ධතාවයක් ස්ථාපනය වී තිබීම.

**හරස් ක්‍රියාකාරකම**


ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම් රාමුව ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීම

සමස්තයක් වශයෙන් මෙම මධ්‍ය කාලීන වැඩසටහන ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය හා ප්‍රාදේශිය සංවර්ධනය අභිමුඛ කරමින් ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රාදේශීය ව දැනුම හා කුසලතා පූර්ණ ප්‍රජාවක් බිහිකිරීම හරහා සමාජ ආර්ථික පරතරයන් පියවීමට එය දායක වනු ඇත. එසේ ම ශ්‍රී ලංකාවේ දිළිඳුභාවය තුරන් කිරීමට උපකාරී වීම ද මැදි ආදායම් ලබන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරය තහවුරු කිරීමට උපකාරී වීම ද මෙම වැඩසටහනේ දිගුකාලීන අපේක්ෂාව වේ.

## 2.3 නව අධ්‍යාපන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම.

### 2.3.1 නව අධ්‍යාපන ප්‍රතිපත්ති හා යෝජනා මාලාවක් හා බැඳුණු නව අධ්‍යාපන පනතක්

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ නව අධ්‍යාපන ප්‍රතිපත්ති හා යෝජනා මාලාව අධ්‍යාපන කටයුතු පිළිබඳ විශේෂ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ අනුමැතිය ලැබ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.




එම ප්‍රතිපත්ති හා යෝජනා මාලාව සමාලෝචනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් සහ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ කමිටුවක් පත් කර ඇත.

### 2.3.2 අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව අවුරුදු 16 දක්වා දීර්ඝ කිරීම

මෙතෙක් අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව ලෙස පැවති අවුරුදු 5-14 වයස් සීමාව අවුරුදු 5-16 දක්වා වැඩි කිරීමට පියවර ගනු ලැබිණි.

අධ්‍යාපනය සඳහා වූ ළමා අයිතිවාසිකම් සුරැකීම පිණිස ගනු ලැබූ ඉතා වැදගත් පියවරක් ලෙස මෙය හැදින්විය හැකිය.

අඩුම වශයෙන් අ.පො.ස.(සා.පෙළ) දක්වා වත් පාසලේ දරුවන් රඳවා ගැනීම මෙන්ම ළමා ශ්‍රමිකයන් බවට දරුවන් පත්වීම වැළැක්වීම මෙහි අරමුණයි.

## 2.4 සංවර්ධන ඉලක්ක ඉටු කරගැනීම උදෙසා රාජ්‍ය නායකත්වයේ මඟ පෙන්වීම

මහින්ද චින්තන ඉදිරි දැක්ම උපාය මාර්ගික සංවර්ධන ප්‍රවේශයට අනුකූලව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ළඟා කරගැනීමට බැඳී සිටින ජාතික ඉලක්ක කරා සමස්ත යාන්ත්‍රණය මෙහෙයවීම පිළිබඳව ප්‍රගතිය සමාලෝචන කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා 2013 පෙබරවාරි මස 18 වන දින ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශයට පැමිණ නිලධාරීන් හමුවිය.

එහි දී ගනු ලැබූ ප්‍රධාන තීරණ සහ ඊට අදාළව අමාත්‍යාංශය ගෙන ඇති පියවර පිළිබඳව මෙහි දැක්වේ.

- ♦ සියලුම ජාත්‍යන්තර පාසල්වල මව්භාෂාව, ආගම හා ඉතිහාසය යන විෂයයන් විෂය නිර්දේශයට ඇතුළත් කර ඉගැන්වීම අනිවාර්යය කිරීම සහතික කරනු වස් චක්‍රලේඛ නිකුත් කර අධීක්ෂණය හා නියාමනය කිරීමට අවශ්‍ය නිසි/අඛණ්ඩ වැඩපිළිවෙළක් සකස් කිරීම.
  - ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කොට එම කමිටුවේ නිර්දේශ ඇතුළත් වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කොට ඇත.
  - ජාත්‍යන්තර පාසල්වල මව්බස, ආගම හා ඉතිහාසය ඉගැන්වීම අනිවාර්ය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.
- ♦ පාසල්වල සියලුම ශ්‍රේණීන් සඳහා ළමුන් ඇතුළත් කර ගැනීමේ සම්පූර්ණ වගකීම අදාළ විදුහල් කළමනාකරණය වෙත පැවරීම සඳහා වූ නව ක්‍රමවේදයක් විධිමත් අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව කඩිනමින් ම හඳුන්වාදීම.
  - අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කොට ඇත.

- ♦ පූර්ව ළමා විය සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම පිණිස ජනාධිපති කාර්යාලයේ මගපෙන්වීම ද සහිතව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව කඩිනමින් ක්‍රියාත්මක කිරීම.

  - සෑම පළාතකම පෙර පාසල් නිරීක්ෂණය කර ගුරුවරුන්ගේ හා දෙමාපියන්ගේ අදහස් ලබා ගැනීමට කටයුතු කරන ලද අතර පූර්ව ළමාවිය සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ එක් ව ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීමට පියවර ගෙන ඇත.

  - අවිධිමත් මුදල් එකතු කිරීම් වළක්වාලමින් 2013/11 දරණ 2013.03.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලදී.

- ♦ පාසල්වල වත්කම් ලේඛනගත කිරීම සහ පාරදෘෂ්‍ය ගිණුම් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම.

  - පාසල් පාදක ගුණාත්මක හා ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය යන නව චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය සකස්කර පාසල්වලට ලබා දී ඇත. වත්කම් ලේඛණ ගත කිරීම පිළිබඳ සියලු ක්‍රියාපටිපාටීන් එහි ඇතුළත්ය.








- ♦ පාසල් ළමුන්ගේ මානසික තත්ත්වය හා පෞරුෂය වැඩි දියුණු කිරීම පිණිස න්‍යායාත්මක විෂයයන්ට අමතරව ක්‍රීඩා විෂයය, විෂයමාලාවට ඇතුළත් කර එම විෂයය සඳහා ද ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කිරීම

  - සෑම ළමයෙකුට ම ක්‍රීඩාව අනිවාර්ය කිරීම සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශය එක් ව වැඩසටහනක් සකස් කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. පාසල් මට්ටමින් වැඩසටහන ක්‍රියාවට නැංවීමට පියවර ගෙන ඇත.

- ♦ පාසල් සංවර්ධන කටයුතු සඳහා පාසල් ළමුන්ගෙන් අවිධිමත් මුදල් එකතු කිරීම්වලට අදාළව පළාත් සභාවන් සමඟ ද සාකච්ඡා කර නව චක්‍රලේඛ නිකුත් කිරීම.

- ♦ පාසල් සංවර්ධන කටයුතු අධීක්ෂණය හා මඟපෙන්වීමේ මාර්ගෝපදේශ සඳහා ප්‍රාදේශීය ලේකම්, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකු හෝ සමාජයේ පිළිගැනීමට ලක් වූ උගත් පුද්ගලයකු, ඉංජිනේරුවරයෙක් සහ පූජ්‍ය පක්ෂයේ නියෝජනයකින් ද සමන්විත උපදේශක කමිටුවක් පත් කිරීම හා එම ක්‍රමවේදය පළමුව පාසල් 1000 වැඩසටහන සමඟ ක්‍රියාත්මක කිරීම.

  - ආරම්භයක් ලෙස තෝරාගත් පාසල් කිහිපයක නියමු වැඩසටහනක් ක්‍රියාවට නැංවීමට පියවර ගෙන ඇත.

# 3. ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ සම සාධාරණ ප්‍රවේශය සහ සහභාගීත්වය සහතික කිරීම

## 3.1 මහින්දෝදය ද්විතීයික පාසල් 1000ක් ප්‍රතිනිර්මාණය කිරීමේ ජාතික වැඩසටහන

### 3.1.1 මහින්දෝදය ද්විතීයික පාසල් 1000 ක් ප්‍රතිනිර්මාණය කිරීමේ අරමුණු

2010 වර්ෂයේ දි ආරම්භ කරන ලද මහින්දෝදය ද්විතීයික පාසල් 1000ක් ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමෙහි ලා ක්‍රියාත්මක වේ.

- ප්‍රාථමික පාසල් කිහිපයක් මඟින් පෝෂණය වන ද්විතීයික පාසල් මඟින් අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක, ව්‍යුහාත්මක හා ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම.
- ද්විතීයික පාසලට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබා දීමෙන් අංග සම්පූර්ණ පාසලක් බවට පත් කිරීම.
- ප්‍රාථමික පාසල් සමඟ ගොනු වී සංවර්ධන උපක්‍රම හඳුනා ගැනීම හා සැලසුම් කිරීම.
- විශිෂ්ට අධ්‍යාපනික මධ්‍යස්ථාන බවට පත් කරමින් මානුෂික ගුණාංග සහිත පුරවැසියන් බිහි කිරීම.
- නාගරික ජනප්‍රිය පාසල්වලට ඇති ශිෂ්‍ය ගලනය අඩු කිරීම.
- දිවයිනේ සෑම ප්‍රදේශයකටම අධ්‍යාපනයේ සම සාධාරණත්වය ලබා දීම තහවුරු කිරීම.
- උසස්පෙළ විද්‍යා, ගණිත, වාණිජ හා තාක්ෂණ අංශයන්හි ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම.
- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ම අවම වශයෙන් 1AB පාසල් 3ක් වත් ප්‍රතිනිර්මාණය කිරීම.
- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ම අවම වශයෙන් එක් පාසලක් තුල මහින්දෝදය තාක්ෂණික පීඨයක් ආරම්භ කිරීම හා එමඟින් 2013 දී හඳුන්වා දුන් උසස්පෙළ තාක්ෂණික විෂය ධාරාව සඳහා සිසුන් යොමු කිරීම.
- විද්‍යා, ගණිත, තාක්ෂණ, වාණිජ, කලා, සෞන්දර්ය ආදී ක්ෂේත්‍ර තුලින් උසස් දැනුමක් සහිත සිසුන් රැකියා වෙළඳ පොළ සඳහා යොමු කරවීම.
- තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය හා භාෂා හැකියා වර්ධනය ගම් මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම.
- ද්විතීයික පාසල වටා ආකර්ෂණීය ළමා මිතුරු ප්‍රාථමික පාසල් ඉදිකිරීම.

### 3.1.2 මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරය පාදකව උසස් ඉගෙනුම් අවස්ථා සම්පාදනය

රුපියල් මිලියන 60ක පමණ වියදමින් සෑම මහින්දෝදය ද්විතීයික පාසලකටම තාක්ෂණික විද්‍යාගාරයක් ඉදිවන අතර, එහි පරිගණක 41කින් යුත් තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයක්, ගණිත උපකරණ සහිත ගණිතාගාරයක්, පරිගණක 20කින් හා භාෂා හැදෑරීම සඳහා යොදාගනු ලබන විශේෂිත මෘදුකාංග හා ආශ්‍රිත උපකරණ වලින් යුත් භාෂාගාරයක් හා දුරස්ථ අධ්‍යාපන පහසුකම් සහිත නැණස ඒකකයක් ඇතුළත් වේ.

එමෙන්ම සෑම මහින්දෝදය ද්විතීයික පාසලක් සඳහාම ජීව,රසායන,භෞතික විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍යයද ලබාදෙනු ලබන අතර, මෙතෙක් උසස්පෙළ විද්‍යා විෂය ධාරාව නොතිබූ පාසල් සඳහා උසස්පෙළ විද්‍යා විෂය ධාරාව ආරම්භ කිරීම සඳහා ජීව, රසායන, භෞතික විද්‍යාගාරයන්ද මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරය තුල ස්ථාපනය කෙරේ.

2013 වර්ෂයේදී පාසල් 616ක මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම් නිමකළ අතර, පාසල් 327 ක මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරයන්හි ඉදිකිරීම් 50% කට වඩා ප්‍රගතියක් පෙන්නුම් කරයි. ඉතිරි පාසල් 58 හි ඉදිකිරීම් කඩිනම් කිරීම සඳහා පියවර ගෙන ඇත.

මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර 150 ක් සඳහා උපකරණ ඇණවුම් කල අතර, එම උපකරණ පාසල් සඳහා බෙදා දිමට හා මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර තුල ස්ථාන ගත කිරීමට කටයුතු අරඹා ඇත. පාසල් 22 ක මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සිසු අයිතියට පත්කිරිම 2013 වසරේදී සිදුකරන ලදී.

## සිසු අයිතියට පත් කළ මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර කිහිපයක්



අවුලේගම සංඝබෝධි මහා විද්‍යාලය



ගලබාව මහා විද්‍යාලය



හලාවත පී.සී.එන් කොරයා මහා විද්‍යාලය



හබරණ මධ්‍ය මහා විද්‍යාලය

## මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරය ඇතුළත



පරිගණක 41කින් යුත් අංග
සම්පූර්ණ පරිගණක විද්‍යාගාරයක්



විද්‍යාගාරයක්



පරිගණක 20ක් හා නවීන උපකරණ
සහිත භාෂාගාරයක්



දුරස්ථ අධ්‍යාපන ඒකකයක්



මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරය



ගණිතාගාරයක්

**3.1.1වගුව : මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර ඉදිකිරීමේ ප්‍රගතිය - 2013.12.31 දිනට**

| පළාත | වෙන් කරන ලද පාසල් සංඛ්‍යාව | ඉදිකිරීම් නිම කළ පාසල් සංඛ්‍යාව | සිසු අයිතියට පත් කළ සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | 134 | 63 | 05 |
| මධ්‍යම | 153 | 66 | 02 |
| දකුණු | 110 | 91 | 02 |
| උතුර | 90 | 24 | - |
| උතුරු මැද | 83 | 46 | 02 |
| වයඹ | 127 | 100 | 09 |
| සබරගමුව | 113 | 79 | 01 |
| නැගෙනහිර | 103 | 89 | - |
| ඌව | 88 | 58 | 01 |
| එකතුව | 1001 | 616 | 22 |

### 3.1.3 මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර පිළිබඳව පළාත්, කලාප නිලධාරීන්, විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීම

ද්විතීයික පාසල් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහනේ අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර වඩාත් ඵලදායිව භාවිතා කිරීම පිළිබඳව පළාත් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් සහ කලාප සහ පාසල් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් 2013 වසරේදී පවත්වා ඇත.

මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් ද ප්‍රකාශයට පත් කරන ලදී.

මීට සමගාමීව සෑම මහින්දෝදය ද්විතීයික පාසලක් සඳහාම සම්බන්ධීකරණ නිලධාරියෙකු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් විසින් පත්කර ඇති අතර, සෑම මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරයක් සඳහාම කළමනාකරුවෙකු හා ඒකක භාර ගුරුවරුන් පාසලේ ගුරුමණ්ඩලය අතරින් පත්කර ඔවුන්ට නිශ්චිත කාර්යභාරයන් පවරා ඇත.




### 3.1.4 පාසල් පාදක පදනම මත අවශ්‍ය ගුරුවරුන් ලබාදීම

විද්‍යාව, ගණිතය, තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි යන විෂයයන්හි නව ඉගෙනුම් ක්‍රමවේදයන් නවීන පහසුකම් භාවිතයෙන් හඳුන්වාදීම තහවුරු කිරීම සඳහා මෙම පාසල්වලට ගුරුවරුන් සැපයීම සහතික කරනු වස් ගුරුවරුන් 3000ක් පාසල් පාදකව බඳවා ගැනීමට ඉලක්ක ගත කරන ලදී.

**3.1.2. වගුව: 2012, 2013 වර්ෂවල පාසල් පාදකව බඳවා ගනු ලැබූ ගුරු සංඛ්‍යාව**

| විෂයය | ගුරුවරු සංඛ්‍යාව |
|---|---|
| විද්‍යාව | 500 |
| ගණිතය | 500 |
| තොරතුරු තාක්ෂණය | 942 |
| ඉංග්‍රීසි | 210 |
| එකතුව | 2,152 |

මේ අතරින් යම් ගුරුවරුන් ප්‍රමාණයක් වැඩ භාර නොගැනීම සහ ඉංග්‍රීසි විෂය සඳහා ප්‍රමාණවත් පරිදි උපාධිධාරීන්ගෙන් අයදුම්පත් නොලැබීම මත ඉලක්කය සපුරාගත නොහැකි වූ බැවින් ඒ සඳහා නැවත බඳවා ගැනීම් සිදුකිරීමට ඉදිරියේ දී පියවර ගැනේ.

### 3.1.5 විදුහල්පතිවරුන් පුහුණු කිරීම

ද්විතීයික පාසල් 1000ක විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම සඳහා මූලික වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

### 3.1.6 පාසල් සංවර්ධන ප්‍රදානයන් ලබා දීම.

පළමු අදියරේ සහ දෙවන අදියරේ පාසල් සඳහා මූලික යටිතල පහසුකම් වැඩි දියුණු කරගැනීම වෙනුවෙන් එක් පාසලකට රුපියල් ලක්ෂ 5 බැගින් වූ මූල්‍යාධාර ප්‍රදානයක් ලබා දෙන ලදී. EKSP ව්‍යාපෘතිය යටතේ පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදානයන් පාසල් 1000කට ද විශේෂ මූල්‍ය ප්‍රදානයන් පාසල් 104ට ද ලබා දෙන ලදී.

### 3.1.7 සමස්ත ආයෝජනය

මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර 1000ක් ඉදිකිරීමට සහ එම සෑම තාක්ෂණ විද්‍යාගාරයකටම ඇතුළත් පරිගණක විද්‍යාගාරයට, විද්‍යාගාරයට, ගණිතාගාරයට, භාෂාගාරයට සහ නැණස දුරස්ථ අධ්‍යාපන ඒකකයට අවශ්‍ය පරිගණක යන්ත්‍ර ඇතුළු නවීන උපකරණ ලබාදීම සඳහා සමස්ත වශයෙන් රු.මිලියන 25,000ක


අයෝජනයක් සිදු කෙරේ.

මේ සඳහා 2013 වර්ෂය දරන ලද වියදම රු.මි. 4500 ක් විය.

### 3.1.8 වර්ධනීය ප්‍රවණතා

2012 - 2013 වර්ෂවල පළමු අදියරේ ද්විතීයික පාසල් 410ක් සංවර්ධනය කිරීමත් සමඟ එම පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව 24,395කින් වැඩි වීම සහ දෙවන අදියර ලෙස තවත් පාසල් 418ක් සංවර්ධනය වීමත් සමඟ සමස්තයක් ලෙස ශිෂ්‍ය සංඛ්‍යාව 39,264කින් වැඩි වීම කැපී පෙනෙන ප්‍රගතියකි.

**3.1.1. ප්‍රස්ථාරය: මහින්දෝදය ද්විතීයික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය**




### 3.1.9 මහින්දෝදය ද්විතීයික පාසල් සංවර්ධනය සඳහා දැනුම් සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතියේ ( EKSP) දායකත්වය

ආසියානු සංවර්ධන බැංකු ආධාර ලබන දැනුම් සමාජයක් සඳහා අධ්‍යාපනය ( EKSP ) ව්‍යාපෘතියේ වියදමින් මහින්දෝදය ද්විතියික පාසල් 100ක් අංග සම්පූර්ණ විද්‍යාගාර සහිතව ආකර්ෂණීය ලෙස සංවර්ධනය කිරීමට පියවර ගනු ලැබුණි.


මෙම පාසල්වල විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර පාසල් සංවර්ධන ප්‍රදානයන් ලබාදීමට ද කටයුතු කරන ලදී.

**3.1.3 වගුව : EKSP ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය වන පාසල් සංඛ්‍යාව සහ 2013.12.31 දිනට සිසු අයිතියට පත්කර ඇති පාසල් සංඛ්‍යාව**

| පළාත | සංවර්ධනය වන පාසල් සංඛ්‍යාව | සිසු අයිතියට පත් කළ පාසල් සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | 14 | 10 |
| මධ්‍යම | 12 | 18 |
| දකුණු | 12 | 03 |
| උතුර | 17 | 02 |
| උතුරු මැද | 8 | 09 |
| වයඹ | 8 | 09 |
| සබරගමුව | 10 | 06 |
| නැගෙනහිර | 11 | 08 |
| ඌව | 8 | 06 |
| **එකතුව** | **100** | **71** |

- 2013 වසරේදී මෙම පාසල් 100 අතුරින් 17ක ඉදිකිරීම් නිම කර සිසු අයිතියට පත් කරන ලද අතර ඒ අනුව මේ වන විට සිසු අයිතියට පත් කර ඇති මුළු පාසල් සංඛ්‍යාව 71 ක් විය.
- ද්විතියීක පාසල් 1,400ක් සඳහා පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදානයන් (SDMG) ලබා දීමේ ඉලක්කයට අනුව පාසල් 854ක් සඳහා මූල්‍ය ප්‍රදානයන් නිදහස් කර ඇත.
- ද්විතියීක පාසල් 104ක් සඳහා විශේෂ සංවර්ධන මූල්‍ය ප්‍රදානයන් (SDFG) පාසල් මට්ටමට නිදහස් කර ඇත.
- පාසල් 100හි සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පාසල් සංවර්ධන සමිති වෙත ඉදිකිරීම් ප්‍රදානය කරන ලදී.

**3.2.1 ප්‍රස්තාරය : ද්විතියික පාසල් 100හි විභාග ප්‍රතිඵල වර්ධනය**






හරන්ගල්ල මහා විද්‍යාලය

එදා → අද





පදවි පලුගස්වංගුව මහා විද්‍යාලය

එදා → අද





විජේරිය සුමන මහා විද්‍යාලය

එදා → අද





ශ්‍රී වලගම්බා මහා විද්‍යාලය

එදා → අද



## 3.2 ප්‍රාථමික පාසල් ජාලය ළමා මිතුරු ප්‍රවේශය අනුව සංවර්ධනය




ප්‍රාථමික පාසල දරුවාගේ අනාගතය හැඩගස්වන තීරණාත්මක ස්ථානයක් වන බැවින් ඊට උචිත ප්‍රියජනක අත්දැකීම් බහුල පරිසරයක් නිර්මාණය කිරීමේ ප්‍රවේශයක් ලෙස ළමා මිතුරු ප්‍රවේශය හඳුනාගනිමින් සියලුම ප්‍රාථමික පාසල් මානයන් 6ක් ඔස්සේ සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

### 3.2.1 ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශයන්

ළමා මිතුරු ප්‍රවේශයට අනුව ප්‍රාථමික පාසල්වල ගුණාත්මක ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමට අදාළව ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මාර්ගෝපදේශ සකස් කිරීම යුනිසෙෆ් ආධාර සහ තාක්ෂණික සහාය මත 2007 වසරේ සිට ක්‍රියාත්මක විය.

මහින්දෝදය ද්විතියික පාසල් 1000 හි සංවර්ධනයට සමගාමීව ප්‍රාථමික පාසල් ජාලය ළමා මිතුරු ප්‍රවේශයට අනුව සංවර්ධනය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය, ජනාධිපති කාර්යාලය හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මැදිහත්වීම සහිතව සංවර්ධන ක්‍රියාදාමයන් සමූහයක් 2012 වසරේ සිට ක්‍රියාත්මක කරන ලදී.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා එක් පාසලකට රුපියල් ලක්ෂ 5 බැගින් වූ මූල්‍ය ප්‍රදානයක් පාසල් 5000 කට ලබා දුන් අතර එමඟින් පාසල්වල සනීපාරක්ෂක පහසුකම් හා පානීය ජල පහසුකම් සංවර්ධනය කර ගැනීමටද, භෞතික පරිසරය ආකර්ෂණීයව සකස් කර ගැනීමටද අවස්ථාව හිමි විය.

ජනාධිපති කාර්යාලයේ මැදිහත් වීමෙන් පළාත් සභා සමඟ සම්බන්ධව තෝරා ගත් පාසල් 25ක සියලුම ප්‍රාථමික පාසල් බහු ආංශික දායකත්වය තුළින් ආදර්ශ පාසල් ලෙස සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

**3.2.1 වගුව : ළමා මිතුරු ප්‍රවේශය අනුව සංවර්ධනය කරන ලද ප්‍රාථමික පාසල් සංඛ්‍යාව**

| පළාත | 2012 | 2013 |
|---|---|---|
| බස්නාහිර | 160 | 304 |
| මධ්‍යම | 152 | 539 |
| දකුණු | 184 | 486 |
| උතුර | 129 | 283 |
| උතුරු මැද | 232 | 340 |
| වයඹ | 177 | 390 |
| සබරගමුව | 178 | 336 |
| නැගෙනහිර | 97 | 136 |
| ඌව | 369 | 508 |
| එකතුව | **1,678** | **3,322** |







### 3.2.2. සිසුන් 50ට අඩු පාසල් සංවර්ධනය

සිසුන් 50ට වඩා අඩු පාසල් සංඛ්‍යාව වසරින් වසර වැඩිවීමද ඉන් කිසියම් පාසල් සංඛ්‍යාවක් සෑම වසරකම ළමුන් නොමැති වීම නිසා වැසීයාමේ තර්ජනයට ලක්වීමද හේතුවෙන් ගම්බද දුෂ්කර දරුවන්ගේ අධ්‍යාපනයට මතුව තිබූ ගැටළු විසඳීම සඳහා ජනාධිපති කාර්යාලය මැදිහත්ව විශේෂ වැඩසටහනක් දියත් කරන ලදී. රාජ්‍ය හා පෞද්ගලික ආයතන ගණනාවක සහයෝගය ලබා ගනිමින් එවැනි පාසල් 1,552ක් සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

**3.2.2 වගුව : සංවර්ධන කරන සිසුන් 50ට අඩු පාසල් සංඛ්‍යාව**

| පළාත | සංවර්ධනය කරන පාසල් සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 93 |
| මධ්‍යම | 242 |
| දකුණු | 136 |
| උතුර | 189 |
| උතුරු මැද | 115 |
| වයඹ | 195 |
| සබරගමුව | 170 |
| නැගෙනහිර | 154 |
| ඌව | 258 |
| **එකතුව** | **1552** |

මෙම වැඩසටහනේ ප්‍රතිඵලයක් ලෙස

- සෑම කලාපයක ම අවම වශයෙන් පාසල් 2ක් වත් නැවත විවෘත කිරීමට හැකි වූ අතර.
- සිසුන් 50ට අඩු පාසල්වලට සිසුන් ඇතුලත්වීම 12% කින් ඉහල යාමක් දැකිය හැකි විය.





නැවත විවෘත කළ සෙවනපිටිය ප්‍රාථමික විද්‍යාලය



නැවත විවෘත කළ කලුගල ප්‍රාථමික විද්‍යාලය

## 3.3 විශේෂ සංවර්ධන අවශ්‍යතා සහිත පාසල් සඳහා වූ වැඩසටහන්

### 3.3.1. ජාතික පාසල් සංවර්ධනය

දිවයින පුරා ජාතික පාසල් 342ක් පිහිටුවා ඇති අතර මෙම පාසල්වල කළමනාකරණය පිළිබඳ සෘජු වගකීම අධ්‍යාපන අමාත්‍යාංශය දරණු ලබයි.

#### 2013 වර්ෂයේ ප්‍රගතිය

♦ ජාතික පාසල්වල ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය.

* අ.පො.ස.(සා.පෙළ) හා (උ.පෙළ) විභාග සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම හා අ.පො.ස. (උ.පෙළ) සම්මන්ත්‍රණ සඳහා සංයුක්ත තැටි බෙදා දීම.

♦ ජාතික පාසල් උපකරණ අළුත්වැඩියා කිරීම

* සංගීත උපකරණ අළුත්වැඩියාව සඳහා එක් පාසලකට රු.60,000 බැගින් ජාතික පාසල් 20 ක් සඳහා අධ්‍යාපන සේවා අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන ලබා දීම

* ජාතික පාසල්වල ලී බඩු උපකරණ අළුත්වැඩියාව සඳහා එක් පාසලකට රු.25,000 බැගින් ලබා දිම.

♦ ජාතික පාසල් සඳහා ලී බඩු උපකරණ ලබා දීම.

* ඩුප්ලෝ මැෂින් 36ක් මිළ දී ගෙන බෙදා හැරීම.

* නේවාසිකාගාර සඳහා යකඩ ඇඳන් 170, මෙට්ට 290, කෑම මේස 45, මේස පුටු 150ක් ලබාදීම.

### 3.3.2. වතු පාසල් සංවර්ධනය


වතුකරයේ දරුවන් වැඩි පිරිසක් අධ්‍යාපනය ලබන වතු ආශ්‍රිත ප්‍රදේශවල පිහිටි පාසල් 826ක් පමණ ඉලක්ක කොට මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

දරුවන් පාසල්වල රඳවාගැනීමේ සහ ඔවුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේ අරමුණින් පළාත් මට්ටමින් සහ ජාතික මට්ටමින් අඛණ්ඩව කරනු ලබන විශේෂ වැඩසටහන් තුළින් එම පාසල්වල අධ්‍යාපන මට්ටම ක්‍රමයෙන් සංවර්ධනය වීම දැකිය හැක.

#### 2013 වර්ෂයේ ප්‍රගතිය

♦ වතු පාසල් සිසුන්ගේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සංවර්ධනය

3.3.1 ප්‍රස්තාරය: වතු පාසල් වල 5 වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල ලකුණු 70ට වැඩියෙන් ලබාගත් ළමුන් ප්‍රතිශතය




* ප්‍රාථමික ගුරුවරුන්ගේ ඉගෙනුම් ක්‍රමවේද සංවර්ධනය කොට 5 වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල වැඩිදියුණු කිරීමේ අරමුණින් මධ්‍යම, බස්නාහිර, දකුණ සහ ඌව පළාත් 4හි වැඩමුළු 34ක් පැවැත්වීම.

* විද්‍යාව, ඉංග්‍රීසි, ගණිතය යන විෂයන් ට අදාළව ගුරුවරුන්ගේ ඉගෙනුම් ක්‍රමවේද සංවර්ධනය කිරීම සඳහා මධ්‍යම, බස්නාහිර, දකුණ සහ ඌව යන පළාත් 4හි වැඩමුළු 51ක් පැවැත්වීම.

### 3.3.4. දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනය

දෙමළ මාධ්‍යයෙන් පමණක් ඉගැන්වෙන පාසල් 2,914ක් ඇති අතර ඉන් 1,622ක් උතුර නැගෙනහිර ප්‍රදේශවල පවතී.

#### 2013 වර්ෂයේ ප්‍රගතිය

♦ අ.පො.ස සා.පෙළ ප්‍රතිඵල සාධන මට්ටම අඩු පාසල්වල විදුහල්පතිවරු 40ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

♦ British Council ආයතනය හා සම්බන්ධ වී නැගෙනහිර පළාතේ තෝරාගත් විදුහල්පතිවරු 40දෙනෙකුට නායකත්ව පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

♦ වලිකාමන්, තෙන්මාරච්චි, මන්නාරම, තුනුක්කායි කලාපවලට අයත් තෝරාගත් පාසල්වල විදුහල්පතිවරුන් 80 සඳහා ද මඩු කලාපයේ තෝරාගත් විදුහල්පති /උප විදුහල්පතිවරුන් 35 ක් සඳහා ද පුහුණු වැඩසටහන් පැවැත්වීම.

### 3.3.5. මුස්ලිම් පාසල් සංවර්ධනය

බහුතරයක් මුස්ලිම් දරුවන් ඉගෙනුම ලබන පාසල් 856ක් ඉලක්ක කරගෙන ඔවුන්ගේ අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

#### 2013 වර්ෂයේ ප්‍රගතිය

- මුස්ලිම් පාසල් විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ නිපුණතා සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම.
- අඩු සාධන මට්ටම් සහිත පාසල් තෝරාගෙන ඒවායේ සාධන මට්ටම ඉහළ නැංවීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 3.4 පිරිවෙන් අධ්‍යාපනය

පිරිවෙන් අධ්‍යාපනය නැංවීම සඳහා රජයේ ඉහළ ම ප්‍රමුඛතාවයක් යොමු වූ වසරක් ලෙස 2013 වසර හැඳින්විය හැක. පහත සඳහන් කාර්යසාධනයන් අත්පත් කර ගැනීමට හැකි වීම මෙහිලා සුවිශේෂී වේ.


- ජාතික සම්මන්ත්‍රණයක් පවත්වා අදහස් ලබාගෙන ජාතික පිරිවෙන් අධ්‍යාපන සැලැස්මක් සකස් කිරීම.
- පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය කොට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යැවීම.
- පිරිවෙන් අධ්‍යාපන සැලැස්ම ( 2014 - 2016 ) අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීම.
- 2013 අයවැය කථාවේදී පිරිවෙන් අධ්‍යාපනය හා සම්බන්ධ වැදගත් යෝජනා ගණනාවක් ඉදිරිපත් කිරීම.

#### 2013 වර්ෂයේ ප්‍රගතිය

2013 වර්ෂයේදී පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් පිරිවෙන් අධ්‍යාපනයේ සියලුම අංශයන්හී ගුණාත්මක වර්ධනයක් ඇති කිරීමට කටයුතු කරන ලදී.

- පිරිවෙන් අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරීන් සවිබල ගැන්වීම යටතේ 35 දෙනෙකු සවිබල ගැන්වීම.
- දිස්ත්‍රික් පරිවේණාචාර්යවරුන් සහ ගුරු උපදේශකවරුන් 7,146 දෙනෙකු පුහුණු කිරීම.
- කෘත්‍යාධිකාරී/පරිවේණාධිපති හිමිවරුන්ගේ 2,746 දෙනෙකුගේ ධාරිතා සංවර්ධනය කිරීම.
- පරිවේණාචාර්යවරුන් 450 දෙනෙකු සඳහා දෙමළ භාෂා පුහුණුව ලබාදීම
- ශිෂ්‍ය ස්වාමීන්වහන්සේලා 3,052 දෙනෙකු සඳහා භාවනා පුහුණුව ලබාදීම.
- ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් 1,838 දෙනෙකු සඳහා නායකත්ව පුහුණුව ලබාදීම.
- කෘත්‍යාධිකාරී හිමිවරුන් 544 දෙනෙකු සඳහා කාර්යාල කළමනාකරණ හා පුස්තකාල ප්‍රවර්ධන පුහුණුව ලබාදීම.
- පිරිවෙන් 740ක් සඳහා පුස්තකාල පොත් ලබාදීම.
- තෝරාගත් පිරිවෙන් 21ක් සඳහා ලී බඩු උපකරණ ලබාදීම.
- පිරිවෙන් 740ක් සඳහා ගුණාත්මක යෙදවුම් ලබාදීම.





**3.4.1. වගුව : පිරිවෙන් පිළිබඳ මූලික තොරතුරු - 2013**

| පිරිවෙන් වර්ගය | එකතුව | ශිෂ්‍ය සංඛ්‍යාව | | | පරිවේණාචාර්ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | පැවිදි | ගිහි | එකතුව | පැවිදි | ගිහි | එකතුව |
| මූලික | 462 | 16,130 | 3,490 | 19,620 | 1,473 | 1,163 | 2,636 |
| මහ | 215 | 16,026 | 6,778 | 22,804 | 1,097 | 1,034 | 2,131 |
| විද්‍යායතන | 57 | 2,863 | 19,321 | 22,184 | 316 | 1,003 | 1,319 |
| **එකතුව** | **734** | **35,019** | **39,589** | **64,608** | **2,886** | **3,200** | **6,086** |

## 3.5 නොවිධිමත් අධ්‍යාපනය

අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාවේ සිටිය ද විවිධ හේතූන් නිසා පාසලට ඇතුළත් නොවන ළමයින් සහ පාසලෙන් ගිලිහෙන ළමයින් සඳහා ද පාසල් හැරගිය වැඩිහිටියන් සඳහා ද ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය මෙහි දැක්වේ.

- අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් මට්ටමින් අනිවාර්ය අධ්‍යාපන කමිටු දැනුවත් කිරීම.
- පාසල් නොයන ළමුන් පිළිබඳව සමීක්ෂණයක් යුනිසෙෆ් සංවිධානයේ සහ යුනෙස්කෝ සංවිධානයේ අනුග්‍රහය මත 2013 වර්ෂයේ දී සිදු කර එහි වාර්තාව ජාතික සමුළුවක් පවත්වා එළිදැක්වීම.
- පාසල් නොයන ළමයි පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස්කොට පළාත් හා කලාප වෙත හඳුන්වාදීම.
- නොවිධිමත් අධ්‍යාපන අවස්ථා සම්පාදනය
    - * අවාසිදායක පරිසරවල ළමයින් සඳහා සාක්ෂරතා පන්ති 30ක් ක්‍රියාත්මක කිරීම.
    - * කාර්යබද්ධ සාක්ෂරතා පන්ති 6ක් පැවැත්වීම.
    - * ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන හරහා රූපලාවන්‍ය උපදේශකවරු 42ක් පුහුණු කිරීම.
    - * ආදායම් ඉපයීමේ වැඩසටහන් සඳහා බේකරි උපකරණ කට්ටල 9ක් මිලදී ගෙන දීම.
- නොවිධිමත් පාඨමාලා 20ක් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමට ගෙන ඒමට ක්‍රියාකිරීම.
- බන්ධනාගාර ගත වූවන් සඳහා අධ්‍යාපනය ලබාදීමේ අරමුණින් බන්ධනාගාර පාසලක් ඇරඹීම සඳහා වටරැක බන්ධනාගාරයේ ගොඩනැගිලි ඉදිකිරීමට පියවර ගැනීම.
- අවාසිදායක පරිසරවල ජීවත් වන සාක්ෂර පන්තිවල ඉගෙනුම ලබන ළමයින් 250ක් සඳහා ජාත්‍යන්තර සාක්ෂර දින වැඩසටහන පැවැත්වීම.

## 3.6 විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ අධ්‍යාපනය

### 2013 වර්ෂයේ ප්‍රගතිය

- පහසුකම් සැපයීම
    - * විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා ඇස්කණ්නාඩි සහ සවන්වහල් සැපයීම.
    - * ජාතික පාසල් වල විශේෂ අධ්‍යාපන ඒකක සඳහා උපකරණ මිලදි ගැනිම හා බ්‍රේල් මුද්‍රණාලයේ අමුද්‍රව්‍ය මිලදි ගැනිම සිදුකිරීම.
    - * විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා කඳවුරු 9ක් පැවැත්වීම.
    - * දෘෂ්ටි ඌණතා සහිත ළමුන් 405ක් සඳහා බ්‍රේල් පෙළපොත් ලබාදීම.
- ඉගෙනුම් උපකරණ සැපයීම
    - * පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක 22ක් නවීකරණය කිරීම.

* ජාතික පාසල් නව විශේෂ අධ්‍යාපන ඒකක 03 ඉදිකිරිම.
* බ්‍රේල් මුද්‍රණාලය සහ ඕටිසම් මධ්‍යස්ථානය සඳහා උපකරණ සැපයීම.

♦ විශේෂ සංවර්ධනාත්මක ප්‍රවේශ

* විශේෂ අධ්‍යාපන පුහුණුව ලැබූ ගුරුවරුන් එම ක්ෂේත්‍රයෙහිම සේවයේ යෙදවීම සඳහා මූලික පියවර ගැනිම.
* ඇසීම නොමැති සිසුන්ට සංඥා භාෂාව ඉගැන්වීම සඳහා විශේෂ අධ්‍යාපන වෘත්තිකයින් 50ක් පුහුණු කිරීම සහ බ්‍රේල් ඉගැන්වීම පිළිබඳ වෘත්තිකයින් 60ක් පුහුණු කිරිම.

♦ විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට ජාතික විභාගවලට පෙනී සිටීම සඳහා විශේෂ පහසුකම් සැලසීමට විභාග දෙපාර්තමේන්තුව කටයුතු කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස විභාගවලට පෙනී සිටින සහ ඉහළ දක්ෂතා පෙන්නුම් කරන ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය වෙමින් පවතී.

## 3.7 ශිෂ්‍ය සුභසාධන වැඩසටහන්

### 3.7.1. ශිෂ්‍ය සුභසාධන වැඩසටහන්

ශිෂ්‍ය සුභසාධන වැඩසටහන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා අධ්‍යාපන සේවා අමාත්‍යාංශය දායක වන අතර එලෙස ක්‍රියාත්මක වැඩ සටහන් සඳහා දරනු ලබන වියදම පහත වගුවේ දැක්වේ.

**3.7.1 වගුව : ශිෂ්‍ය සුභසාධන වැඩසටහන් සඳහා ආයෝජනය**

| වැඩසටහන | 2008 රු.මි. | 2009 රු.මි. | 2010 රු.මි. | 2011 රු.මි. | 2012 රු.මි. |
|---|---|---|---|---|---|
| පාසල් දිවා ආහාර වැඩසටහන | 1,699 | 2,251 | 2,474 | 2,631 | 2,790 |
| පෙළපොත් | 3,387 | 2,196 | 2,056 | 2,337 | 2,127 |
| නිල ඇඳුම් | 582 | 1,260 | 949 | 1,364 | 2,218 |
| ශිෂ්‍යාධාර හා ශිෂ්‍යත්ව | 193 | 184 | 225 | 283 | 240 |
| ලංගම වාර ප්‍රවේශ පත්‍ර | 600 | 1,384 | 1,369 | 1,359 | 1,339 |

මූලාශ්‍රය : මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය: වාර්ෂික වාර්තාව 2012

## 3.7.2 ශිෂ්‍යාධාර වැඩසටහන් පිළිබඳ විස්තර

ඉගෙනුමට දක්ෂතා ඇති ආර්ථික වශයෙන් දුෂ්කරතා සහිත සිසු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා ශිෂ්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- **5ශ්‍රේණිය ශිෂ්‍යත්ව :** අඩු ආදායම්ලාභී සිසු දරුවන් වසරකට 15,000 බැගින් එකතුවෙමින් පද්ධතියේ සිසු දරුවන් 84,000කට වර්ෂයකට එක් අයෙකුට රු. 5,000 බැගින් ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම.

- **මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව :** අ.පො.ස. (සා/පෙ) ඉහළ ප්‍රවීනතාව සහිත උසස්පෙළ හදාරණ අඩු ආදායම්ලාභී සිසු දරුවන් 150ක් සඳහා වාර්ෂිකව ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම.

- **ඩයලොග් ශිෂ්‍යත්ව :** අ.පො.ස. (සා/පෙ) ඉහළ ප්‍රවීණතාව සහිත උසස්පෙළ ගණිත විෂයධාරාව හදාරණ සිසු දරුවන් 30ක් සඳහා වාර්ෂිකව ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම.

- **සිසු දිරිය ශිෂ්‍යත්ව :** 10 - 13 ශ්‍රේණිවල ඉගෙනුම ලබන අඩු ආදායම්ලාභි පවුල්වල දක්ෂ දරුවන් සඳහා ශිෂ්‍යත්ව 14,846ක් පිරිනැමීම.

- **මහින්දෝදය තාක්ෂණික ශිෂ්‍යත්ව :** අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ වැටුප් පරිත්‍යාගයෙන් සහ EKSP ව්‍යාපෘතියේ රු.මිලියන 113ක දායකත්වයෙන් අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂයධාරාව හදාරණ සිසුන් 7000ක් වෙනුවෙන් මහින්දෝදය තාක්ෂණික ශිෂ්‍යත්ව අරමුදල ආරම්භ කිරීම. මෙම ශිෂ්‍යත්ව අරමුදල සවිබල ගන්වනු වස් මොබිටෙල් ආයතනය සමඟ අධ්‍යාපන



අමාත්‍යාංශය ගිවිසුමකට එළඹීම.

- **සුජාත දියණි ශිෂ්‍යත්ව :** අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂය හදාරණ අඩු ආදායම්ලාභී ශිෂ්‍යාවන් සඳහා සුජාත දියණි ශිෂ්‍යත්ව වැඩසටහන ආරම්භ කිරීම. මෙම ශිෂ්‍යත්ව අරමුදල තවත් රු.මිලියන 12.5කින් වැඩිකිරීම



සඳහා කොරියානු තානාපති කාර්යාලය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම.

# 4. විෂය මාලාව හා විෂය සමගාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සංවර්ධනාත්මක ප්‍රවේශයන්

## 4.1 ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය

### 4.1.1 ගුණාත්මක සංවර්ධන ප්‍රවේශයන්

ළමා මිතුරු ප්‍රවේශය අනුව ප්‍රාථමික පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා සමගාමීව ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය උදෙසා ක්‍රියාත්මක කළ වැඩසටහන් හා ඒවායේ ප්‍රගතිය පහත දැක්වේ.

#### 2013 වර්ෂයේ ප්‍රගතිය

ගුරුවරුන් පුහුණු කිරීම හා ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම.

- ළමා මිතුරු ක්‍රියාකාරකම් අත්පොත සකස් කිරීම.
- 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව අවම ප්‍රතිඵල පෙන් වූ දෙමළ මාධ්‍ය ජාතික පාසල් 25ක සහ සිංහල මාධ්‍ය ජාතික පාසල් 13ක ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරවීම.
- ප්‍රාථමික අධ්‍යාපන පුහුණුවක් නොලද ප්‍රාථමික ශ්‍රේණිවල උගන්වන සියලුම ගුරුවරුන් පලාත් මට්ටමින් පුහුණු කිරීම සඳහා පුහුණුකරුවන් 491ක් ජාතික අධ්‍යාපන ආයතනය සමඟ පුහුණු කිරීම.
- බහුතල ඉගෙනුම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් 8ක පුහුණුකරුවන් 400ක් පුහුණු කිරීම.
- විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස ගණිත කඳවුරු පැවැත්වීමට පළාත් 05ක ගුරුවරුන් 150ක් හා ඉංග්‍රීසි කඳවුරු පැවැත්වීමට පළාත් 9ක ගුරුවරුන් 350ක් පුහුණු කිරීම.
- පළාත් 5ක ගණිත කඳවුරු සඳහා සිසුන් 625ක් ද පළාත් 9ක ඉංග්‍රීසි කඳවුරු සඳහා සිසුන් 1200ක් ද සහභාගී කරවීම.
- රිජ්වේ ආර්යා ළමා රෝහලේ නේවාසික සිසුන්ගේ ඉගැන්වීම් කටයුතු සඳහා ප්‍රාථමික අධ්‍යාපන විද්‍යාපීය ඩිප්ලෝමාධාරීන් 4 දෙනෙකු ගුරුවරුන් ලෙස යොමු කිරීම.

#### උපකරණ ලබා දීම

- ප්‍රාථමික අංශය සහිත ජාතික පාසල් 206කට ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීම.
- ප්‍රාථමික අංශය සහිත ජාතික පාසල් 196ට ගණිත හා ප්‍රාථමික අධ්‍යාපන උපකරණ මිලදී ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීම .
- ජාතික පාසල් 15ක ප්‍රාථමික අංශවලට ලී බඩු ලබා දීම හා පාසල් 33කට පරිගණක ලබා දීම.

### 4.1.2 නව ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය

ඒකාබද්ධ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය මගින් තෝරාගත් ප්‍රාථමික පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය මෙන් ම විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ කුසලතා වර්ධනයද සිදුකරනු ලබයි.

#### 2013 වර්ෂයේ ප්‍රගතිය

- ව්‍යාපෘති පාසල්වල අර්ධ අවසාන ගොඩනැගිලි තනා නිම කිරීම.
  - * ලැබුණු ප්‍රතිපාදන අනුව පාසල් 3ක ගොඩනැගිලි තනා නිම කිරීම.
- පාසල්වලට අවශ්‍ය උපකරණ ලබාදීම.
  - * බටහිර තූර්යවාදක කට්ටල 20ක්, ලිපිගොනු කැබිනට් 40ක්, ඡායා පිටපත් යන්ත්‍ර 21ක්, බහුමාධ්‍ය උපකරණ 50ක් සහ ධූප්ලෝ යන්ත්‍ර 7ක් මිල දී ගෙන පාසල්වලට බෙදා දීම.
- ව්‍යාපෘති පාසල්වල විදුහල්පති හා ගුරු කුසලතා සංවර්ධනය.
  - * පාසල් 475ක විදුහල්පතිවරුන් සහ ප්‍රාථමික ගුරුවරුන් දෙදෙනෙකු බැගින් පුහුණු කිරීම.


## 4.2 ගණිත අධ්‍යාපනය නැංවීමට විශේෂ අවධානයක්

අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ගණිතය සමත් වීමේ ප්‍රතිශතය වැඩි කිරීම ප්‍රධානත ම ඉලක්කය ලෙස හඳුනාගනිමින් ගණිතය ප්‍රියමනාප විෂයයක් ලෙස හඳුන්වා දීමට සහ ඉගෙනුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය පහත දැක්වේ.

### 2013 වර්ෂයේ ප්‍රගතිය

- ජාත්‍යන්තර ඔලිම්පියාඩ් හා ගණිත තරඟාවලි තුලින් ශිෂ්‍ය විභවතා වර්ධනය
  - * සුහග සිසුන් සෑම පළාතකින්ම හඳුනාගෙන විධිමත්ව පුහුණු කර අන්තර් ජාතික තරග දක්වා රැගෙන යාමට අවශ්‍ය පියවර ගැනීම.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය
  - * ගණිතාගාර ඵලදායීව භාවිතය හා එහි ඇති ගණිත උපකරණවල ක්‍රියාකාරිත්වය ඇතුළත් අත්පොතක් සහ සංයුක්ත තැටියක් නිර්මාණය කිරීම.
  - * තේමා 6ක් යටතේ සියලු විෂයය කරුණු ඇතුලත් වන සේ ගණිතාධාරක ඉගෙනුම් මූලාශ්‍ර සකස්කිරීමට පියවර ගැනීම.
  - * මහින්දෝදය තාක්ෂණාගාර නොමැති ජාතික පාසල් 43ක් වෙත ගණිත උපකරණ සැපයීම.
- ප්‍රතිකාර්ය වැඩසටහන්
  - * "ගණිතයට අත්වැලක් "පොත සහ "6 ශ්‍රේණිය පැවරුම් පොත" දෙමළ මාධ්‍යයෙන් පරිවර්තනය කොට ප්‍රකාශයට පත්කිරීම.
  - * 2012 සා.පෙළ ගණිත විෂයෙහි සාධන මට්ටම 50% ට අඩු කලාප සඳහා කඩිනම් ප්‍රතිකාර්යය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම.
- ගණිතය විෂයය ප්‍රියමනාප කරවීම.
  - * ගණිත දැනුම මිණුම හා ගණිත නාට්‍ය ඇතුළත් ජාතික ගණිත තරඟාවලියක් පවත්වා ජයග්‍රහකයින්ට සහතික පත්‍ර හා කුසලාන ප්‍රදානය කිරීම.
- ගුරු පුහුණු වැඩසටහන්
  - * දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව කෑගල්ල, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්කවල ගණිත විෂය සංවර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
  - * ජ්‍යාමිතික හා වීජ ගණිතය තේමා යටතේ විෂයභාර නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා වැඩසටහන් 8ක් පැවැත්වීම.
  - * ද්විතීයික පාසල් 1,000 සඳහා බඳවාගනු ලැබූ නවක උපාධිධාරීන් පුහුණු කිරීමට ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව කටයුතු කිරීම.

**4.2.1 ප්‍රස්ථාරය : අ.පො.ස. (සා.පෙළ) ගණිතය සමත්වීමේ ප්‍රතිශතය**




### ජාත්‍යන්තර විද්‍යා ගණිත ඔලිම්පියාඩ් ජයග්‍රහණ 2013

| තරඟාවලිය | ලබාගත් මුළු පදක්කම් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | රන් | රිදී | ලෝකඩ | එකතුව |
| අන්තර් ජාතික ගණිත තරඟාවලිය ජ්‍යෙෂ්ඨ අංශය (2013, බල්ගේරියාව) | 7 | 3 | 11 | 21 |
| අන්තර්ජාතික විද්‍යා හා ගණිත ඔලිම්පියාඩ් තරඟාවලිය (2013, පිලිපීනය) | - | 2 | 5 | 7 |



## 4.3 විද්‍යා අධ්‍යාපනයේ නව පිබිදීමක්


### 4.3.1 විද්‍යා අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම

මහින්දෝදය ද්විතීයික පාසල් 1000 සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමඟම විද්‍යා අධ්‍යාපනය දිවයින පුරා සියලු ග්‍රාමීය ප්‍රදේශයන්ට ද ව්‍යාප්ත වීම ශ්‍රී ලාංකීය දරු පරපුරට විද්‍යා අධ්‍යාපනයේ සම අවස්ථා තහවුරු කෙරෙන ඓතිහාසික සන්ධිස්ථානයක් විය.

මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරය හරහා විද්‍යාගාර පහසුකම් සැපයීමත්, පාසල් පදනමින් බඳවා ගනිමින් උපාධිධාරී ගුරුවරුන් 500ක් සැපයීමත් විෂය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ හැක.


2010 වර්ෂයේ 716ක් ව පැවති අ.පො.ස. ( උ.පෙළ) විද්‍යා ධාරාව සහිත පාසල් සංඛ්‍යාව 2013 වර්ෂය වන විට 865ක් දක්වා ඉහල යාම විද්‍යා අධ්‍යාපනය සඳහා ඉඩ ප්‍රස්ථාව වැඩිකරමින් සිසුන් එම අංශයට නැඹුරු කිරීමට පිටුවහලක් වී ඇත.

**4.3.1 ප්‍රස්තාරය : විද්‍යා අධ්‍යාපනය සහිත පාසල් සංඛ්‍යාව**





ඒ හා සමගම අ.පො.ස. ( උ.පෙළ) විද්‍යා අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව ද සීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත.

**4.3.2. ප්‍රස්තාරය : උසස් පෙළ විද්‍යා ශිෂ්‍ය සංඛ්‍යාව**




**4.3.3 ප්‍රස්තාරය : අ.පො.ස. ( සා.පෙළ) විද්‍යාව සමත් වීමේ ප්‍රතිශතය**




### 4.3.2. 2013 වර්ෂයේ ප්‍රගතිය

- ජාත්‍යන්තර ඔලිම්පියාඩ් තරගාවලිය සඳහා සිසුන් ඉදිරිපත්කොට ජයග්‍රහණ ලබාගැනීම.
  - සුහග සිසුන් සෑම පළාතකින්ම හඳුනාගෙන විධිමත්ව පුහුණු කර අන්තර් ජාතික තරග දක්වා රැගෙන යාමට අවශ්‍ය පියවර ගැනීම.
- අ.පො.ස (සා.පෙළ) විද්‍යා විෂයෙහි අඩු සාධනයක් සහිත පාසල්වල සාධනය ඉහළ නැංවීම.
  - අ.පො.ස (සා.පෙළ) අවම සාධනයක් සහිත පළාත් 6කින් තෝරාගත් 6 - 11 විද්‍යා ගුරුවරුන් 50 බැගින් පුහුණු කිරීම.
- ද්විතියික පාසල් 1000 විද්‍යා විෂය සංවර්ධනයට කටයුතු කිරීම.
  - එම පාසල් සඳහා පත් වූ නවක විද්‍යා උපාධිධාරි ගුරුවරුන් 140ක් පුහුණු කිරීම.
  - එම පාසල්වලට අයත් පාසල් 100ක සිංහල මාධ්‍ය 6 - 11 විද්‍යා ගුරුවරුන් පුහුණු කිරීම.
- ජාතික පාසල් හා සියළු පාසල් සඳහා විද්‍යා උපකරණ මිලදී ගැනීම හා බෙදා හැරීම.
  - පාසල් 100ක් සඳහා රු.මි.23ක වටිනාකමින් යුත් විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය ප්‍රමුඛතාවය අනුව බෙදාදීම.

## 4.4 අධ්‍යාපනයේ නව මගක් සනිටුහන් කරමින් අ.පො.ස. (උ.පෙළ) සඳහා තාක්ෂණ විෂය ධාරාව හඳුන්වා දීම

### 4.4.1 ප්‍රායෝගික කුසලතා කෙරෙහි නැඹුරුවක්

සම්ප්‍රදායික අධ්‍යාපන රටාවෙන් බැහැරව යමින් ශ්‍රම වෙළඳ පොලට ගැලපෙන කුසලතා පිරි සිසු පරපුරක් බිහි කිරීමේ අරමුණින් සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුවට සිසුන් පාසලේදීම යොමු කිරීමේ අරමුණින් අ.පො.ස.(උසස් පෙළ) සඳහා පැවති විද්‍යා, වාණිජ, කලා, විෂය ධාරාවන්ට තාක්ෂණ විෂය ධාරාව ද එක් කිරීම ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ ඓතිහාසික හැරවුමක් ලෙස සඳහන් කළ හැක. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙහි සමාරම්භක උත්සවය 2013 ජූනි මස 20 වන දින ජනාධිපති මන්දිරයේ දී පැවැත්විණි.

### 4.4.2 අන්තර් අමාත්‍යාංශ සහයෝගීතාව

මෙම වැඩසටහන පහත සඳහන් පරිදි අන්තර් අමාත්‍යාශ සහයෝගිතාවයෙන් යුතුව ආරම්භ කරන ලදී.

- යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය හරහා තාක්ෂණ උපදේශකවරු 119ක ගේ සේවාව
- ප්‍රායෝගික පුහුණුව සඳහා කාර්මික විද්‍යාලවල අවස්ථාව.
- 2016 වර්ෂයේ සිට සෑම විශ්ව විද්‍යාලයකම විද්‍යා හා තාක්ෂණ පීඨයක් පිහිටුවීම.

### 4.4.3 ආරම්භක ප්‍රගතිය

- 2013 අ.පො.ස.(උසස් පෙළ) තාක්ෂණ ධාරාවට ශිෂ්‍ය ඇතුළත් වීම 13950 ක් පමණ විය.
- තෙමහල් මහින්දෝදය තාක්ෂණ ඒකක 250 ක් ඉදිකිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගනු ලැබිණි.
- රු.මි.40 ක් වටිනා උපකරණ හා යන්ත්‍ර සූත්‍ර සෑම ඒකකයකටම ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලදී.
- පද්ධතියේ සිටින තාක්ෂණ ගුරුවරුන් 300ක් පුහුණු කොට මෙම පාසල් වෙත අනුයුක්ත කරන ලදී. තවත් ගුරුවරුන් 600ක් බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී.
- ජාතික අධ්‍යාපන ආයතනය හා එක් ව විෂය මාර්ගෝපදේශ සංග්‍රහය, විෂය නිර්දේශ සහ ගුරු අත්පොත් සකස් කරන ලදී.

4.4.3 වගුව : තාක්ෂණ විෂය ධාරාව ආරම්භ කළ පාසල් සංඛ්‍යාව

| පළාත | සිංහල මාධ්‍ය පාසල් | දෙමළ මාධ්‍ය පාසල් | එකතුව |
|---|---|---|---|
| බස්නාහිර | 50 | 1 | 51 |
| මධ්‍යම | 26 | 9 | 35 |
| දකුණු | 34 | 2 | 36 |
| උතුර | 1 | 18 | 19 |
| උතුරු මැද | 5 | 15 | 20 |
| වයඹ | 23 | 3 | 26 |
| සබරගමුව | 21 | 0 | 21 |
| නැගෙනහිර | 18 | 3 | 21 |
| ඌව | 20 | 1 | 21 |
| එකතුව | **156** | **56** | **250** |

### 4.4.4. අනාගත ඉලක්ක

අ.පො.ස(උසස් පෙළ) විභාගයේ දී ලබන සුදුසුකම් මත 2016 වර්ෂයේ සිට පහත සඳහන් උසස් අධ්‍යාපන අවස්ථා හිමිවේ.

- තාක්ෂණවේදී උපාධි පාඨමාලාව (B.Tech) සඳහා විශ්ව විද්‍යාලවලට වාර්ෂිකව ශිෂ්‍යයන් 1500 ක් .
- යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවනු ලබන විශ්ව විද්‍යාල විද්‍යායතන 25 ක උසස් තාක්ෂණවේදී ඩිප්ලෝමාව සඳහා ශිෂ්‍යයින් 7500 ක් .
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයට (UNIVOTECH) ඇතුළු වීමේ අවස්ථාව.
- පාසලින් පිට වන විට ම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 3)සහතිකයක් .








## 4.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනීය ප්‍රවනතා

තොරතුරු හා තාක්ෂණවේද විෂයය ඉගැන්වීම මෙන් ම අධ්‍යාපනය සඳහා තොරතුරු හා තාක්ෂණවේදය භාවිතා කිරීම තුළින් ඉගැනුම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගනිමින් යටිතල පහසුකම් වර්ධනය සහ ගුරු පුහුණුව ඇතුළු ක්‍රියාත්මක කළ වැඩසටහන් වල ප්‍රගතිය පහතින් දැක්වේ.

♦ පරිගණක පහසුකම් සැපයීම

* පළාත් හා කලාප තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන සංවර්ධනය සඳහා 2013 අයවැයෙන් වෙන් වූ රු.මි. 50න් මධ්‍යස්ථාන 47ක් සඳහා පරිගණක හා උපාංග මිලදී ගැනීම.
* මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරවල පරිගණක 40කින් යුත් පරිගණක විද්‍යාගාරය බැගින් ඉදිකිරීම.
* ජාතික පාසල් 4ක් සඳහා පරිගණක යන්ත්‍ර හා උපාංග ලබා දීම.



♦ ගුරුවරුන් පත් කිරීම සහ පුහුණු කිරීම.

* ද්විතීයික පාසල් 1000 සඳහා ප්‍රථමවරට පාසල් පාදකව තොරතුරු තාක්ෂණ උපාධිධාරී ගුරුවරුන් 628ක් 2012/ 2013 වර්ෂවල බඳවා ගැනීම.
* චිත්‍රක හා සජීවිකරණ පාඨමාලා සඳහා ගුරුවරුන් 55දෙනෙකු, වෙබ් අඩවි සංවර්ධනය සඳහා ගුරුවරුන් 58 දෙනෙකු හා දෘඩාංග හා ජාලකරණ නිමැවුම් සඳහා ගුරුවරුන් 24දෙනෙකු පුහුණු කිරීම.
* පරිගණක දෘඩාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම් සාමාජිකයින් ලෙස ගුරුවරුන් 99 දෙනෙකු පුහුණු කිරීම.
* තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය උගන්වන උපාධිධාරී නොවන ගුරුවරුන් සඳහා වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාල (UNIVOTEC) මගින් උපාධි ලබා දීමට ක්‍රියා කර 2013 වසරේ ගුරුවරුන් 27ක් ඒ සඳහා යොමු කිරීම.
* EKSP ව්‍යාපෘතිය යටතේ ගුරුවරුන් 43,224කට ජාත්‍යන්තර බලපත්‍ර ICDL/ CAL ගුරු පුහුණුව ද ගුරුවරුන් 17,350කට උසස් මට්ටමේ බලපත්‍ර IPICT ගුරු පුහුණුව ද, විදුහල්පතිවරුන් හා අධ්‍යාපන බලධාරීන් 5828කට e – Citizen පුහුණුව ද, ගුරුවරුන් 12,000කට Intel Teach ICT පුහුණුව මේ වන විට ලබා දීම.

♦ මෘදුකාංග තරඟාවලි

* ජාතික මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශූරයෝ තරඟාවලිය - 2013 පවත්වා ගුරු සිසු දෙපිරිසේ මෘදුකාංග නිර්මාණ ඇගයීමට ලක් කර ත්‍යාග හා සහතික පත් ප්‍රදානය කිරීම.
* EKSP ව්‍යාපෘතිය මගින් සම්බන්ධීකරණය කරන මෘදුකාංග නිර්මාණ තරඟාවලිය හරහා ගුරුසිසු දෙපිරිසේ නිර්මාණ ඇගයීමට ලක්කොට පාසල් 439කට ජාතික විශිෂ්ඨතා සම්මාන මේ වන විට ලබා දීම.

♦ ඉගෙනුම් කළමනාකරණ පද්ධති



* School Net, e-තක්සලාව, වෙබ් පාඨශාලා පද්ධති හරහා සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද ඉගෙනුම් සම්පත් වෙත ප්‍රවේශ වීමේ පහසුකම් ලබා දීම.
* e - තක්සලාව සඳහා 7 හා 10 ශ්‍රේණිවලට අදාළ හර විෂයයන් හි මෘදුකාංග නිර්මාණය 60%කින් අවසන් කිරීම.

♦ කලාපීය පරිගණක මධ්‍යස්ථානවල NVQ මට්ටමේ පාඨමාලා පැවැත්වීම

* යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා එක්ව තොරතුරු තාක්ෂණ විෂය හදාරන සිසුන්ට NVQ සහතික ලබාදීම ආරම්භ කිරීමට පියවර ගැනීම.

## 4.6 සිසුන් තුළ ත්‍රි භාෂා කුසලතා වර්ධනය

### 4.6.1 සිංහල හා දෙමළ මව්භාෂා අධ්‍යාපනය හා දෙවන ජාතික භාෂා අධ්‍යාපනය

සිංහල හා දෙමළ මව් භාෂාවන් හි කුසලතා වර්ධනය හා දෙවන ජාතික භාෂාවෙහි කුසලතා වර්ධනය සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන් වල ප්‍රගතිය මෙහි දැක්වේ.

- 2013 සමස්ත ලංකා / ජාතික සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය පවත්වා ජයග්‍රාහකයින් තෝරා අවසන් කිරීම.
- 2013 සමස්ත ලංකා දෙමළ භාෂා තරගාවලිය පවත්වා ජයග්‍රාහකයින්ට සහතික පත් ප්‍රදානය කිරීම.
- සමස්ත ලංකා දෙවන ජාතික භාෂා ඇගයීම් ක්‍රියාවලිය පවත්වා ජයග්‍රාහකයින්ට සහතික පත් ප්‍රදානය කිරීම.
- නුවණ අධ්‍යාපනික සගරාව - 2013 මුද්‍රණය කර අවසන් කිරීම.
- කූර්මතී සගරාව - 2013 මුද්‍රණය කර අවසන් කිරීම.


### 4.6.2 ඉංග්‍රීසි අධ්‍යාපනය

- සැමට ඉංග්‍රීසි වැඩසටහන යටතේ පාසල් හැරගිය සිසුන් සඳහා පැය 100ක ඉංග්‍රීසි සහතිකපත් පාඨමාලාව
  - ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථාන 30න් 27ක සිසුන් 1,100ක් සාර්ථකව පාඨමාලාව හැදෑරීම.
- සමස්ත ලංකා ඉංග්‍රීසි භාෂා හා නාට්‍ය තරගාවලිය
  - ළමුන් 1,152 සහභාගීත්වයෙන් පැවැත්වීම.
- අ.පො.ස.(උ.පෙ) ඉංග්‍රීසි සාහිත්‍ය විෂය හදාරන සිසුන් සඳහා Lit Q ඉංග්‍රීසි සාහිත්‍ය ප්‍රශ්න විචාරාත්මක රූපවාහිනී වැඩසටහන
  - ජයග්‍රාහී පළාත් 3 සඳහා පළිහ හා පදක්කම් පිරිනැමීම.
- ද්විතියික පාසල්වල ඉංග්‍රීසි භාෂාව ප්‍රතිඵල ඉහළ නැංවීම
  - Self Learning Kit ස්වයං අධ්‍යයන කට්ටල 1,000ක් මුද්‍රණය කිරීම හා බෙදා හැරීම.
- අ.පො.ස.(සා.පෙ) ඉංග්‍රීසි සාහිත්‍ය උගන්වන ගුරුවරුන්ගේ විෂය දැනුම සංවර්ධනය
  - ගුරුවරුන් 85ක් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.

### 4.6.3 ජීවන කුසලතාවක් ලෙස ඉංග්‍රීසි

පාසල් සිසුන්ගේ ඉංග්‍රීසි ශ්‍රවන හා කථන කුසලතා වර්ධනය සඳහා ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකායේ මෙහෙයවීමෙන් ජනාධිපති කාර්යාලයේ විශේෂ කාර්යාරම්භන ඒකකයේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කළ වැඩසටහන්වල ප්‍රගතිය පහත දැක්වේ.

- 2015 වර්ෂයේ සිට අ.පො.ස.(සා.පෙ) විභාගයේ දී ඉංග්‍රීසි ශ්‍රවන හා කථන කුසලතා ඇගයීමට ලක්කරමින් ලකුණු ප්‍රදානයට අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීම.
- ඉංග්‍රීසි ශ්‍රවන හා කථන කුසලතා නැංවීම සඳහා 10, 11 ශ්‍රේණි වෙනුවෙන් සකස් කරන ලද ඩී.වී.ඩී. පැකේජය එළි දැක්වීම හා පැකේජ 4,600ක් බෙදා හැරීම.
- ඉංග්‍රීසි ශ්‍රවන හා කථන කුසලතා ඇගයීම පිළිබඳ සම්පත් පුද්ගලයින් ලෙස ඉංග්‍රීසි ගුරුවරුන් 366 දෙනෙකු පුහුණු කිරීම.
- ඉංග්‍රීසි විෂය පිළිබඳ විභාග හා ඇගයීම් මාර්ගෝපදේශ සංග්‍රහ 25,000ක් බෙදා හැරීම.
- 6, 11 සිසුන්ගේ ඉංග්‍රීසි ශ්‍රවන හා කථන කුසලතා වර්ධනය කිරීම සඳහා ගුරු මෙවලම් අත් පොත් 25,000ක් මුද්‍රණය කර බෙදා හැරීම.
- පාසල් 27ක් සඳහා පරිගණක, රූපවාහිනී යන්ත්‍ර සහ උපාංග බෙදා හැරීම.
- ඉන්දීය ආධාර මත භාෂා කුසලතා වර්ධනයට පළාත් 09 සඳහා භාෂා විද්‍යාගාර 9ක් ස්ථාපිත කිරීමට කටයුතු කොට බස්නාහිර පළාත් භාෂා විද්‍යාගාරය නිල වශයෙන් විවෘත කිරීම.
- ජීවන කුසලතාවක් ලෙස ඉංග්‍රීසි වැඩසටහනේ ඵලදායීත්වය නියාමනය සඳහා පාසල් 1,956ක් අධීක්ෂණයට ලක් කිරීම.
- ඉංග්‍රීසි ශ්‍රවන පිළිබඳ හා කථන කුසලතා පිළිබඳ දින 10ක පුහුණුවකින් ගුරුවරු 1,050ක් සඳහා ලබාදීම සහ ගුරු අත්පොත් ගුරුවරු 5,000ක් සඳහා හඳුන්වාදීම.



- පැය 100ක ඉංග්‍රීසි ශ්‍රවන හා කථන පාඨමාලා 37ක් ඔස්සේ විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් හා සහකාර විදුහල්පතිවරුන් 1,120ක් ද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි ගුරු ශිෂ්‍යයින් 1,000ක් ද පුහුණු කිරීම.
- පළාත් භාෂා අග්‍රගන්‍ය මධ්‍යස්ථාන (CELE) හරහා ගුරුවරුන් 495 ක් පුහුණු කිරීම.
- ඉංග්‍රීසි භාෂා කුසලතා වර්ධනය සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ පාඩම් මාලාවක් ප්‍රචාරය කිරීම.

### 4.6.4 ද්විභාෂා අධ්‍යාපනය

- විෂය භාෂා සමෝධානිත ඉගෙනුම් ප්‍රවේශ රාමුව (CLIL) සම්බන්ධයෙන් සම්පත්දායකයින් 151ක් හා පළාත් හා කලාප සම්බන්ධීකරණ නිලධාරීන් සහ ගුරු මධ්‍යස්ථාන කළමණාකරුවන් 74 දෙනෙකු පුහුණු කිරීම.
- 6, 10, 12 ශ්‍රේණිවල ද්විභාෂා අධ්‍යාපන ගුරුවරුන් 1,885ක් පළාත් මට්ටමින් පුහුණු කිරීම
- ද්විභාෂා අධ්‍යාපනය සහිත පාසල් සංඛ්‍යාව 1000ක් දක්වා වර්ධනය කිරීම.
- ද්විතියික පාසල් 1000 වැඩසටහනට අයත් පාසල් 50කට ක්‍රියාකාරකම් පැකේජ හඳුන්වා දීම.

## 4.7 මානව ශාස්ත්‍ර විෂයන් ඔස්සේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය

- මානව ශාස්ත්‍ර විෂයයන් යටතට ගැනෙන භූගෝලය හා ඉතිහාසය වැනි විෂයයන්හි දරුවන්ගේ දැනුම සංවර්ධනය සඳහා 2013 සමස්ත ලංකා /ජාතික සමාජවිද්‍යා තරගාවලිය පැවැත්වීම.
- අ.පො.ස. (සා.පෙ) මානව ශාස්ත්‍ර විෂය ප්‍රතිඵල අඩු පාසල් 50ක් තෝරා ප්‍රතිඵල ඉහල නැංවීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට විදුහල්පතිවරුන් දැනුවත් කිරීම.

## 4.8 වාණිජ විෂයයන් ඉගැන්වීම සඳහා නව ප්‍රවේශයක්

### 2013 වර්ෂයේ ප්‍රගතිය

- වාණිජ හා කළමනාකරණ අධ්‍යාපන විද්‍යා පීඨයක් ආරම්භ කිරීම.
  * ප්‍රථම වරට වාණිජ හා කළමනාකරණ විෂයයන්හි ගුරුවරුන් බිහිකිරීම සඳහා අධ්‍යාපන විද්‍යා පීඨයක් ආරම්භ කිරීමට පියවර ගැනීම.
- පාසල්වල වාණිජ අංශ ශක්තිමත් කිරීම.
  * තෝරාගත් පාසල් 10ක වාණිජ අංශ සඳහා පරිගණක ලබාදීම.
  * මහජන බැංකුවේ අනුග්‍රහය ලබාගෙන පාසල් වාණිජ විද්‍යාගාර පිහිටුවීම.
- විෂයය සංවර්ධනය සඳහා විද්වත් කමිටුවක් මඟින් අදහස් ලබාගැනීම.
- ධාරිතා සංවර්ධන වැඩසටහන්
  * නවක වාණිජ විද්‍යා උපාධිධාරී ගුරුවරුන් දිශාභිමුඛ කිරීමේ වැඩමුළු සම්බන්ධීකරණය.
  * දැයට කිරුළට සමගාමීව ඌව, උතුරු මැද, නැගෙනහිර හා සබරගමුව පළාත්වල අ.පො.ස. (උසස් පෙළ) වාණිජ ගුරුවරුන් 150කට ගිණුම්කරන ක්ෂේත්‍රයේ නව වෙනස්කම් පිළිබඳ පුහුණුවක් ලබාදීම.
  * විෂය අධ්‍යක්ෂවරුන් සහ ගුරු උපදේශකවරුන් සඳහා වැඩමුළු 3ක් පැවැත්වීම.
  * වරලත් සහතිකලත් ගණකාධිකරණ සංගමයේ (ACCA) සහයෝගය මත ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සියලු වාණිජ විෂයයන් සඳහා ගුරුවරු පුහුණු කිරීම.
  * AATSL ආයතනය හා එක් ව ජාතික පාසල් අතර හොඳම වාර්ෂික ගිණුම් වාර්තාව හා ගිණුම් තරගාවලිය පවත්වා ත්‍යාග ප්‍රදානය කිරීම තුළින් පාසල් මූල්‍ය කටයුතු විධිමත් කිරීමට දිරිමත් කිරීම.

## 4.9 කෘෂිකර්ම සංවර්ධන හා පරිසර සංරක්ෂණය සඳහා ශිෂ්‍ය කුසලතා වර්ධනය

අ.පො.ස.(සා.පෙළ) තාක්ෂණ විෂයයක් හා අ.පො.ස.(උ.පෙළ) ප්‍රධාන විෂයයක් ලෙස කෘෂි විද්‍යාව පාසල තුල ඉගැන්වේ.

2013 අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණ විෂය ධාරාවහඳුන්වාදීමත් සමඟ පාසල් 251ක ජෛව පද්ධති තාක්ෂණවේදය ඉගැන්වීම අරඹන ලදී. ශිෂ්‍යයින් 4,970ක් මෙම වසරේ එම විෂය හැදෑරීම තෝරා ගෙන ඇත.

### 2013 වර්ෂයේ ප්‍රගතිය

- ධාරිතා සංවර්ධන වැඩසටහන්
  - නියාමන හා ඇගයීම සඳහා කෘෂිකර්ම අධ්‍යාපන නිලධාරීන් 42ක් පුහුණු කිරීම.
  - නවක පත්වීම් ලැබූ කෘෂි විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුභවතුන් 91 දෙනෙකු දිශාභිමුඛ කිරීම.
  - අ.පො.ස.(උ.පෙළ) කෘෂි විද්‍යා දෙමළ මාධ්‍ය ගුරුවරුන් 45ක් පුහුණු කිරීම.
- ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය හඳුන්වාදීම.
  - අ.පො.ස.(උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය පිළිබඳව කෘෂිකර්ම ගුරු උපදේශකවරුන් 250ක් හා කෘෂිකර්ම ගුරුවරුන් 250ක් පුහුණු කිරීම.
- GLOBE පරිසර අධ්‍යාපන වැඩසටහන
  - ජලය, පාංශු, වායුගෝල, භූමි ආවරණ අධ්‍යයනය පිළිබඳව ගුරුවරුන් 80 දෙනෙකු පුහුණු කිරීම.
  - ලෝක ජල දිනයට සමගාමී ව පවත්වන ලද සිසු කඳවුරට සිසුන් 75ක් සහ ගුරුවරුන් 16ක් සහභාගී කරවීම.
  - පාසල් කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයක් පිහිටුවීමට ගා/මීපාවල අමරසූරිය විද්‍යාලයට මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම.
- හරිත පාසල් වැඩසටහන
  - හරිත පාසල් වැඩසටහන පාසල් 200ක ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම.
  - ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය කිරීම සහ බලශක්ති කළමණාකරණ මාර්ගෝපදේශ සංග්‍රහය සැකසීම.
  - හරිත පාසල් වැඩසටහන යටතේ කොළඹ නාලන්දා විද්‍යාලය සහ මාතර ශාන්ත තෝමස් විද්‍යාලය ඉන්දියාවේ විද්‍යා හා පරිසර මධ්‍යස්ථානය මඟින් ඇගයීමට ලක් කිරීම.
- " අද වවමු පැළයක් - හෙට නෙලමු ඵලයක්" අලුත් අවුරුද්දේ වැඩ ඇල්ලීමේ නැකතට සිසුන් පැළ සිටුවීමේ වැඩසටහන.
  - ජාතික උත්සවය ර/සීවලී මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැත්වීම.
- පාසල් ගොවි පොළ හා ඔසු උයන් පිහිටුවීම.
  - පාසල් 200ක ගොවි පොළ පිහිටුවීම.
  - දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව පාසල් ගොවිපොළ 270ක් කෑගල්ල, කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල පිහිටුවීම.
  - තෝරාගත් පාසල් 120ක ඔසු උයන් පිහිටුවීම.
- පාසල් වතු භූමි අලංකරණය
  - බප/හො/පලන්නොරුව මධ්‍ය මහා විද්‍යාලයේ වතු භූමි අලංකරණය කිරීම.
  - 2013 ලෝක පරිසර දිනයට සමගාමීව මාතලේ ශාන්ත තෝමස් විද්‍යාලයේ ගොවි පොළ ස්ථාපනය සහ වතු භූමි අලංකරණය සිදු කිරීම.
- පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
  - අ.පො.ස. (උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා උපකරණ හා විද්‍යාගාර ලී බඩු ලබා දීම.
  - ජාතික පාසල් 20කට කෘෂිකර්ම උපකරණ ලබා දීම.
  - පාසල් 20කට GLOBE පරිසර අධ්‍යාපන උපකරණ ලබා දීම.



## 4.10 සෑම ශිෂ්‍යයෙකුටම ක්‍රීඩාව අනිවාර්ය කිරීම

"සෑම ශිෂ්‍යයෙකු ම කිසියම් හෝ ක්‍රීඩාවක අනිවාර්යයෙන්ම නිරත කරවීම තුළින් මානසික හා ශාරීරික සමබරතාවයකින් යුතු ශිෂ්‍යයෙකු බිහිකිරීම" සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශ එක්ව වැඩසටහනක් සකස් කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම 2013 වර්ෂයේ පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ගනු ලැබූ වැදගත් පියවරකි.

- ඒ අනුව ක්‍රියාත්මක කළ වැඩ සටහන් වල ප්‍රගතිය
  - ප්‍රාථමික අංශයේ ගුරුවරුන් 3150ක් පුහුණු කිරීම හා දරුවන් ලක්ෂ 8ක් නිසි පරිදි ශාරීරික ක්‍රියාකාරකම්වල යෙදවීම.
  - ජිම්නාස්ටික් ,මලල ක්‍රීඩා, වොලිබෝල්, පාපන්දු හා නෙට් බෝල් යන ක්‍රීඩා 6 සඳහා ගුරුවරුන් 1,282ක් පුහුණු කිරීම හා ද්විතීයික අංශයේ ශිෂ්‍යයින් 58,861කට පුහුණු කඳවුරු පැවැත්වීම.
  - ද්විතියීක අංශයේ දරුවන් සඳහා උදෑසන ශාරීරික සුවතා වැඩසටහන අනිවාර්ය කිරීම හා අදාල CD තැටි සකස් කර බෙදා දීම.

### 2013 සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගාවලිය

- ක්‍රීඩා පාසල් 17ක් තුළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 800 දෙනෙකුට විධිමත් පුහුණුවක් ලබාදීමට හැකි වීම.
- 2013 සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගවලදී නව වාර්තා 19ක් බිහිවිය.
- දක්ෂම මලල ක්‍රීඩකයාට සහ ක්‍රීඩිකාවට රුපියල් ලක්ෂය බැගින් ද ක්‍රීඩා ඉසව් 26ක දක්ෂතම ක්‍රීඩක ක්‍රීඩිකාවන් 48ට දෙනෙකුට රු. 20,000 බැගින් ද මුදල් ත්‍යාග ලංකා බැංකුවේ සහ ප්‍රීමා ආයතනයේ අනුග්‍රහය යටතේ පිරිනමන ලදී.

**පාසල් මලල ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ජයග්‍රහණ - 2013**

| තරගාවලිය | රන් | රිදී | ලෝකඩ | එකතුව |
|---|---|---|---|---|
| ආසියාතික යෞවන ක්‍රීඩා උළෙළ | - | 1 | 3 | 4 |
| මැකාවෝ ආරාධිත තරගාවලිය | 1 | - | - | 1 |
| දෙවන SAF කණිෂ්ඨ මලල ක්‍රීඩා තරගාවලිය | 3 | - | - | 3 |



## 4.11 ආගමික හැදියාවෙන් යුතු සාරධර්ම සුරකින පරපුරක්

පාසල් සිසු දරු දැරියන් තුළ සාරධර්ම ප්‍රවර්ධනය සඳහා සියලු ආගමික විෂයයන් හරහා ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- පාසල් සිසුන් සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ගුරු ආචාර ධර්ම ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සාරධර්ම වැඩසටහන් ප්‍රවර්ධනය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහ සකස්කොට සම්පත් පුද්ගලයින් පුහුණු කිරීම.

2013 වර්ෂයේ ගනු ලැබූ සුවිශේෂී ක්‍රියාමාර්ගයන් වනුයේ ධර්මාචාර්ය විභාගය සමත් 1000කට ගුරු සහායකයින් ලෙස පත්වීම් ලබාදීමට අවශ්‍ය මූලික කටයුතු ඉටු කිරීමයි.





## 4.12 ශිෂ්‍ය පෞරුෂ වර්ධනයට ඉවහල්වන වැඩසටහන් රැසක්

### 4.12.1 විෂය සමගාමී වැඩසටහන්

* ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය හා එක් ව "බටර්ෆ්ලයිස් "වැඩසටහන අවු. 5- දැරිවියන් සඳහා වයඹ හා සබරගමුව පළාත් වල ක්‍රියාත්මක කිරීම සහ අනෙකුත් පළාත්වල ක්‍රියාත්මක කිරීමට කටයුතු සංවිධානය කිරීම.
* අලුතින් පාසල් 105ක බාලදක්ෂ කණ්ඩායම් හා පාසල් 164ක බාලදක්ෂිකා කණ්ඩායම් ඇති කිරීම.
* 2014 දැයට කිරුළට සමගාමීව වයඹ හා සබරගමු පළාත් පාසල් තුළ බාලදක්ෂ හා බාලදක්ෂිකා සංගම් ස්ථාපනය කිරීම
* පාරිසරික ව්‍යාපෘතිය ( Environmental Star Rating Project ) මහනුවර දිස්ත්‍රික්කය තුළ හඳුනාගත් පාසල් 14ක ක්‍රියාත්මක කිරීම.
* පාසල් සෞඛ්‍යදාන ඒකක ආරම්භ කිරීමට අදාළ ව විදුහල්පතිවරුන් දැනුවත් කිරීම.
* වයඹ හා සබරගමුව පළාත් තුළ සෞඛ්‍යදාන පාසල් සංගම් 20ක් පිහිටුවීම සහ ගුරුවරුන් 250ක් පුහුණු කිරීම.
* කලාප මට්ටමින් සිසුන් 4,000ක් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.
* ශාන්ත ජෝන් කිට් ඒකක 100ක් අලුතින් ආරම්භ කිරීම.
* ඒකක භාර ගුරුභවතුන් 200ක් සඳහා ප්‍රථමාධාර පුහුණුව ලබා දීම.
* විරුජන පදනම සමග ඒකාබද්ධව විරුජන සහ විරුසිසු සම්මාන උළෙල පැවැත්වීම.
* පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සමගාමී සමස්ත ලංකා පාසල් කථික තරගාවලිය පැවැත්වීම.

### 4.12.2 පාසල් වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන්

- උපදේශන සේවාවේ නියැලෙන්නන්ගේ කාර්යසාධනය ඉහල නැංවීම සඳහා ඇගයීම් ක්‍රමයක් හඳුන්වාදීම.
- දරුවන් මුහුණදෙන ගැටලු අවම කිරීමට දෙමාපියන් 500,000 ක් දැනුවත් කිරීම.
- පාසල් උපදේශන සේවාව පිළිබඳ 6/2013 නව චක්‍ර ලේඛය නිකුත් කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන සේවාවට අදාල වෙබ් පිටුවක් http://careers.Schoolnet.lk/ නමින් නිර්මාණය කිරීම
- වතු පාසල් 720 ක මනෝසමාජීය යහපැවැත්ම සඳහා වැඩසටහන් පැවැත්වීම
- උපදේශන සේවාව ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් හා කලාප නිලධාරීන්, විදුහල්පතිවරුන් හා ගුරු උපදේශකවරුන් සඳහා පුහුණු වැඩසටහන් 24ක් හා කලාප 20ක වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් 20 ක් ක්‍රියාත්මක කිරීම

### 4.13.3 පාසල් මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

- මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව පවතින ආකල්ප වෙනස් කිරීම සඳහා සිසු සිසුවියන් 4,500කට වැඩමුළු පැවැත්වීම.
- දුම්කොළ මද්‍යසාර වල අහිසි ප්‍රතිඵල පිළිබඳව පාසල් සිසුන් 1,000ක් හා විද්‍යා පීඨ ගුරුසිසුන් 1,000ක් දැනුවත් කිරීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග එක්ව මත්ද්‍රව්‍ය නිවාරණ වැඩමුළු සිසු සිසුවියන් 10,000ක ගේ සහභාගීත්වයෙන් පැවැත්වීම.
- මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රතිපත්ති පොතක් ලෙස සම්පාදනය 75% ක් අවසන් කිරීම.
- මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව නායකත්ව පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම.

### 4.12.4 සමාජ ඒකාග්‍රතා හා සාම අධ්‍යාපනය

- ශ්‍රී ලාංකික පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ගුරුවරුන්ගේ දායකත්වයෙන් අලිමංකඩ දූම්රිය ස්ථානය "සෙනෙහසක තොටුපල" නමින් ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීම.
- "දෙනුවර මිතුරෝ " ශිෂ්‍ය අත්දැකීම් හුවමාරු වැඩසටහන කෑගල්ල අධ්‍යාපන කලාපයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්100 ක් හා ගුරුවරු 20ක් ද මඩකලපුව අධ්‍යාපන කලාපයේ ශිෂ්‍යාවන් 100ක් හා ගුරුවරු 20ක ගේ සහභාගීත්වයෙන් ක්‍රියාවට නැගීම.
- "සෙනෙහසක තක්සලාව" අන්තර් වාර්ෂික මිත්‍රත්ව පාසල් වැඩසටහන යටතේ බදුල්ල බණ්ඩාරවෙල හා කල්කුඩා කලාපයන්හි පාසල් 100ක් අතර ද බදුල්ල, බණ්ඩාරවෙල, වැලිමඩ හා මඩකලපු කලාපයන්හි පාසල් 60ක් අතර ද කුරුණෑගල කුලියාපිටිය හා මඩු මන්නාරම කලාපයන්හි පාසල් 40ක් අතර ද සබඳතා ගොඩනැගීමේ වැඩසටහන් 200ක් පැවැත්වීම.

- 2013 සැප්තැම්බර් 23 සැම පාසලකම ජාත්‍යන්තර සාම දිනය සැමරීමේ කටයුතු සංවිධානය කිරීම.
- සමාජ ඒකාග්‍රතා හා සාම අධ්‍යාපනය පිළිබඳ පළාත් කමිටු 09ක්, කලාප කමිටු 80ක් හා පාසල් සංහිඳියා කමිටු 200ක් පිහිටුවීම.
- බස්නාහිර හා සබරගමුව පළාත් හි පළාත් හා කළාප සම්බන්ධීකරණ කමිටු නිලධාරීන් 60 දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.






## 4.13 සෞන්දර්ය කුසලතා ඔප්නැංවීම

සිසු දරු දැරියන්ගේ සෞන්දර්ය කුසලතා ඔප් නැංවීම සඳහා විෂයානුබද්ධ වැඩසටහන් මෙන් ම විෂය සමගාමී වැඩසටහන් පාසල් මට්ටමින් මෙන් ම පළාත් හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක වේ. මෙම වසරේ ජාතික මට්ටමේ සිදුකරන ලද වැඩසටහන්වල ප්‍රගතිය පහත දැක්වේ

- චිත්‍ර කලා, නැටුම්, පෙරදිග සංගීත, බටහිර සංගීත, නාට්‍ය හා රංගකලා යන විෂය ක්ෂේත්‍රයන්හි සමස්ත ලංකා තරඟ පවත්වා සිසු කුසලතා ඇගයීම.
- විෂයමාලා වෙනස්වීම අනුව ගුරුභවතුන් දිශාභිමුඛ කිරීම හා නවක ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය සඳහා චිත්‍ර කලාව සඳහා 100ක්, සංගීතය සඳහා 190ක්, රංග කලාව සඳහා 75ක් හා බටහිර සංගීතය සඳහා 45ක් ලෙස ගුරුභවතුන් 410ක් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- බටහිර වාද්‍ය භාණ්ඩ විධිමත්ව වාදනය කිරීම සඳහා බස්නාහිර හා දකුණ සම්පත් මධ්‍යස්ථාන 2හි ඉගෙන ගන්නා සිසුන් 250ක් පුහුණු කිරීම.
- පාසල් 150ක් සඳහා සෞන්දර්ය උපකරණ මිලදී ගෙන ලබාදීම.
- ඇසල මහා සිසු පෙරහැර තෙවන වරටත් සිසු සිසුවියන් 15,000 කගේ සහභාගිත්වයෙන් පැවැත්වීම.
- පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව වෙනුවෙන් සාමාජික රටවල් 53 හි සංස්කෘතිකාංග නිරූපණය කරමින් සංදර්ශනයක් පැවැත්වීම.





# 5. අධ්‍යාපන වෘත්තීය සේවාවන් බලගැන්වීම

## 5.1 ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම

**5.1.1.වගුව ගුරු සේවය සඳහා 2013 වර්ෂයේ බඳවා ගැනීම මාධ්‍ය අනුව**

| ගුරු වර්ගය | සිංහල මාධ්‍යය | | දෙමළ මාධ්‍යය | | ඉංග්‍රීසි මාධ්‍යය | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | ජාතික පාසල් | පළාත් සභා පාසල් | ජාතික පාසල් | පළාත් සභා පාසල් | ජාතික පාසල් | පළාත් සභා පාසල් | |
| විද්‍යාපීඨ | 798 | 1,067 | 305 | 630 | 92 | 115 | 3,007 |
| උපාධිධාරීන් | 396 | - | 242 | - | 210 | - | 848 |
| අධ්‍යාපනවේදී උපාධිධාරීන් | - | 103 | - | - | - | - | 103 |
| | **1194** | **1170** | **547** | **630** | **302** | **115** | **3,958** |

**5.1.2. වගුව ජාතික පාසල් සඳහා උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම විෂයයන් අනුව - 2013**

| විෂයය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
|---|---|---|---|
| ඉංග්‍රීසි | - | - | 36 |
| භූගෝල විද්‍යාව | 22 | 17 | 20 |
| ඉතිහාසය | 40 | 13 | - |
| තර්ක ශාස්ත්‍රය | 31 | 20 | - |
| චිත්‍ර | 15 | 09 | - |
| නාට්‍ය හා රංග කලාව | 23 | 03 | - |
| ගෘහ ආර්ථික විද්‍යාව | 02 | - | - |
| තොරතුරු තාක්ෂණ | 14 | 15 | 29 |
| ආර්ථික විද්‍යාව | 30 | 15 | 08 |
| ව්‍යාපාර අධ්‍යයනය | 36 | 06 | 20 |
| ගණකාධිකරනය | 37 | 18 | 25 |
| භෞතික විද්‍යාව | 56 | 30 | 13 |
| රසායන විද්‍යාව | 28 | 34 | 21 |
| ජීව විද්‍යාව | 09 | 15 | 24 |
| සංයුක්ත ගණිතය | 11 | 25 | 14 |
| කෘෂි විද්‍යාව | 42 | 22 | - |
| | **396** | **242** | **210** |

**5.1.3. වගුව ශික්ෂණ විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරී ගුරුවරුන් බඳවා ගැනීම විෂයයන් අනුව - 2013**

| විෂයය | ජාතික පාසල් | | | පළාත් සභා පාසල් | | |
|---|---|---|---|---|---|---|
| | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| ප්‍රාථමික | 94 | 51 | - | 111 | 99 | |
| විද්‍යාව | 59 | 47 | 36 | 71 | 50 | 72 |
| ගණිතය | 91 | 28 | 56 | 42 | 48 | 43 |
| ශාරීරික අධ්‍යාපනය | 44 | 13 | | 82 | 04 | |
| තාක්ෂණ විෂයයන් | 64 | 11 | | 72 | 56 | |
| ඉංග්‍රීසි | 161 | 20 | | 280 | 38 | |
| බුද්ධාගම | 90 | - | | 85 | - | |
| කතෝලික ක්‍රිස්තියානි | 14 | 03 | | 45 | 25 | |
| ඉස්ලාම් | - | 15 | | - | 05 | |
| හින්දු | - | 05 | | - | 17 | |
| විශේෂ අධ්‍යාපනය | 31 | 11 | | 55 | 33 | |
| සෞන්දර්ය | 60 | 25 | | 66 | 134 | |
| තොරතුරු තාක්ෂණය | 35 | 11 | | 128 | 35 | |
| දෙවන බස | 11 | 27 | | 16 | 18 | |
| සමාජ විද්‍යාව | 44 | 19 | | 14 | 36 | |
| දෙමළ භාෂාව | - | 19 | | - | 32 | |
| | **798** | **305** | **92** | **1,067** | **630** | **115** |

## 5.2 ගුරු අධ්‍යාපනය සහ ගුරු සංවර්ධනය

### 5.2.1 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

- 2013 වර්ෂයේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හරහා පූර්වසේවා ගුරු අධ්‍යාපනය ලබා දීම සඳහා සිංහල මාධ්‍ය 1,465ක් දෙමළ මාධ්‍ය 1,075ක් ඉංග්‍රීසි මාධ්‍ය 920ක් වශයෙන් ගුරු සිසුන් 3,460ක් බඳවා ගැනීම.
- පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හරහා මාණ්ඩලික නිලධාරීන් 96 දෙනෙකුගේ ඉංග්‍රීසි දැනුම සංවර්ධනය කිරීම.



- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලවල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීම හා එහි උසස්වීම් ලබා දීම.
- ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවැත්වීම.
- ඉන්දියානු ආධාර යටතේ ඉදිකිරීමට නියමිත භාෂා විද්‍යාගාර 8ක් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වෙත ලබා දෙන බැවින් ඒ සඳහා ගොඩනැගිලි සකස් කිරීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම.

### 5.2.2 ගුරු විද්‍යාල

- 2013/2014 අධ්‍යයන වර්ෂයට අදාළව නුපුහුණු ගුරුවරුන් 200 ක් ගුරු විද්‍යාල සඳහා බඳවා ගැනීම.
- ගුරු විද්‍යාල සහ විද්‍යාපීඨවල කථිකාචාර්යවරුන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

### 5.2.3 ගුරු මධ්‍යස්ථාන

- එක් ගුරු මධ්‍යස්ථානයකට රු.50,000 බැගින් ගුරු වෘත්තීය සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කිරීම.

### 5.2.4 පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන

ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය සාධකයන් වන ගුරු සංවර්ධනය අඛණ්ඩව සිදු කිරීම සඳහා ඒ ඒ පාසලට උචිත හා ගැලපෙන අයුරින් වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කිරීමට පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන හඳුන්වාදෙන ලදී.

- පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන පිළිබඳ චක්‍රලේඛය පාසල් කලාප පළාත් හා අධ්‍යාපන ආයතන සඳහා බෙදාදීම.
- පාසල් පාදක ගුරු සංවර්ධන පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් මුද්‍රණය කර සියළුම පාසල් සඳහා ලබාදීම.

### 5.2.5 ළමා මිතුරු පාසල් ප්‍රවේශය පිළිබඳ ගුරු පුහුණුව

- ළමා මිතුරු පාසල් ප්‍රවේශය පිළිබඳ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ (18), ගුරු විද්‍යාල (8) හා ගුරු මධ්‍යස්ථානයන්හි පීඨාධිපතිවරු, ගුරු විදුහල් විදුහල්පතිවරු හා ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන් ඇතුළු කථිකාචාර්යවරු දැනුවත් කිරීම හා ගුරු සිසුන් සඳහා එම වැඩසටහන් විද්‍යාපීඨවල ක්‍රියාත්මක කිරීම.

### 5.2.6 ගුරු අවශ්‍යතා ගණනය කිරීමට නව චක්‍රලේඛයක්

- වත්මන් අවශ්‍යතාවලට ගැලපෙන පරිදි ගුරුවරුන් බඳවා ගැනීම සඳහා නව චක්‍රලේඛයක් සකස්කොට පළාත්වල එකඟතාවය ලබාගැනීමට යැවීම.

**ගුරු ප්‍රතිභා ප්‍රභා සම්මාන පිරිනැමීම.**

ගුරු භවතුන්ගේ උසස් කාර්යසාධනය අභිප්‍රේරණය කරමින් පිරිවෙන් ගුරු භවතුන් ද ඇතුළුව තෝරාගත් ගුරුභවතුන් හා විදුහල්පතිවරුන් 1,200ක් සඳහා සම්මාන පිරි නමන ලදී.



## 5.3 ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීම

5.3 වගුව : ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීම - 2013

| සේවය හා ශ්‍රේණිය | නිශ්චිත දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව | | බඳවා ගත් පදනම | උසස් කළ සංඛ්‍යාව | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| | දිනය | පුරප්පාඩු සංඛ්‍යාව | | | |
| I පන්තිය | 2008.07.01 | 988 | ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත 40% | 395 | |
| 2 - II පන්තිය | පුරප්පාඩු අනුව | | අමාත්‍ය මණ්ඩල තීරණයන් මත අධිසේවක පදනම මත | 75 | අධිසේවක පදනම මත බඳවාගෙන ඇති බැවින් නිත්‍ය සේවයට අයත් නොවේ |
| III පන්තිය | | | | 21 | |

## 5.4 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීම

5.4 වගුව : ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීම - 2013

| සේවය හා ශ්‍රේණිය | නිශ්චිත දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව | | බඳවා ගත් පදනම | උසස් කළ සංඛ්‍යාව | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| | දිනය | පුරප්පාඩු සංඛ්‍යාව | | | |
| I පන්තිය | 2013.07.01 | 15 | ශ්‍රේණි උසස් කිරීම් | - | 2006 - 2013.07.01 දක්වා පුරප්පාඩු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා රා.සේ.කො. වෙත ඉදිරිපත් කර ඇත. |
| 2 - I පන්තිය | 2012.01.01 | 38 | ශ්‍රේණි උසස් කිරීම් | 19 | 2013 ජූලි මස උසස්වීම් ලබා දෙන ලදී. |
| 2 - II පන්තිය | 2012.07.01 | 183 | ශ්‍රේණි උසස් කිරීම් | 154 | 2013.11.25 උසස්වීම් ලබා දෙන ලදී |
| III පන්තිය | 2012.12.31 | 272 | - | - | බඳවා ගැනීම සඳහා ව්‍යුහගත සහ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වේ. |

## 5.5 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම

5.5 වගුව : ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම - 2013

| සේවය හා ශ්‍රේණිය | නිශ්චිත දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව | | බඳවා ගත් පදනම | උසස් කළ සංඛ්‍යාව | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| | දිනය | පුරප්පාඩු සංඛ්‍යාව | | | |
| III පන්තිය | 2010.06.01 | 185 | සීමිත | 158 | |
| | 2010.06.01 | 103 | විවෘත | 13 | 2 කණ්ඩායම පළමු කණ්ඩායම 2012 බඳවා ගෙන ඇත. |
| | 2010.06.01 | 122 | ජ්‍යෙෂ්ඨතා කුසලතා | 13 | |
| I පන්තිය | 2011.06.01 | 08 | සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල | 08 | |
| | 2012.01.01 | 16 | | 16 | |

## 5.6 විවිධ වෘත්තීය සංවර්ධන වැඩසටහන්

- රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ පුහුණුවීම් සඳහා නිලධාරීන් 60 දෙනෙකු යොමු කිරීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුහුණුවීම් සඳහා මාණ්ඩලික නිලධාරීන් 18 දෙනෙකු හා මාණ්ඩලික නොවන නිලධාරීන් 154 දෙනෙකු සහභාගී කරවීම.
- නිලධාරීන් 40 දෙනෙකු සඳහා දේශීය පාඨමාලාවන් හැදෑරීමට මූල්‍ය සහාය ලබා දීම.
- අමාත්‍යාංශයට බඳවා ගත් අභ්‍යාසලාභී උපාධිධාරීන් 112 දෙනකු සඳහා දෙදින පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
- අමාත්‍යාංශයේ නිලධාරීන් 60 දෙනෙකු සඳහා දෙමළ භාෂා ප්‍රවීනතා III මට්ටම හා නිලධාරීන් 60 දෙනෙකු සඳහා දෙමළ භාෂා ප්‍රවීණතාවය II මට්ටම ලබාගැනීමට අවස්ථාව සැලසීම.
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට විවෘත තරඟ විභාගයෙන් බඳවා ගත් නිලධාරීන්ට මෙතෙක් ලබා දුන් කෙටි කාලීන පුහුණුව වෙනුවට දිශානුගත කිරීමට පෙර මෙවර බඳවා ගත් නිලධාරීන් 40 දෙනෙකු සඳහා ජාතික අධ්‍යාපන ආයතනය මගින් වසරක පශ්චාත් උපාධි අධ්‍යාපන පරිපාලන ඩිප්ලෝමාව හැදෑරීමට අවස්ථාව සැලසීම.
- විවෘත තරඟ විභාගයෙන් 2013.05.24 අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගත් නිලධාරීන් 12 දෙනෙකු දිශානුගත වැඩසටහනට යොමු කිරීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට 2010, 2012 සීමිත තරඟ විභාගය යටතේ බඳවාගත් නිලධාරීන් 124 දෙනෙකු ධාරිතා සංවර්ධන වැඩසටහනට යොමු කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය තුළ සේවය කරන අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියේ නිලධාරීන් 33 දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළුවක් පැවැත්වීම.
- ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලැබූ සිංහල හා දෙමළ මාධ්‍ය විදුහල්පතිවරුන් 236 ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළුවක් පැවැත්වීම.
- කලාප හා කොට්ඨාස නිලධාරීන් 31 ක් සඳහා අධ්‍යාපන කාර්යාල කාර්යයන් කාර්යක්ෂම හා ඵලදායී කිරීමට තෙදින වැඩමුළුවක් පැවැත්වීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය කරන විමර්ශණ නිලධාරීන් 25 දෙනෙකු සඳහා තෙදින අධ්‍යාපන පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
- අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් 27 ක් විදේශ අධ්‍යාපන වැඩසටහන් සඳහා යොමු කිරීම.

## 5.7 උපදෙස් සංග්‍රහ හා චක්‍රලේඛ නිකුත් කිරීම

- අධ්‍යාපන අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සකස් කිරීම.
- අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගෙන ඊට අදාළ කාර්යයන් කවරේ ද යන්න සමඟ වාර්තාවක් සකස් කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම.
- ගුරු, විදුහල්පති හා අධ්‍යාපන පරිපාලන සේවාවන්ට අදාළ නිලධාරීන්ගේ අධ්‍යයන නිවාඩු සම්බන්ධයෙන් චක්‍රලේඛ වල මෙතෙක් පැවති අඩුපාඩු මග හරිමින් 26/2013 නව අධ්‍යයන නිවාඩු චක්‍රලේඛය නිකුත් කිරීම.

## 5.8 විදේශ පුහුණු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගීත්වය

**5.8.1.** වගුව: විදේශ පුහුණු, සම්මන්ත්‍රන තරග සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව

| විෂය ක්ෂේත්‍රය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| ධාරිතා සංවර්ධන වැඩසටහන් | 88 |
| සැලසුම්කරණය, කළමනාකරණය, නියාමන හා තොරතුරු පද්ධති | 11 |
| පාසල් පහසුකම් සංවර්ධනය | 14 |
| තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය | 41 |
| සෞන්දර්ය අධ්‍යාපනය | 07 |
| ළමා අයිතිවාසිකම් | 04 |
| විද්‍යා හා ගණිත අධ්‍යාපනය | 15 |
| ගුරු අධ්‍යාපනය | 10 |
| ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය | 102 |
| මානව ශාස්ත්‍ර විෂයයන් | 10 |
| වෙනත් විවිධ ක්ෂේත්‍රයන් | 30 |
| එකතුව | 344 |

රජයේ මූල්‍ය අනුග්‍රහය සහ විවිධ ජාත්‍යන්තර සංවර්ධන ආයතනවල අනුග්‍රහය යටතේ විවිධ විෂය ක්ෂේත්‍රයන් සඳහා පැවති විදෙස් සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් සහ ක්ෂේත්‍ර අධ්‍යාපන චාරිකා සඳහා ද ශිෂ්‍යයින් භාරව විවිධ තරගාවලීන් සඳහා ද 2013 වසරේ විදෙස් ගත වූ නිලධාරීන් සංඛ්‍යාව මෙහි දැක්වේ. මෙහි නිලධාරීන් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ඊට අනුබද්ධ ආයතනවල නිලධාරීන්, පළාත් අධ්‍යාපන ක්ෂේත්‍ර නිලධාරීන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන් ඇතුළත් වේ.

# 6. සැලසුම්කරණය, කළමනාකරණය හා නියාමනය සවිබල ගැන්වීම

## 6.1 පළාත් සහා සමග සවිමත් සම්බන්ධීකරණයක්

- අධ්‍යාපන ඇමතිතුමා, පළාත් අධ්‍යාපන ඇමතිවරුන් සමඟ පවත්වනු ලබන සාකච්ඡාව

  ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් හා සමගාමීව පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහාත් ක්ෂේත්‍රයේ පවතින ගැටලු සාකච්ඡා කොට ඊට අදාළ විසඳුම් පිළිබඳව ඉහළ මට්ටමින් තීරණ ගැනීම සඳහාත් ගරු අධ්‍යාපන ඇමතිතුමා හා ගරු පළාත් අධ්‍යාපන අමාත්‍යවරුන් අතර රැස්වීම් සංවිධානය කෙරේ. 2013 වර්ෂයේ මෙවැනි රැස්වීම් වාර 3ක් පවත්වන ලදී.

- අධ්‍යාපන සංවර්ධන කමිටු රැස්වීම්

  සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතන වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමු වී අධ්‍යාපන සංවර්ධනයට අදාල සියලු කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අධ්‍යාපන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අධ්‍යාපන සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වේ. 2013 වර්ෂයේ රැස්වීම් වාර 03ක් පවත්වන ලදී.

- වීඩියෝ සම්මන්ත්‍රණ හරහා පළාත් අධ්‍යාපන බලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීම.

  නිලධාරීන් නිතර අමාත්‍යාංශයට කැඳවීම වෙනුවට වීඩියෝ සම්මන්ත්‍රණ හරහා සාකච්ඡා පැවැත්වීමට අවශ්‍ය සියලු තාක්ෂණික පහසුකම් පළාත්වලට සපයා ඇත. ඒ අනුව 2013 වර්ෂයේ ගරු ඇමතිතුමා හා අධ්‍යාපන ලේකම් සහභාගී වූ රැස්වීම් 6ක් වූ අතර වෙනත් විෂයභාර නිලධාරීන් ද මෙම පහසුකම ප්‍රයෝජනයට ගනු ලැබිණි.

- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම

  අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය මෙන් ම පරිපාලන කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීම සඳහා මාස කිහිපයකට වරක් පැවැත්වේ.

- ජාතික පාසල් විදුහල්පති රැස්වීම

  ජාතික පාසල් 324 විදුහල්පතිවරුන් වෙත ජාතික පාසල් සංවර්ධනය හා පරිපාලනයට අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා මෙම රැස්වීම් කාලානුරූපව පැවැත්වේ.

- පළාත්බද සාකච්ඡා

  අධ්‍යාපන ලේකම් ඇතුලු නිලධාරීන් පළාත් වෙත ගොස් එක් එක් පළාතට සුවිශේෂී කරුණු සාකච්ඡා කිරීම මෙහි අරමුණයි. 2013 වර්ෂයේ ඌව පළාත සමඟ මෙම සාකච්ඡා වාරයක් පවත්වන ලදී.

- මහජන පැමිණිලි කඩිනමින් විසඳීම

  1988 ක්ෂණික දුරකථන අංකය හරහා ලැබුණ පැමිණිලි 3,381න් 2,064ක් සඳහා විසඳුම් සෘජුව ම ලබා දීමට ද, ඉතිරි පැමිණිලි පළාත්වලට යොමු කිරීමට ද කටයුතු කරන ලදී.

## 6.2 පෞද්ගලික පාසල් කටයුතු විධිමත් කිරීම

රජයේ අනුමත ආධාර ලබන හා ආධාර නොලබන පාසල් 79 ක ආයතනික කටයුතු සහ අවශ්‍යතා මත පැන නැගෙන අධීක්ෂණ කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශය සිදු කරයි.

### 2013 වර්ෂයේ ප්‍රගතිය


- පෞද්ගලික පාසල් කළමනාකරණය සංවර්ධනය
  * පෞද්ගලික පාසල් ගුරු සේවයට අයත් ගුරුවරුන් සඳහා උපරිමයේ රැඳී සිටීමේ වාසි ලබාදීමට අදාළ 21/2013 චක්‍රලේඛය නිකුත් කිරීම.
  * රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ජාත්‍යන්තර විෂයමාලාව ඉගැන්වීම නීත්‍යානුකූල නොවන බව දන්වා උපදෙස් යැවීම.
- පැන නැගෙන අවශ්‍යතා මත තෝරාගත් පෞද්ගලික පාසල් අධීක්ෂණය කිරීම.
  * මුල්ලේරියාව එන්සෙෆ් බෞද්ධ විද්‍යාලය, මීගමුව ආරේ මරියා කන්‍යාරාමය, බෝලවලාන ආරේ මරියා කන්‍යාරාමය හා තෙල්දෙණිය නාලන්දා විද්‍යාලය අධීක්ෂණය කිරීම.

## 6.3 අධ්‍යාපන සංවර්ධනය සඳහා දායකවන ආයතන බලගැන්වීම

- "අධ්‍යාපන සැලසුම්කරණය පිළිබඳ උපදෙස් සංග්‍රහය" සකස් කර බෙදාහැරීම.

  පාසල් පද්ධතියේ සහ අනෙකුත් අධ්‍යාපන ආයතනවල සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම ඉහළ නැංවීම සඳහා එම ආයතන වලට බෙදාහැරීමට උපදෙස් සංග්‍රහය සකස්කොට මුද්‍රණයට භාරදීම.

- "පාසල් පාදක ගුණාත්මක ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොත" සකස් කර බෙදාහැරීම.




  ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන්ට අනුකූලව පාසලේ අධ්‍යාපන ප්‍රතිලාභීන්ගේ අධ්‍යාපනික අපේක්ෂාවන් සහ අභිමතාර්ථයන් සපුරාලන පරිදි පාසල සංවර්ධනය කිරීම අරමුණු කරගෙන සකස්කර ඇති මෙම චක්‍රලේඛය පාසල්වලට බෙදාහැරීමට කටයුතු කරන ලදී.

- "ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල ඉගෙනුම් පරිසරය වැඩි දියුණු කිරීමට අදාල මාර්ගෝපදේශ සංග්‍රහය" පාසල් වෙත බෙදාහැරීම.

  උපදෙස් සංග්‍රහය පිළියෙලකොට මුද්‍රණයට භාරදීම.

- ලෝක බැංකු (TSEP) හා AUS AID වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල උපදෙස් සංග්‍රහය මුද්‍රණය කර පළාත්වලට බෙදා දීම.

  උපදෙස් සංග්‍රහය පිළියෙලකොට අදාළ පාර්ශවයන් වෙත බෙදාහැරීම.

- කලාප අධ්‍යාපන කාර්යාල සතු වගකීම් හා කාර්යභාරයන් නැමති අත්පොත මුද්‍රණය කර සියලු ආයතන වෙත බෙදා දීම

  අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය හා කාර්යක්ෂම පරිපාලනය තහවුරු කිරීම සඳහා පාසලට සමීපතම අධ්‍යාපන ආයතනය වන කොට්ඨාස අධ්‍යාපන කාර්යාල හා කලාප අධ්‍යාපන කාර්යාල බලගැන්වීමේ අරමුණින් මෙම අත්පොත මුද්‍රණය කර සියලු ආයතන වෙත බෙදා දීම.

- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් එළි දැක්වීම.

  විදේශීය නියෝජිතයින් සහ සංවර්ධන පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහා සුදුසු පරිදි මෙම ප්‍රකාශනය සකස්කොට අවශ්‍යතා අනුව බෙදාහැරීම.

## 6.4 පාසල් සහ අධ්‍යාපන ආයතන ඇගයීම් ක්‍රියාවලිය

ජාතික ප්‍රමිතීන්ට අනුව සකස්කර ඇති ගුණාත්මක දර්ශක ඇසුරෙන් පාසල් ස්වයං ඇගයීම් ක්‍රියාවලිය සහ පාසල් බාහිර ඇගයීම් ක්‍රියාවලිය තුළින් සෑම පාසලකට ම අධ්‍යාපන ගුණාත්මක දර්ශකයක් පිළියෙලකොට පාසලෙහි වර්ධනය සඳහා සහාය වීම මෙම වැඩසටහනෙහි අරමුණයි.

- පාසල් ඇගයීම් ක්‍රියාවලිය සඳහා කලාප මට්ටමින් පුහුණු සංචිතයක් පිහිටුවීම.

  කලාපයකට නිලධාරීන් දෙදෙනෙකු බැගින් පළාත් 7ට නිලධාරීන් පුහුණුකර අවසන් කර ඇගයීම් උපකරණවල යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා කුළියාපිටිය කලාපයේ නියාමක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- දැනට පාසල් ඇගයීම සඳහා භාවිතා කරන "පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය III මාර්ගෝපදේශ සංග්‍රහය සංශෝධනය කිරීම.

- පාසල් කාර්යසාධන වාර්තා සකස් කිරීම.

- පාසල් බාහිර ඇගයීම් වැඩසටහන හරහා ජාතික පාසල් 17ක් ඇගයීමට ලක් කිරීම.

.

## 6.5 ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්

- අධ්‍යාපන අමාත්‍යාංශය තුළ මෙන්ම ඊට අනුබද්ධ සියලුම ආයතනවලද පාසල් පද්ධතියේ ද ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයේ පිහිටුවන ලද ඵලදායිතා මෙහෙයුම් ඒකකය මඟින් අමාත්‍යාංශය තුළ ඵලදායිතාව ඇගයීම් වැඩසටහනක් ක්‍රියාත්මක කොට ත්‍යාග ප්‍රදානය කිරීම.

- අධ්‍යාපන පද්ධතිය තුළ ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කරවීම සඳහා "අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඵලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ප්‍රවේශයක්" නමින් මාර්ගෝපදේශ සංග්‍රහයක් නිකුත් කිරීම.

## 6.6 අධ්‍යාපන පර්යේෂණ ප්‍රවේශයන්

### 6.6.1. පර්යේෂණ ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීම

- පර්යේෂණ අනාවරණ ප්‍රචාරණය කිරීම
  - * කුඩා පාසල් සංවර්ධනය කිරීම පිළිබඳව ජාතික අධ්‍යාපන ආයතනය විසින් පර්යේෂණාත්මක ප්‍රවේශයන් ඇසුරින් සකස් කරන ලද සම්පත් කට්ටලය කුඩා පාසල් විදුහල්පතිවරුන් 289 දෙනෙකු වෙත බෙදා දීම.
- පර්යේෂණ සඟරා එළි දැක්වීම
  - * 'අධ්‍යාපන පර්යාවලෝක' සඟරාවේ 2වන කලාපයේ 1 හා 2 වෙළුම් එළි දැක්වීම.
- පර්යේෂණවලට අදාළ පුහුණු කිරීම්
  - * පර්යේෂණ ගැටළු හඳුනා ගැනීමට සහභාගී වීම සඳහා ප්‍රාථමික ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් 72ක් සඳහා වාර්තා ලිවීම පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
  - * තෝරාගත් නිළධාරීන් 9 දෙනෙකුට SPSS සම්බන්ධ පුහුණුවක් ලබා දීම.
- පර්යේෂණ ප්‍රදාන ලබාදීම
  - * ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 100 ක් තෝරාගෙන ක්‍රියාමූලික පර්යේෂණ සම්බන්ධ පුහුණු කර පරියේෂණ ප්‍රදානයන් පිරිනැමීම.

### 6.6.2. ශිෂ්‍ය ඉගෙනුම් ප්‍රතිඵලයන් පිළිබඳ ජාතික තක්සේරුකරණ වැඩසටහන

8වන ශ්‍රේණියේ හා 4 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන දරුවන්ගේ විෂය ප්‍රාප්ති මට්ටම මැනීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ NEREC ආයතනය සමග එක්ව පවත්වනු ලබන ජාතික තක්සේරු කරන වැඩසටහන සම්බන්ධයෙන් 2013 වසරේ ඉටුකළ කාර්ය භාරය පහත දැක්වේ.

- 8 වන ශ්‍රේණියේ සිසුන්ගේ ප්‍රාප්ති මට්ටම මැනෙන ජාතික ඇගයීම - 2012 සම්පූර්ණ කොට ප්‍රථිපල එළි දැක්වීම.
- 4වන ශ්‍රේණියේ සිසුන්ගේ ප්‍රාප්ති මට්ටම මැනෙන ඇගයීම සම්බන්ධ මූලික කටයුතු ආරම්භ කිරීම.

## 6.7 අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය

පාසල් සංගණන දත්ත ඇතුළත් කොට සකස් කරන අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය නවීකරණය කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ සහාය ලබා ගෙන 2013 වසරේ පහත සඳහන් කාර්යයන් නිම කරන ලදී.

- පළමු අදියර ලෙස ගුරු තොරතුරු පද්ධතිය සකස් කර නිරවද්‍යතාවය පිරික්සීම සඳහා ගුරුවරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු අනුව පළාත් මට්ටමින් දත්ත පරීක්ෂා කිරීම ආරම්භ කිරීම.
- තොරතුරු පද්ධතියේ දෙවන අදියර සංවර්ධනය කිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට මොරටුව විශ්ව විද්‍යාලය සමඟ අත්සන් තැබීම.

## 6.8 දිගු කාලීන ව්‍යුහගත ගැටලු විසඳීම සඳහා විශේෂිත ක්‍රියාමාර්ග

අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන දිගුකාලීන ගැටලු විසඳීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සහ ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සියලු ප්‍රධාන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් විශේෂ සාකච්ඡාවක් පවත්වා පහත සඳහන් කමිටු පත් කරන ලදී.

ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරී මහින්ද මඩිහහේවා මහතාගේ සභාපතීත්වයෙන් යුත් කමිටුව : ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සහ ශ්‍රී ලංකා ගුරු සේවය යන අධ්‍යාපන සේවාවන්හි පවතින ගැටලු විසඳීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය.

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය අබේරත්න බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් යුත් කමිටුව : රාජ්‍ය හා පෞද්ගලික ක්ෂේත්‍රයේ නිලධාරීන්, විද්වතුන්ගේ නියෝජනය සහිත මෙම කමිටුව විෂයමාලාව හා විභාග පිළිබඳ ව විමර්ශනය කොට යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය.



# 7. මූල්‍ය ආයෝජනය සහ වියදම්

## 7.1 පුනරාවර්තන වියදම්

2013 මුදල් වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් ප්‍රධාන වැඩසටහන් නවයක් යටතේ දරණ ලදී. එම වැඩසටහන් යටතේ ඇස්තමේන්තුගත මුදල, පරිපූරක ඇස්තමේන්තු මත සංශෝධිත ප්‍රතිපාදන හා සමස්ත වියදම පහත වගුවෙන් දැක්වේ.

7.1. වගුව : **අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම්**

| වැඩසටහන | | **2013 ඇස්තමේන්තුව** රුපියල් | ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් | **2013.12.31** ට වියදම රුපියල් |
|---|---|---|---|---|
| 126-1-1 | අමාත්‍ය කාර්යාලය | 28,160,000.00 | 30,621,000.00 | 27,123,632.68 |
| 126-1-2 | පරිපාලන සහ ආයතනික සේවා | 498,940,000.00 | 523,489,000.00 | 508,531,109.94 |
| 126-2-3 | ප්‍රාථමික අධ්‍යාපනය | 3,054,300,000.00 | 3,188,510,000.00 | 3,184,910,298.54 |
| 126-2-4 | ද්විතියික අධ්‍යාපනය | 12,244,850,000.00 | 12,529,377,000.00 | 12,763,140,367.57 |
| 126-2-5 | විශේෂ අධ්‍යාපනය | 3,205,523,000.00 | 3,444,328,000.00 | 3,315,006,622.16 |
| 126-2-6 | අධ්‍යාපනය සඳහා ප්‍රදාන සහ ආධාර | 7,842,677,000.00 | 7,638,872,000.00 | 7,529,088,800.86 |
| 126-2-7 | අධ්‍යාපන සැලසුම්, නියාමනය, පර්යේෂණ හා සංවර්ධනය | 28,580,000.00 | 28,580,000.00 | 18,245,390.81 |
| 126-2-8 –1 | ගුරු සංවර්ධනය | 227,445,000.00 | 230,960,800.00 | 201,194,332.05 |
| 126-2-8 –11 | විද්‍යාපීඨ | 995,400,000.00 | 1,002,900,000.00 | 817,802,706.93 |
| 126-2-9 | ආයතනික වැඩිදියුණු කිරීම | 325,000,000.00 | 325,000,000.00 | 289,222,837.00 |
| | **මුළු එකතුව** | **28,450,875,000.00** | **28,942,637,800.00** | **28,654,266,098.54** |

ඒ අනුව 2013 වර්ෂයේ සමස්ත පුනරාවර්තන වියදම රු.මිලියන 28,654 වූ අතර එය ප්‍රතිපාදිත මුදලට සාපේක්ෂව 99% ප්‍රතිශතයක් දැක්විය.

## 7.2 ප්‍රාග්ධන වියදම්

2013 වර්ෂයේ ප්‍රධාන වැඩසටහන් අටක් යටතේ ප්‍රාග්ධන වියදම් දරණ ලද අතර ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 7,191.97ක් විය. මෙම වර්ෂයේ අධ්‍යාපන සේවා අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු එම අමාත්‍යාංශයට පැවරුණු විෂය පථය අනුව අමාත්‍ය කාර්යාලය, ප්‍රාථමික අධ්‍යාපනය, ද්විතියික අධ්‍යාපනය හා ගුණාත්මකබව වැඩිදියුණුව සඳහා ආයතනික සහාය යන වැඩසටහන් යටතේ වූ විෂය ප්‍රතිපාදන කිහිපයක් පහත සඳහන් පරිදි එම අමාත්‍යාංශයට මාරු කරන ලදී.


**7.2.1 වගුව : අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම්**

| වැඩසටහන | | 2013 ඇස්තමේන්තුව රුපියල් | අධ්‍යාපන සේවා අමාත්‍යාංශයට මාරු කළ ප්‍රතිපාදන රුපියල් | ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් | 2013.12.31 දිනට වියදම රුපියල් |
|---|---|---|---|---|---|
| 126-1-1 | අමාත්‍ය කාර්යාලය | 8,000,000.00 | 3,600,000.00 | 31,135,222.00 | 18,737,431.28 |
| 126-1-2 | පරිපාලන සහ ආයතනික සේවා | 102,550,000.00 | - | 109,014,778.00 | 73,376,297.53 |
| 126-2-3 | ප්‍රාථමික අධ්‍යාපනය | 238,900,000.00 | 52,000,000.00 | 332,900,000.00 | 206,234,056.47 |
| 126-2-4 | ද්විතියික අධ්‍යාපනය | 3,781,000,000.00 | 176,000,000.00 | 5,969,000,000.00 | 4,577,827,822.16 |
| 126-2-5 | විශේෂ අධ්‍යාපනය | 73,700,000.00 | - | 73,700,000.00 | 16,361,295.03 |
| 126-2-8 | ගුරු සංවර්ධනය | 123,900,000.00 | - | 199,900,000.00 | 105,792,517.90 |
| 126-2-9 | ආයතනික වැඩිදියුණු කිරීම් | 77,000,000.00 | 12,000,000.00 | 77,000,000.00 | 21,857,735.52 |
| 126-2-10 | අධ්‍යාපනය සඳහා විදේශ ආධාර | 2,786,925,000.00 | - | 3,104,351,000.00 | 1,727,515,684.29 |
| | මුළු එකතුව | 7,191,975,000.00 | 243,600,000.00 | 9,897,001,000.00 | 6,747,702,840.18 |

## 7.3 සමස්ත අධ්‍යාපන වියදම

පසුගිය වර්ෂ කිහිපය තුල අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් වූ මුදල සහ පළාත් සභා හරහා අධ්‍යාපනයට වෙන් වූ මුදල සමස්ත අධ්‍යාපන වියදම ලෙස පහත සටහනෙන් දක්වා ඇත.

**7.3.1 ප්‍රස්තාරය : ජාතික අමාත්‍යාංශය හා පළාත් සභා විසින් දරන ලද සමස්ත අධ්‍යාපන වියදම් 2005 - 2012**



## 7.4 ඉදිකිරීම් සඳහා ආයෝජනය - 2013

| ප්‍රාග්ධන වියදම්<br>ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා | | | (රු.මි) |
|---|---|---|---|
| වැඩසටහන | ඇස්තමේන්තුව | ලද මුළු ප්‍රතිපාදන | 2013.12.31 දිනට වියදම |
| *මුළු ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව* | 498.40 | 680.95 | 422.62 |
| <u>නව ඉදිකිරීම්</u> | | | |
| *පරිපාලන සේවා* | 30.00 | 27.45 | 24.40 |
| *ප්‍රාථමික අධ්‍යාපනය* | 162.50 | 256.50 | 180.99 |
| නව ආදර්ශ ප්‍රාථමික පාසල් 4ක ගොඩනැගිලි | 25.00 | 25.00 | 10.72 |
| ප්‍රාථමික පාසල් 12ක ගොඩනැගිලි අලුත්වැඩියා හා ඉදිකිරීම් | 50.00 | 50.00 | 13.43 |
| පෝෂිත ප්‍රාථමික පාසල් වැඩිදියුණු කිරීම | 7.50 | 7.50 | - |
| ආරක්ෂක සේවා විද්‍යාල ගොඩනැගිලි | 80.00 | 174.00 | 156.84 |
| *ද්විතියික අධ්‍යාපනය* | 1,615.00 | 3,743.00 | 4,057.07 |
| ජාතික පාසල් 13ක අර්ධාවසාන ගොඩනැගිලි | 300.00 | 350.00 | 327.99 |
| ජාතික පාසල් 78ක ගොඩනැගිලි අලුත්වැඩියා හා ඉදිකිරීම් | 250.00 | 109.00 | 88.08 |
| ප්‍රාදේශිය ඉංග්‍රීසි සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිලි | 15.00 | 15.00 | 4.71 |
| උසස් ඉංග්‍රීසි අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථාන - CEELT | 10.00 | - | - |
| දැයට කිරුළ වැඩසටහන යටතේ පාසල් නවීකරණය | - | 84.00 | 53.95 |
| ලීඩ් ව්‍යාපෘතියට අයත් පාසල් 34ක ගොඩනැගිලි | 40.00 | 35.00 | 22.54 |
| මහින්දෝදය ද්විතියික පාසල් 1000 සංවර්ධන වැඩසටහන | 1,000.00 | 3,150.00 | 3,559.80 |
| *විශේෂ අධ්‍යාපනය* | 25.00 | 25.00 | 0.31 |
| විශේෂ අධ්‍යාපන ගොඩනැගිලි හා ඉදිකිරීම් | 5.00 | 5.00 | 0.31 |
| විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම | 20.00 | 20.00 | - |
| *ගුරු අධ්‍යාපන* | 38.00 | 64.00 | 41.40 |
| ගුරු විද්‍යාල 10ක අලුත්වැඩියා හා ඉදිකිරීම් | 5.00 | 5.00 | 5.00 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 18ක අලුත්වැඩියා හා ඉදිකිරීම් | 3.00 | 29.00 | 25.92 |
| දකුණු ආසියානු ගුරු සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම | 30.00 | 30.00 | 10.49 |
| *සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන වැඩසටහන* | 797.00 | 867.00 | 337.14 |
| ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව-EKSP ව්‍යාපෘතිය | 432.00 | 432.00 | 323.39 |
| ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව - TESP-පාසල් ව්‍යාපෘතිය | 250.00 | 320.00 | 13.75 |
| ශ්‍රී ලංකා රජය සහ KOICA -හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසල් ප්‍රතිසංස්කරණය | 50.00 | 50.00 | - |
| ශ්‍රී ලංකා රජය සහ KOICA -කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් ප්‍රතිසංස්කරණය | 65.00 | 65.00 | - |
| **මුළු එකතුව** | **3,165.90** | **5,663.90** | **5,063.93** |

## 7.5 ලී බඩු උපකරණ සඳහා ආයෝජනය

| ප්‍රාග්ධන වියදම්<br>ලී බඩු උපකරණ මිලදී ගැනීම් සඳහා<br>(රු.මි) | | | |
|---|---|---|---|
| වැඩසටහන | ඇස්තමේන්තුව | ලද මුළු ප්‍රතිපාදන | 2013.12.31 දිනට වියදම |
| ***මුළු ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව*** | **18.00** | **18.40** | **2.52** |
| ***ඇමති කාර්යාලය*** | **3.50** | **2.18** | **1.41** |
| ***ඉදිකිරීම් සහ පරිපාලන සේවා*** | 29.80 | 29.36 | 9.37 |
| ***ප්‍රාථමික අධ්‍යාපනය*** | **51.50** | **51.50** | **21.48** |
| ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම | | | |
| නව ආදර්ශ ප්‍රාථමික පාසල් ව්‍යාපෘතිය යටතේ | 16.00 | 16.00 | 12.93 |
| දැව භාණ්ඩ | 9.00 | 9.00 | 2.58 |
| සෞන්දර්ය උපකරණ | 9.50 | 9.50 | - |
| ගණිත විෂය සහ ප්‍රාථමික අධ්‍යාපන උපකරණ | 3.00 | 3.00 | 2.51 |
| ක්‍රීඩා උපකරණ | 7.00 | 7.00 | 2.28 |
| යන්ත්‍ර සහ කාර්යාලීය උපකරණ | 7.00 | 7.00 | 1.19 |
| ***ද්විතියික අධ්‍යාපනය*** | **1,925.00** | **1,725.00** | **176.80** |
| ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම | | | |
| දැව භාණ්ඩ | 50.00 | 50.00 | 5.50 |
| තාක්ෂණ උපකරණ | 5.00 | 5.00 | - |
| නේවාසිකාගාර උපකරණ | 12.00 | 12.00 | 3.83 |
| සෞන්දර්ය උපකරණ | 27.00 | 27.00 | 6.76 |
| ගෘහ විද්‍යා උපකරණ | 1.00 | 1.00 | - |
| කෘෂිකර්ම උපකරණ | 2.00 | 2.00 | 0.14 |
| පුස්තකාල උපකරණ | 23.00 | 23.00 | 11.91 |
| වාණිජ උපකරණ | 0.50 | 0.50 | 0.50 |
| ජාතික පාසල් සඳහා පරිගණක | 10.50 | 10.50 | 1.60 |
| පුස්තකාල පොත් | 10.00 | 10.00 | 0.27 |
| භාෂා සහ මානව ශාස්ත්‍ර උපකරණ | 1.00 | 1.00 | - |
| ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන උපකරණ | 10.00 | 10.00 | 1.91 |
| ග්ලෝබ් ව්‍යාපෘතිය යටතේ උපකරණ | 2.00 | 2.00 | - |
| ගණිත උපකරණ | 2.00 | 2.00 | 0.46 |
| තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සඳහා උපකරණ | 4.00 | 4.00 | 4.00 |
| භාෂා සහ තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය | 5.00 | 5.00 | 3.07 |
| මහින්දෝදය ද්විතියික පාසල් 1000 සංවර්ධන | 1,700.00 | 1,500.00 | 136.33 |

ප්‍රාග්ධන වියදම්
ලී බඩු උපකරණ මිලදී ගැනීම් සඳහා

(රු.මි)

| වැඩසටහන | ඇස්තමේන්තුව | ලද මුළු ප්‍රතිපාදන | 2013.12.31 දිනට වියදම |
|---|---|---|---|
| පළාත් සහ කලාප පරිගණක සම්පත් මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම | 50.00 | 50.00 | 0.09 |
| ක්‍රීඩා පාසල් ප්‍රතිසංස්කරණය | 10.00 | 10.00 | 0.44 |
| ***විශේෂ අධ්‍යාපනය*** | **28.70** | **28.70** | **13.28** |
| ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම | | | |
| දැව භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 6.00 | 2.14 | 1.44 |
| යන්ත්‍ර සහ උපකරණ | 3.20 | 7.06 | 5.95 |
| ***පිරිවෙන් අධ්‍යාපනය*** | | | |
| දැව භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 13.00 | 13.00 | 5.90 |
| අබාධිත සිසුන් | 1.50 | 1.50 | - |
| විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා ජාතික හා පළාත් සම්පත් මධ්‍යස්ථානය සඳහා | | | |
| යන්ත්‍ර සහ උපකරණ | 5.00 | 5.00 | - |
| ***ගුරු සංවර්ධන වැඩසටහන්*** | **34.90** | **34.90** | **27.68** |
| ***ගුරු විද්‍යාල හා මධ්‍යස්ථාන*** | | | |
| ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම | | | |
| දැව භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | | | |
| ගුරු විද්‍යාල | 1.40 | 1.40 | 1.39 |
| ගුරු මධ්‍යස්ථාන | 3.50 | 3.50 | 2.61 |
| ගුණාත්මක යෙදවුම් | 3.00 | 3.00 | 3.00 |
| යන්ත්‍ර සහ උපකරණ | | | |
| ගුරු විද්‍යාල | 1.00 | 1.00 | 0.26 |
| ගුරු මධ්‍යස්ථාන | 2.00 | 2.00 | 2.21 |
| ***ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ*** | | | |
| ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම | | | |
| යන්ත්‍ර සහ උපකරණ | 4.00 | 4.00 | 2.86 |
| දැව භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 20.00 | 20.00 | 15.35 |
| ***සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන වැඩසටහන*** | **300.00** | **300.00** | **222.49** |
| ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව - EKSP | 300.00 | 300.00 | 222.49 |
| **මුළු එකතුව** | **2,391.40** | **2,190.04** | **475.03** |

# 8. විදේශාධාර ආයෝජනය

## 8.1 දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකු ආධාර Education for Knowledge Society Project (EKSP) - ADB Funded

2007 වර්ෂයේ සිට ආසියානු බැංකු ණය ආධාර ලද ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලද දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය 2013 වර්ෂයේ දී අවසන් විය.

| | |
|---|---|
| සමස්ත ආයෝජනය | රු.මි.11,267.00 |
| සමුච්චිත වියදම | රු.මි. 9,265.92 |

### 8.1 අරමුණු සහ ඉලක්ක

- ♦ දරිද්‍රතා දර්ශකය මත තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ද්විතීයික පාසල් සංවර්ධනය කිරීම තුළින් ගුණාත්මක බවින් සපිරි ද්විතීයික අධ්‍යාපන අවස්ථා සහතික කිරීම.
- ♦ තොරතුරු තාක්ෂණ අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නංවාලීමත්, පුළුල් භාවිතය සඳහාත් ප්‍රවේශය සලස්වන මධ්‍යස්ථාන බවට පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන පත්කිරීම.
- ♦ අත්‍යාවශ්‍ය නඩත්තු හා අළුත්වැඩියා පාසල් මට්ටමින් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම සඳහා පාසල බලගන්වාලීම.
- ♦ ද්විතීයික පාසල්වල මහා පරිමාණ ඉදිකිරීම් ආයෝජනවලට සාපේක්ෂ ව අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සහතික කිරීම පෙරදැරි කොටගත් කාර්යසාධනය මත මූල්‍ය ආයෝජන හිමිකම තීන්දු කරමින් ගුණාත්මක අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් පාසල් මට්ටමන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමේ සංස්කෘතිය ඇති කිරීම.
- ♦ ද්විතීයික පාසල්වල කාර්යක්ෂම හා ඵලදායී ඉගෙනුම් වාතාවරණයක් සහතික කරලීම
- ♦ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනික ප්‍රවේශය ඉගෙනුම් ඉගැන්වීම් මෙවලමක් ලෙස භාවිත කිරීම සඳහා ගුරු සිසු හැකියා පුළුල් කිරීම
- ♦ ඉගෙනුම් දක්ෂතා සහිත අවාසිදායක ආර්ථික පරිසර හිමි 10 - 13 ශ්‍රේණි දරු දැරියන්ගේ අඛණ්ඩ අධ්‍යාපන අවස්ථා සහතික කරලීමට සිසුදිරිය ශිෂ්‍යත්ව ලබාදීම.
- ♦ පාසල් හැරගිය දරුවන්ගේ රැකියා, සමාජීය, නායකත්ව දක්ෂතා හා හැකියා පුළුල් කරමින් ඔවුන්ගේ අනාගතය සඳහා ගුණාත්මක අත්වැලක් සැපයීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- ♦ අධ්‍යාපනික මෘදුකාංග පාසල් මට්ටමට සපයා දෙමින් ගුරු සිසු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාදාමය ප්‍රියජනක අවස්ථාවක් බවට පත්කිරීම.

### 8.1.2 2013 වර්ෂයේ ඉලක්ක හා ප්‍රගතිය

| | |
|---|---|
| 2013 ප්‍රතිපාදන | රු.මි. 2,148.00 |
| 2013.12.31 වියදම | රු.මි. 1,962.97 |

- ද්විතීයික පාසල්1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පළමු පාසල් 100 සංවර්ධනය කිරීමට අදාලව ඉදිකිරීම් කටයුතු නිම කළ පාසල් 28ක් සිසු අයිතියට පත් කිරීම.
  - ∗ පාසල් 17ක් සිසු අයිතියට පත් කරන ලදී.
- පාසල් 40ක ඉදිකිරීම් නිම කර සිසු අයිතියට පත් කිරීම
  - ∗ පාසල් 20ක ඉදිකිරීම් සම්පූර්ණයෙන් ද ඉතිරි පාසල් 20 හි ඉදිකිරීම් 90% නිම කරන ලදී.
- පාසල් 100ක සනීපාරක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම
  - ∗ පාසල් 95ක ඉදිකිරීම් සම්පූර්ණයෙන් ද ඉතිරි පාසල් 5 හි ඉදිකිරීම් 90% නිම කරන ලදී.
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ව ගුරුභවතුන් සඳහා ICDL/CAL ගුරු පුහුණු ශිෂ්‍යත්ව 3480ක් පිරිනැමීම
  - ∗ 3223ක් පිරිනමා ඇත.
- පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන (PICTECs) 7ක් සංවර්ධනය කිරීම
  - ∗ මධ්‍යස්ථාන 5ක් සංවර්ධනය නිම කර ඉතිරි දෙකෙහි සංවර්ධන කටයුතු බොහෝ දුරට නිම කරන ලදී.
- ගුරුවරුන් සඳහා උසස් මට්ටමේ International Pedagogical ICT බලපත්‍ර (IPICT) ශිෂ්‍යත්ව 7870ක් පිරිනැමීම
  - ∗ 6222ක් පිරිනමා ඇත.

- විදුහල්පතිවරුන් හා අධ්‍යාපන බලධාරීන් 1400ක් සඳහා e - citizen ශිෂ්‍යත්ව පිරිනැමීම.
    * 1221ක් පිරිනමා ඇත.
- පාසල් හැරගිය සිසුන් 12170ක් සඳහා කුසලතා වැඩිදියුණු කිරීමේ කඩිනම් ශිෂ්‍යත්ව (ASAP) පිරිනැමීම.
    * 10059ක් පිරිනමා ඇත.
- පාසල් හැරගිය සිසුන් 7600ක් සඳහා සංචාරක ක්ෂේත්‍ර රැකියා පුහුණුව ලබාදීම යටතේ (TSTS) ශිෂ්‍යත්ව පිරිනැමීම.
    * 7490ක් පිරිනමා ඇත.
- පාසල් හැරගිය සිසුන් 4000ක් සඳහා කෙටිකාලීන වෘත්තීය පුහුණුව ලබාදීම (SPTP) ශිෂ්‍යත්ව පිරිනැමීම.
    * 3881ක් පිරිනමා ඇත.
- අ.පො.ස. උ.පෙළ වාණිජ විෂය හදාරා පාසල් හැරයන සිසුන් සඳහා (FFSS) වෘත්තීය පුහුණු ශිෂ්‍යත්ව 5000ක් පිරිනැමීම
    * 3255ක් පිරිනමා ඇත.
- ද්විතීයික පාසල් 1000 ගුරුභවතුන් සඳහා වෘත්තීය කුසලතා වැඩි දියුණු කර ගැනීමට (EPASS) පුහුණු ශිෂ්‍යත්ව 3000ක් පිරිනැමීම.
    * 946ක් පිරිනමා ඇත.
- ද්විතීයික පාසල් සඳහා පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන ( SDMG) පාසල් 1400 ක් සඳහා ලබා දීම.
    * පාසල් 1370කට පිරිනමා ඇත.
    * 2012 කාර්යසාධනය මත බෝනස් මුදලක් ද පාසල්වලට ලබා දී ඇත.
- පාසල් 1000 වැඩසටහන යටතේ ද්විතීයික පාසල්104 ක් සඳහා විශේෂ සංවර්ධන මූල්‍ය ප්‍රදාන ලබාදීම (SDFG)
    * පාසල් 104ටම පිරිනමා ඇත.
- ද්විතීයික පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ඇති පාසල් 30ක් සඳහා පරිගණක උපාංග ,ලී බඩු හා විද්‍යාගාර උපකරණ ලබාදීම.
    * අවසන් කර ඇත.
- ද්විතීයික පාසල් 45ක් සඳහා අ.පො.ස. (උ.පෙළ) විද්‍යාගාර උපකරණ ලබාදීම.
    * අවසන් කර ඇත.
- SLIATE ආයතනය සඳහා පරිගණක උපාංග ,ලී බඩු හා උපකරණ ලබාදීම.
    * කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.
- තාක්ෂණ විෂයධාරාව හඳුන්වාදුන් පාසල් 105ක් සඳහා ජෛව තාක්ෂණ උපකරණ ලබාදීම.
    * කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.
- තාක්ෂණ විෂයධාරාව හඳුන්වාදුන් පාසල් 105ක් සඳහා ඉංජිනේරු තාක්ෂණ උපකරණ ලබාදීම.
    * කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.

2013 වර්ෂයේ ආසියානු සංවර්ධන බැංකු හා ශ්‍රී ලංකා රජය විසින් මෙම ව්‍යාපෘතිය හරහා දරණ ලද ආයෝජනය රු.මි. 2148ක් විය.

### 8.1.3 අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP)

ආසියානු සංවර්ධන බැංකු අරමුදල් ව්‍යාපෘති පදනමෙන් තොරව ප්‍රතිඵල පාදක මූල්‍ය සැපයුම් ක්‍රියාදාමයක් ඔස්සේ භාණ්ඩාගාරය හරහා ලබා දීමේ නව ක්‍රමවේදය අනුගමනය කරමින් අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන 2013 - 2017 හඳුන්වා දෙනු ලැබ ඇත. මෙම වැඩසටහන අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (ESDFP) මූල්‍යමය වශයෙන් ශක්තිමත් කරන්නා වූ වැඩසටහනක් වන අතර සමස්ත මූල්‍ය ආයෝජනය රු.මි. 26000කි.





## 8.2 දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීම ( TSEP ) - ලෝක බැංකු ආධාර ලද වැඩසටහන්

අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන් තේමාවන් යටතේ දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය ලෝක බැංකු හා ඔස්ඒඩ් ආධාර මත ක්‍රියාත්මක වේ.
මුදල් ප්‍රතිපාදන නිදහස් කිරීම ඒ සඳහා හඳුනාගෙන ඇති කාර්යසාධන දර්ශක (DLT) වල ප්‍රගතිය මත සිදුකෙරේ.

**තේමාව 1 : ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය සහ සහභාගීත්වය ඉහල නැංවීම.**

- ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල ඉගෙනුම් පරිසරයන් වැඩිදියුණු කිරීමේ කඩිනම් වැඩසටහන යටතේ ප්‍රාථමික පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය, විදුහල්පති පුහුණුව හා ඉගෙනුම් ද්‍රව්‍ය සැකසීම.
- ද්විතීයික පාසල්වල මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම තුලින් ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව, තොරතුරු තාක්ෂණ ඉගෙනුම් අවස්ථා සම්පාදනය.
- ප්‍රාථමික හා ද්විතීයික ඉගෙනුම් අවධීන්වල ශිෂ්‍යයින් රඳවා තබා ගැනීම සඳහා පාසල් කළමනාකරණ කමිටු පිහිටුවීම.
- නොවිධිමත් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම.
- විශේෂ අධ්‍යාපන අවස්ථා සහිත දරුවන් උදෙසා පහසුකම් වැඩි කිරීම.
- පාසල් තුළ දරුවන් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන හා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ක්‍රමවත් වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවාවන් පිහිටුවීම.

**තේමාව 2 : අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය**

- 4වන ශ්‍රේණියේ සිසුන්ගේ පළමු බස, ඉංග්‍රීසි හා ගණිතය සාධන මට්ටම පිළිබඳ ජාතික ඇගයීම.
- 8වන ශ්‍රේණියේ සිසුන්ගේ ඉංග්‍රීසි හා ගණිතය හා විද්‍යාව සාධන මට්ටම පිළිබඳ ජාතික ඇගයීම
- පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන.
- ද්වි භාෂා අධ්‍යාපනය සඳහා විෂය අන්තර්ගතය හා භාෂා සමෝධානික ඉගෙනීම් රාමුවක් පිළියෙල කිරීම.
- විෂය මාලාව විවිධාංගීකරණය හා වැඩි දියුණු කිරීම.
- පාසල් පෙළ පොත්වල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම.
- සමාජ සංහිදියාව ප්‍රවර්ධනය.
- ප්‍රධාන විභාග වලට අදාළ ප්‍රතිඵල විශ්ලේෂණ අධ්‍යාපන සංවර්ධනය සඳහා යොදා ගැනීම.
- ප්‍රමිතීන් හා තත්ව තහවුරු කිරීමේ වැඩසටහන නවීකරණය හා ව්‍යාප්තිය.

**තේමාව 3: යහපාලනය හා අධ්‍යාපන සේවා සැපයුම**

- පාසල් නගා සිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- විදුහල්පති නායකත්ව හා කළමනාකරණ පුහුණුව
- පාසල් සංවර්ධන කමිටු සහ පාසල් කළමනාකරණ කමිටු වල ධාරිතා වර්ධනය
- පළාත්, කලාප හා කොට්ඨාස මට්ටමේ අධ්‍යාපන කළමනාකරණය ශක්තිමත් කිරීම

2013 වසරේ ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය

ප්‍රාථමික අධ්‍යාපනය
- ළමා මිතුරු පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන්

ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන්
- විෂය භාෂා සමෝධානික ඉගෙනුම් ප්‍රවේශය සහ සංකල්ප රාමුව ක්‍රියාත්මක කිරීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය
- ඊ තක්සලාව සඳහා විෂයානුබද්ධ මෘදුකාංග නිර්මාණය
- කලාප පරිගණක සම්පත් මධ්‍යස්ථානවල NVQ පාඨමාලා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය

ගණිත අධ්‍යාපනය
- ගණිත අධ්‍යාපන ප්‍රතිකාර්ය වැඩසටහන්
- ගණිතාගාර සංවර්ධනය
- ගණිත විෂය පිළිබඳ ධාරිතා සංවර්ධනය

නොවිධිමත් අධ්‍යාපනය
- නොවිධිමත් අධ්‍යාපන වෘත්තිකයින්ගේ ධාරිතා සංවර්ධනය
- විශේෂ අධ්‍යාපන වැඩසටහන් සමාලෝචනය හා ධාරිතා වැඩසටහන්

විද්‍යා අධ්‍යාපනය
- අඩු සාධන මට්ටම් සහිත පාසල්වල විද්‍යා විෂය ප්‍රතිඵල ඉහළ නැංවීම
- පාසල් සඳහා විද්‍යා උපකරණ මිලදීගෙන බෙදා හැරීම

ප්‍රමිති තහවුරු කිරීම
- පාසල් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ක්‍රියාවලිය සංවර්ධන

තාක්ෂණ විෂයධාරාව
- අ.පො.ස(උ.පෙ) නව තාක්ෂණ විෂය හඳුන්වාදීම සම්බන්ධව ධාරිතා සංවර්ධනය

විෂය සමගාමී කටයුතු
- පාසල් මාර්ගෝපදේශ කටයුතු හා උපදේශන කටයුතු ශක්තිමත් කිරීම
- අන්තර්වාර්ගික මිත්‍රත්ව පාසල් වැඩසටහන

මානව සම්පත් සංවර්ධනය

- ශ්‍රී ලංකා අධ්‍යපාන පරිපාලන නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය.
- කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල වල වගකීම් හා කාර්යභාරය පිළිබඳ උපදෙස් සංග්‍රහයක් සකස් කර නිකුත් කිරීම.
- පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ කලාප නියෝජිතයින් සඳහා පාසල් නගා සිටුවීමේ වැඩසටහන සම්බන්ධ ධාරිතා සංවර්ධන වැඩසටහන්.

වතු පාසල් සංවර්ධනය

- වතු පාසල් සිසුන්ගේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් වැඩසටහන්.

ප්‍රතිපත්ති හා සැලසුම්

- මධ්‍යකාලීන සැලසුම් හා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැසුම ක්‍රියාත්මක කිරීම හා මුද්‍රණය.
- අධ්‍යාපන සැළසුම්කරණය පිළිබඳ උපදෙස් සංග්‍රහ පිළියෙල කිරීම.
- පාසල් මූල්‍ය චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොත සම්පාදනය.

- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධති පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් එළි දැක්වීම.
- ප්‍රාථමික හා ද්විතියික පාසල් වල ඉගෙනුම් පරිසර වැඩිදියුණු කිරීමට පාසල් මාර්ගෝපදේශ සංග්‍රහ පිළියෙල කිරීම.
- ලෝක බැංකු හා OSAID වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් සංග්‍රහයක් නිකුත් කිරීම.
- ශිෂ්‍ය ඉගෙනුම් ප්‍රතිඵලයන් පිළිබඳ ජාතික තක්සේරුකරණ වැඩසටහන්.

මහින්දෝදය ද්විතීයික පාසල්

- ද්විතියික පාසල් 1000ට ඇතුළත් පාසල් 98ක් සඳහා පාසල් පාදක ප්‍රදානයක් ලබාදීම.
- මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 175ඉදිකිරීම සඳහා ආයෝජනය.

අධ්‍යාපන පර්යේෂණ

- ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීම පිළිබඳ සම්පත් කට්ටලය පාසල්වලට හඳුන්වාදීම.
- ප්‍රාථමික අංශයේ ගුරුවරුන් සඳහා පර්යේෂණ ගැටළු හඳුනාගැනීමට අදාළ ධාරිතා සංවර්ධනය.
- පර්යේෂණ සඳහා ප්‍රදානයන් ලබා දීම.

## 8.3 වෙනත් විදේශාධාර ලද වැඩසටහන්

### යුනිසෙෆ් ආධාර

- ළමා මිතුරු පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන්
- පාසල් නොයන ළමුන් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම හඳුන්වාදීම.
- සාක්ෂර උපදේශකවරුන් 104ක් පුහුණු කිරීම.
- පාසල් අධ්‍යාපන වාර පරීක්ෂන ඇගයීම් ක්‍රියාවලි සංවර්ධනය
- පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම

### ඉන්දීය රජයේ ආධාර

පළාත් 9 සඳහා භාෂා විද්‍යාගාර තැනීම සඳහා ඉන්දීය මහ කොමසාරිස් කාර්යාල විසින් සියලු කටයුතු කර අමාත්‍යාංශ වෙත රු.මි.9ක භාණ්ඩ මේ වන විට ලබා දී ඇත.

### GIZ ආධාර

- සාම අධ්‍යාපන වැඩසටහන්
- දෙවන භාෂාව ඉගැන්වීම
- ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශණය

**8.4.1 වගුව : අධ්‍යාපන සංවර්ධනය සඳහා විදේශාධාර හා ආයෝජන - 2013**


| මූලාශ්‍රය | වැඩසටහන | 2013 සඳහා ආයෝජන (රු.මි.) |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව ( ADB ) | දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය ( EKSP ) | 2,148.0 |
| ලෝක බැංකුව (WB) | දැනුම් සමාජයක් කරා පාසල් අධ්‍යාපනය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය( TESP ) | 500.5 |
| යුනිසෙෆ් ( UNICEF ) | *ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම<br>*වාර්ෂික සැලැස්මේ ඇතුළත් වැඩසටහන් | 148.0<br>26.1 |
| KOICA | *කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් ප්‍රතිසංස්කරණය<br>*හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසල් ප්‍රතිසංස්කරණය | 50.0<br>50.0 |
| යුනෙස්කො (UNESCO ) | ධාරිතා වර්ධන වැඩසටහන් හා ඉගෙනුම ද්‍රව්‍ය | 14.3 |
| ඉන්දීය ආධාර | භාෂා විද්‍යාගාර | 60.0 |
| GIZ | සමාජ සංහිඳියාව සඳහා අධ්‍යාපනය | 92.3 |
| **එකතුව** | | **3104.3** |

# 9. ශිෂ්‍ය සාධනය

## 9.1 පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය

පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දී ලකුණු 70ට වඩා ලබාගන්නා ශිෂ්‍ය ප්‍රතිශතය 2013 වර්ෂය වන විට 69.4%ක් දක්වා වැඩි වී ඇත. ශිෂ්‍යත්ව විභාගයට දරුවන් සූදානම් කිරීම හේතුවෙන් ප්‍රාථමික අධ්‍යාපනයේ මතු වී ඇති ගැටලු හා දරුවන්ට ඇති වී තිබෙන පීඩාව මඟ හැරවීම සඳහා ශිෂ්‍යත්ව විභාගය වෙනස් කිරීම කෙරෙහි මෙම වසරේ අවධානය යොමු වූ අතර ඒ පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිසම ඇතුළු අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනෙනු ඇත.


9.1 රූපසටහන: 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70ට ඉහළින් ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය 2008 - 2013





## 9.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

6 – 11 ශ්‍රේණිවල අධ්‍යාපනයෙන් පසුව ශිෂ්‍යයන් පෙනී සිටින ජාතික විභාගය වන අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ශිෂ්‍යයින් පෙන්වා ඇති සාධනය පහත වගුවෙන් දැක්වේ.ඒ අනුව ශිෂ්‍යයින්ගෙන් 64.7% ක් අ.පො.ස. (උ.පෙළ) සඳහා සුදුසුකම් ලැබීමට 2012 වර්ෂයේදී සමත් වූහ.

9.2 රූපසටහන: අ.පො.ස.(සා.පෙළ) විභාගය 2007 - 2012
අ.පො.ස.(උ.පෙළ) සඳහා සුදුසුකම් ලද ශිෂ්‍ය ප්‍රතිශතය




9.2.1 රූපසටහන: අ.පො.ස. (සා.පෙළ) විභාගය 2008 - 2012
ඒ ඒ විෂයය සමත් ශිෂ්‍ය ප්‍රතිශතය




## 9.3 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

පාසල් මට්ටමේ තරඟකාරී තීරණාත්මක විභාගයක් ලෙස සැලකෙන අ.පො.ස. (උ.පෙළ) විභාගය මෙරට විශ්ව විද්‍යාල වලට ශිෂ්‍යයින් තෝරා ගැනීමේ කඩයිම් විභාගයයි. 2013 වර්ෂයේ එක් එක් විෂයය ධාරාව සඳහා පෙනී සිටි සංඛ්‍යාවත් පසුගිය වර්ෂ කිහිපය තුල විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලැබූ සංඛ්‍යාවත් එහි ප්‍රතිශතයත් මෙහි දැක්වේ.

ඉදිරිපත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව හා විශ්ව විද්‍යාලයට ඇතුල්වීමට සුදුසුකම් සපුරා ලූ සංඛ්‍යාව - 2013

| විෂය ධාරාව | පෙනී සිටි සංඛ්‍යාව | සුදුසුකම් සපුරා ලූ සංඛ්‍යාව |
|---|---|---|
| ජීව | 31,550 | 15,733 |
| භෞතික | 27,768 | 13,097 |
| වාණිජ | 61,212 | 35,267 |
| කලා | 88,143 | 58,213 |
| පොදු | 1,233 | 603 |
| එකතුව | 209,906 | 122,913 |

9.3 රූපසටහන: අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලද ශිෂ්‍ය ප්‍රතිශතය




## 9.4 ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග

අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ශිෂ්‍ය සාධන මට්ටම ඉහල නැංවීම සඳහා පහත සඳහන් පරිදි විශේෂ වැඩසටහන් රැසක් 2013 වසරේ දී ද ක්‍රියාවට නංවන ලදී.

- පෙළපොත් කලට වේලාවට සැපයීම.
- ගුරු අත්පොත් හා විෂය නිර්දේශ මුද්‍රණය කර ලබාදීම.
- පසුගිය විභාගවල ප්‍රතිඵල විශ්ලේෂණ බෙදාහැරීම තුලින් ප්‍රතිඵල වැඩිකර ගැනීමට සියලු පාර්ශව දිරිමත් කිරීම.
- විභාග පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම.
- පසුගිය ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර සහ සීඩී ලෙස සකස් කර පහසුවෙන් ලබා ගැනීමට සැලැස්වීම.
- ශිෂ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම.
- මාධ්‍ය ඔස්සේ වැඩසටහන් ප්‍රචාරය කිරීම.
- අන්තර්ජාලය තුලින් ඉගෙනුම් සම්පත් සඳහා ප්‍රවේශ පහසුකම් සැලසීම.

## 9.5 8 වන ශ්‍රේණියේ ශිෂ්‍ය සාධනය පිළිබඳ ජාතික ඇගයීම

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨය හා අනුබද්ධ ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථානය (NEREC) හා එක් ව අධ්‍යාපන අමාත්‍යාංශය පවත්වනු ලබන 8 වන ශ්‍රේණිය ශිෂ්‍ය සාධනය පිළිබඳ ජාතික ඇගයීම් වැඩසටහන තුළින් ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව යන විෂයයන්හි සාධනය මනිනු ලැබේ. මෙම ඇගයීම් ප්‍රතිඵල ඉගෙනුම් ක්‍රියාවලිය සංවර්ධනයෙහි ලා කටයුතු කරන සියලු පාර්ශවයන් දැනුවත් කිරීමට යොදාගැනේ. 2012 වර්ෂයේ දී සිදු කරන ලද 8 වන ශ්‍රේණියේ ශිෂ්‍ය සාධනය මැන බැලීමේ වැඩසටහනට අනුව එක් එක් විෂයයන්ගේ 50% කට වැඩියෙන් ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය පළාත් අනුව මෙහි දැක්වේ.

**8 ශ්‍රේණිය ජාතික ඇගයීම - 2012**
**ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි විෂයයන්ගෙන් 50%ක් හෝ වැඩියෙන් ලබාගත්**
**ශිෂ්‍ය ප්‍රතිශතය**

| පළාත | ගණිතය | | විද්‍යාව | | ඉංග්‍රීසි | |
|---|---|---|---|---|---|---|
| | ගැහැණු | පිරිමි | ගැහැණු | පිරිමි | ගැහැණු | පිරිමි |
| බස්නාහිර | 58.9 | 45.8 | 37.9 | 28.9 | 44.0 | 23.8 |
| මධ්‍යම | 44.1 | 34.3 | 31.1 | 20.8 | 33.3 | 18.8 |
| දකුණු | 54.9 | 46.7 | 42.1 | 33.6 | 37.0 | 21.2 |
| උතුර | 35.7 | 41.8 | 18.3 | 24.3 | 13.3 | 15.0 |
| උතුරු මැද | 36.7 | 32.8 | 24.0 | 23.4 | 11.4 | 9.8 |
| වයඹ | 44.6 | 42.5 | 30.3 | 24.3 | 24.2 | 19.4 |
| සබරගමුව | 49.8 | 39.4 | 33.8 | 27.0 | 27.1 | 20.4 |
| නැගෙනහිර | 35.4 | 41.5 | 24.6 | 27.3 | 10.5 | 15.6 |
| ඌව | 34.1 | 28.3 | 21.6 | 17.0 | 24.4 | 13.9 |
| **එකතුව** | **44.5** | **39.3** | **29.9** | **25.0** | **25.9** | **17.5** |

මූලාශ්‍රය: **Summary Report, National Assessment of Achievement of Grade 08 Students in Sri Lanka - 2012**

# ඇමුණුම්

# ඇමුණුම 1 : 2013 වර්ෂයේ දී නිකුත් කළ චක්‍රලේඛ

| දිනය | චක්‍රලේඛ අංකය | විෂය හා යොමුව |
|---|---|---|
| 2013.01.02 | 01/2013 | පාසල් ළමුන් සඳහා ක්‍රියාත්මක වන පෝෂණ වැඩසටහන් 2013 |
| 2013.01.03 | 02/2013 | දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව පාසල් භූමිය ආදර්ශමත් ගෙවත්තක් බවට පත් කිරීමේ වැඩසටහන |
| 2013.01.04 | 03/2013 | ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම |
| 2013.01.11 | 04/2013 | ගුරු අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා වන ඇගයීම් වැඩපිළිවෙල |
| 2013.01.15 | 05/2013 | ශ්‍රී බුද්ධ වර්ෂ 2557 වෙසක් සතිය වැඩසටහන |
| 2013.01.15 | 06/2013 | පාසල් උපදේශන හා මාර්ගෝපදේශ වැඩසටහන |
| 2013.01.23 | 07/2013 | පාසල් පාදක සංවර්ධනය සඳහා සැලසුම්කරණය, මූල්‍යකරණය හා ප්‍රසම්පාදනය |
| 2013.02.11 | 08/2013 | 2013 ශුද්ධ වූ සතියේ කතෝලික ක්‍රිස්තියානි ආගමික වතාරික එක් දින වැඩසටහන |
| 2013.03.08 | 09/2013 | පාසල් වල යොවුන් නව නිපයුම් සමාජ පිහිටුවීම හා නව නිපයුම් තරග පැවැත්වීම |
| 2013.03.11 | 10/2013 | පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම |
| 2013.03.12 | 11/2013 | පාසල්වල විවිධ අවස්ථාවල දී මුදල් එකතු කිරීම |
| 2013.03.13 | 2006/37(1) | දෙවන ජාතික භාෂාව (සිංහල/දෙමළ) ඇගයීම් ක්‍රියාවලිය |
| 2013.03.25 | 12/2013 | විගණකාධිපති විමසුම් සඳහා පිළිතුරු සැපයීම |
| 2013.03.27 | 13/2013 | මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව අනාගත ශ්‍රී ලංකාවේ දැනුම කේන්ද්‍රී සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගනු වස් ප්‍රාථමික පාසල් පන්දහසක් ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන - දෙවන අදියර |
| 2013.04.02 | 14/2013 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව ගැලපුම් දීමනාව ගෙවීම |
| 2013.04.04 | 15/2013 | භෞතික සම්පත් කළමනාකරණ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම. |
| 2013.04.24 | 17/2013 | වාණිජ විද්‍යා ශිෂ්‍ය සංගම් පිහිටුවීම |
| 2913.04.26 | 18/2013 | අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින පාසල් හා ආයතන සඳහා ඉඩම් අත්කර ගැනීම |
| 2013.04.26 | 19/2013 | අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඉඩම් වල අනවශ්‍ය හා අනතුරුදායක දැව ඉවත් කිරීම, අනවසරකරුවන් ඉවත් කිරීම හා ඵලදා බදු දීම. |
| 2013.04.29 | 20/2013 | අධ්‍යාපන අමාත්‍යාංශයීය නිලධාරීන්ගේ කාර්යාල වේලාවන් |
| 2013.05.02 | 21/2013 | ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයට අයත් ගුරුභවතුන් සඳහා උපරිමයේ රැඳී සිටීමේ වාසි ලබාදීම. |
| 2013.05.16 | 22/2013 | වාර්ෂික ජාතික ගණිත තරගාවලිය |
| 2013.05.28 | 23/2013 | පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම. |
| 2013.05.30 | 24/2013 | අ.පො.ස.(උ.පෙළ) සංශෝධිත විෂය නිර්දේශ අනුව 2013 වර්ෂයේ සිට රසායන විද්‍යාව හා ජීව විද්‍යාව විෂයයන් ඇගයීම. |
| 2013.06.11 | 25/2013 | අ.පො.ස(උ.පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම. |
| 2013.06.17 | 26/2013 | ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල, ජාතික අධ්‍යාපන ආයතන හා රාජ්‍ය වෙනත් තෘතියිකඅධ්‍යාපන ආයතනවල දේශීය පාඨමාලාවන් හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබා දීම |
| 2013.07.01 | 27/2013 | අ.පො.ස(උ.පෙ) පන්ති වලට සිසුන් ඇතුළත් කිරීම |
| 2013.07.17 | 28/2013 | විදේශ ගමන් අනුමැතිය හා නිවාඩු ලබා ගැනීම(රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතට ගැනෙන ආයතනවල නිලධාරීන් සඳහා ) |

| | | |
|---|---|---|
| 2013.10.08 | 29/2013 | පාසල් වාර සටහන-2014 |
| 2013.10.10 | 30/2013 | පළාත් සහ කලාප තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම |
| 2013.10.23 | 31/2013 | අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන(2012-2016) අධ්‍යාපන අමාත්‍යාංශය |
| 2013/11/06 | 32/2013 | ප්‍රබුද්ධ පාඨක සම්මාන ප්‍රදානය සඳහා නාම යෝජනා කැඳවීම - 2014 |
| 2013.11.08 | 33/2013 | සමස්ත ලංකා දෙමළ භාෂා දින තරගාවලිය 2014/2018 |
| 2013/11/29 | 34/2013 | 2013 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම |

## ඇමුණුම 2 : අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ තනතුරු හා නිලධාරීන් 2013.12.31 දිනට

### සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය

අතිරේක ලේකම් - එස්.යූ. විජේරත්න මහතා

**ගුරු අධ්‍යාපන හා විද්‍යාපීඨ ශාඛාව**
ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) - ඩබ්.පී.ආර්. සිල්වා මිය

**දත්ත කළමනාකරණ හා පර්යේෂණ ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩබ්.එස්. පෙරේරා මහතා

**සැමට අධ්‍යාපන සහ සහශ්‍ර සංවර්ධන ඉලක්ක ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.පී. විතානගේ මිය

**විදේශ ආයතන හා විදේශ කටයුතු ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එල්.ටී. ලාල් පද්මසිරි මහතා

**මානව සම්පත් සංවර්ධන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - පුෂ්පා විජේසූරිය මිය

**නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ලලනි එන්. විජේසේකර මිය

**පිරිවෙන් ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි

**ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්.එම්. වේහැල්ල මිය

**පර්යේෂණ හා සංවර්ධන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - සී.එම්.පී.ජේ. තිලකරත්න මිය

**නීති ඒකකය**
නීති නිලධාරී - සුරංගි පෙරේරා මෙනවිය

**සංඛ්‍යා ලේඛන ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සංඛ්‍යා ලේඛනඥ - කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න මිය

**ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩබ්ලිව්.පී.ආර්. සිල්වා මිය

**ජාතික මෙහෙයුම් මැදිරිය**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ප්‍රසාද් වීරසිරි මහතා

**දෙමළ පාසල් ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එස්. මුරලිදරන් මහතා

**මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඉසෙඩ්. තාජුඩීන් මහතා

**නව ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය**
ව්‍යාපෘති අධ්‍යක්ෂ - එල්.ආර්.වී. ගුණරත්න මහතා

### අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය

අතිරේක ලේකම් - එච්.යූ. ප්‍රේමතිලක මහතා

**සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩබ්.පී.එන්.ටී. ගුණතිලක මහතා

**කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.එල්.ඩී. බාලසූරිය මෙනවිය

**ද්වි භාෂා අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ප්‍රියතා නානායක්කාර මිය

**විෂය සමගාමී මාර්ගෝපදේශ හා උපදේශන සහ සාම අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - වයි.ඒ.එන්.ඩී. යාපා මහතා

**වාණිජ අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්. කමනි පෙරේරා මිය

**අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය**
ලේකම් - විජිත වෙලගෙදර මහතා

**ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.එම්. වීරසූරිය මිය

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ජී.එම්. නීල් ගුණදාස මහතා

**ගණිත ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.ඩී.සී. බියන්විල මහතා

**කළමනාකරණ හා ප්‍රමිති ඒකකය**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එස්.එම්.එල්.කේ. සෙනවිරත්න මිය

**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපන ඒකකය**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ආර්.එම්.එම්. රත්නායක මහතා

**නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එච්.පී.එන්. ලක්ෂ්මන් මහතා

**ජාතික පාසල් ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - රංජිත් චන්ද්‍රසේකර මහතා

**වතු පාසල් සංවර්ධන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්. සහාරංජන් මිය

**ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - පී.එම්.ඒ.එස්. පණ්ඩිතසේකර මිය

**ආගමික හා සාරධර්ම ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එස්.බී.එම්. නිමල් ධර්මසිරි මහතා

**විද්‍යා ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්.පී. විපුලසේන මහතා

**පාසල් කටයුතු ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩබ්.කේ.ඩබ්. විජේතුංග මහතා

**ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.ඒ. අබේරත්න මහතා

**තාක්ෂණ අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඒ.ඩී. නන්දසේන මහතා

## අධ්‍යාපන සේවා ආයතන අංශය

අතිරේක ලේකම් - උපාලි මාරසිංහ මහතා

**අධ්‍යාපන සේවා ආයතන ශාඛාව හා විදුහල්පති ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - තුෂාරා පතිරණගේ මිය

**ගුරු ආයතන ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (වැ.බ.) - අනෝජා ගුරුගේ මිය

**ගුරු අධ්‍යාපනඥ සේවය**
සහකාර ලේකම් - ජේ.කේ. අතුකෝරල මිය

## පාසල් සැපයීම්, සේවා හා ඉදිකිරීම් අංශය

අතිරේක ලේකම් (වැ.බ.) - එන්.එච්.එම්. චිත්‍රානන්ද මහතා

**ප්‍රසම්පාදන ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - දීප්තිකා ගුණරත්න මිය

**පාසල් ගොඩනැගිලි ශාඛාව**
අධ්‍යක්ෂ - අයි.එම්. ප්‍රනාන්දු මිය

**පාසල් සැපයීම් ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බි.ඩී.සී. බියන්විල මහතා

**ගොඩනැගිලි කළමනාකරණ ශාඛාව**
ගොඩනැගිලි කළමනාකරු - කමල් අතුකෝරාළ මහතා

## පාලන හා මුදල් අංශය

අතිරේක ලේකම් - එන්.එච්.එම්. චිත්‍රානන්ද මහතා

ප්‍රධාන ගණකාධිකාරී - එස්.පී.එන්. සමරසිංහ මිය

**ආයතන හා පරිපාලන (ඒකාබද්ධ සේවා නොවන, විනය සහ විමර්ශන)**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - පුරප්පාඩුව පැවතිනි

**ආයතන හා පරිපාලන (ඒකාබද්ධ සේවය) සහ ඉඩම් ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ආර්.බී. ගන්කේවල මිය

**පාර්ලිමේන්තු කටයුතු සහ ප්‍රවාහන ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ඒ.පී. ගුරුගේ මිය

**මුදල් ශාඛාව**
ගණකාධිකාරී - දුනිල් හෙයියන්තුඩුව මහතා

**විවිධ ගිණුම් ශාඛාව**
ගණකාධිකාරී - ජේ.කේ.එස්.එන්. පෙරේරා මහතා

**ගෙවීම් ශාඛාව**
ගණකාධිකාරී - ගීතා හේමන්ති රූබසිංහ මිය

**විශ්‍රාම වැටුප් ශාඛාව**
ගණකාධිකාරී - පී.ජී.වයි. කුමාරි මිය

**සැපයීම් ශාඛාව**
ගණකාධිකාරී - එන්.ටී.ඩී. ද ඉසෙඩ් සිරිවර්ධන මිය

**විශේෂ විමර්ෂණ ශාඛාව**
සහකාර ලේකම් - ඩබ්.ඩී. ජයසේන මහතා

## විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය

**දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය (EKSP)**
ව්‍යාපෘති අධ්‍යක්ෂ - ආර් කරුණාසිරි මහතා

**ජර්මන් සහයෝගීතා සංවර්ධන ව්‍යාපෘතිය (GIZ)**
ජාතික සම්බන්ධීකාරක - එස්. මුරලිදරන් මහතා

**ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව**
ලේකම් ජනරාල් - එස්.එල්.ඩී.කේ. විජේසිංහ මෙනවිය

## විගණන අංශය

**රජයේ විගණන ශාඛාව**
විගණන අධිකාරි - ජී.ඒ.එම්.අයි. ගුණරත්න මහතා

**අභ්‍යන්තර විගණන ශාඛාව**
ගණකාධිකාරි - ඒ.ටී.කේ. අධිකාරි මිය